# වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂයේ /56 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව

### 2022-10-13

**පැමිණීම**

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
8. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
9. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
10. ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
11. ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
12. ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා
14. ගරු මන්ත්‍රීනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය
15. ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
16. ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
17. ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය
18. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා
19. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා
20. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
21. ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
22. ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
23. ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
24. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
25. ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
26. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා
27. ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
28. ගරු මන්ත්‍රීනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය

29. ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
30. ගරු මන්ත්‍රිනී එම්.එම්.මේරි.වාලට් කුරේ මහත්මිය
31. ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා
32. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා
33. ගරු මන්ත්‍රිනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
34. ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
35. ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා
36. ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01. 2022-09-08 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

තීරණ අංක 01

2022-09-08 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

- ❖ ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පෞද්ගලික මාර්ගයකට ජල නළ දමා ජලය බැස්සවීමක් පිළිබඳ තමන් ඉදිරිපත් කල බවත්, එය 4වන පිටුවේ සඳහන් වන බවත්,ඊයේ දිනයේදී එය වසා දමා ඇති බවත් එය වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවෙන්ද නැතිනම් වෙනත් පාර්ශවයක් විසින් සිදු කලේද යන්න විමසා සිටින ලදී.ඊයේ දිනයේ ප්‍රාදේශීය ලේකම්කාර්යාලයේ පරිසර කමිටුවේද මෙම ගැටළුව සාකච්ඡා කල බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එය ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාගේ කොට්ඨාසයේ කාරණයක් බවත්, සෞභාග්‍යයේ මංපෙත් වැඩසටහන යටතේසිදු කල මාර්ගයක් බවත්, එහි ජලය බැස යාම සඳහා ස්ථාන තුනක බට දමා තිබූ බවත්,පාරට ජලය ඒම ගැටළුවක් නිසා එම ස්ථාන වසා දමා ගැටළුව නිරාකරණය කර තිබූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය සභාවට පවරාගෙන ඇත්ද යන්න ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

එම මාර්ගය සභාවට පවරා ගැනීමට කටයුතු කරගෙන යන බවත්,එය පවරා ගැනීමට නොහැකි වුවහොත් එම මාර්ගය ඉවත් කිරීමට සිදු වන බවත්,කොන්ත්‍රාත්කරුට ගෙවීමට තිබෙන බවත්,එම පාර භාවිතා කරන උදවිය එම අවස්ථාවේ ඉල්ලීම් කල බවත්,දැන් අවශ්‍ය නොමැති බව පැවසුවද එම අවස්ථාවේදී කතා කල දේ දුරකථනයේ පටිගත වීඇති බවත් ඒ සඳහා නීතියෙන් අයකර ගැනීමට වැඩ කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සභාව මඟින් පාරක වැඩක් කිරීමේදී ඉල්ලීම් ලිපියක් ගෙන ඇස්තමේන්තුගත නොකලේදැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

මෙහිදී කොටඨාසය භාර මන්ත්‍රීතුමා සම්බන්ධීකරණය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අදදින කොට්ඨාසය භාර මන්ත්‍රීවරයාද සිටින බවත්,කාගේ උවමනා වටඑය සිදු වුයේදැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

තනි පුද්ගලයෙකු විසින් තමාගෙන් හා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කල බව ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එම ඉල්ලීම් ලිපිය සභාගත කරන ලෙසට ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ඉල්ලා සිටින ලදී.

- ❖ ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙම වාර්තාවේ තීරණ අංක 23“වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් දංකොටුව වෙළඳ සංකීර්ණයේ පළමු අධියරයේ කඩ කාමර පද්ධතියට අවහිරයක්ව පවතින ගොඩනැඟිල්ල සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් ගෙන එය ඊළඟ ගරු මහා සභාවට යොමු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.“ ලෙස සඳහන් වී තිබෙන බවත්, මෙය වසර ගණනාවක සිටතිබෙන ගැටළුවක් බවත් ඒ පිළිබඳව විමසා සිටින ලදී.

කර්මාන්ත කමිටුවට එම වාර්තාව යොමු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මාසයට කර්මාන්ත කමිටු 02ක් තිබෙන බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එහි මැද කොටස ඉවත් කිරීම පිළිබඳව තීරණයක් ගැනීමට නොහැකිව සිටින බවත්,එය ගොඩනැඟිල්ලට කෙලෙස බලපාවිදැයි නොදන්නා බවත්,ඒ අනුව මැද කොටස කඩා ඉතිරි කඩ කාමර 6ම බදු ලබා දීමට හැකි බව තම මතය බවත්,ඉංජිනේරු මහතා පැමිණ නිර්දේශය ලබා දුනහොත් එය කර්මාන්ත කමිටුවට දමා ඉතිරි කඩ කාමර 6ම ප්‍රයෝජනයට ගත හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එවිට කඩ කාමර වල සිටින පිරිසට කුමක් සිදු වන්නේදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

එම ගැටළුවද මෙය පමා වීමට බලපාන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා මොනතරම් කාලයක් ගතවූවායැයිද යන්න ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කල අතර එය ඊළඟ කර්මාන්ත කමිටුවට යොමු කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

### 01. නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 02

මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
- ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි චමෝදරී ප්‍රනාන්දු මහත්මිය
- ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය
- ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා
- ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුභසිංහ මහතා

b) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 03

2022සැප්තැම්බර් හා ඔක්තෝබර් මාස වල පැවති පහත සඳහන් කාරක සභා සඳහා සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

2022 සැප්තැම්බර් මස 13 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| 4. | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රිනී එච්.එම්.සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

2022 සැප්තැම්බර් මස 23 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| 4. | ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා |

| | |
|---|---|
| 5. | ගරු මන්ත්‍රී ඒල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 6. | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා |
| 7. | ගරු මන්ත්‍රිනී එච්.එම්.සුදර්ශි භාගයා කරුණාරත්න මෙනවිය |

2022 ඔක්තෝබර් මස 04 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| 4. | ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා |
| 5. | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රිනී එච්.එම්.සුදර්ශි භාගයා කරුණාරත්න මෙනවිය |

2022 සැප්තැම්බර් මස 02 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |
| 7. | ගරු මන්ත්රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා |

2022-09-12 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 2. | ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය |
| 3. | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| 4. | ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා |
| 5. | ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය |
| 6. | ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා |

2022 සැප්තැම්බර් මස 29 වන දින පැවති පරිසර හා සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභාව

| අ/අ | නම |
|---|---|
| 1 | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 2 | ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා |
| 3 | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |
| 4 | ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| 5 | ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා |
| 6 | ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා |

2022-10-07 වන දින පැවති සංවර්ධන උපදේශක කාරක සභා වාර්තාව

| අ/අ | නම |
|---|---|
| 1 | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 2 | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 3 | ගරු මන්ත්‍රී ඩබ්.එස්.ඒ.ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |
| 4 | ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර් සුභසිංහ මහතා |

C ). ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා විසින් මාස 03ක් සඳහා විදේශගත වීමට ඉල්ලා ඇති නිවාඩු සලකා බැලීම

තීරණ අංක 04

ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා විසින් මාස 03ක් සඳහා විදේශගත වීමට නිවාඩු ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සලකා බැලූ ගරු මහා සභාව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

02.2022-09-09 වන දින වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව මගින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ඇගයීමේ වැඩසටහන යටතේ වෙන්නප්පුව බල ප්‍රදේශයේ දේශපාලනික හා ආගමික සාමජීයීය වශයෙන් මහගු සේවයක් ඉටු කල හිටපු අමාත්‍ය ගරු මිල්රෝයි එස් ප්‍රනාන්දු මැතිතුමා ඇගයීමේ වැටසටහනක් පැවැත්වූ බවත් ඒ සඳහා සහභාගී වූ සියළුම මන්ත්‍රීවරුන්ටද එම වැඩකටයුතු සඳහා සහයෝගය ලබා දුන් ලේකම්මහතා ඇතුළු සියළුම දෙනාටද,වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සේවක සුභ සාධක සංගමයටද ස්තූතිය පුද කරන ලදී.

03.වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් ස්ථිර පෙර පාසල් 15හි දරු දැරියන් 725ක ප්‍රමාණයක් සහභාගී කර ගනිමින් මෙවරද වාර්ෂික පෙර පාසල් ක්‍රීඩා උත්සවය සැප්තැම්බර් මස 25 වන දින පැවැත්වීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් ප්‍රජා කමිටු සභාපති ගරු මන්ත්‍රීජී.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ඇතුළු කමිටු සාමාජිකයින් සියළුම දෙනාටද,පෙර පාසල් ගුරුතුමියන් සියළුම දෙනාටද, ලේකම් මහතා,ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය ඇතුළු සියළුම දෙනාටද, අනුග්‍රහය ලබා දුන් පෙර පාසල් සංවර්ධන සමිතියන්ටද ස්තූතිය පුද කරන ලදීමේ සඳහා සියළුම වියහියදම් එක් එක් පෙර පාසලට අයත් පෙර පාසල් සංවර්ධන අරමුදලින් දරණ ලද බවද ප්‍රකාශ කරන ලදී.

04.2022-09-26 වන දින සහ 2022-09-29 වන දින ආහාර බෝග වගාව සම්බන්ධයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව ප්‍රාදේශීය ගොවිජන සේවා කාර්යාල හා සහසම්බන්ධ වෙමින් ගොවි ජනතාව සමඟ පුහුණු වැඩසටහන් පැවැත්වීමට හැකි වූ බවත් ඒවා සඳහා සහයෝගය ලබා දුන් හාල්දඬුවන කෘෂි පර්යේෂණ නිලධාරී රෝයි මහතා ඇතුළු සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

05.රට තුළ පවතින ආහාර අර්බුදය විසඳා ගැනීම සඳහා බල ප්‍රදේශයේ ගොවි ජනතාව අතර අතිරේක ආහාර බෝග බීජ හා එළවළු බීජ බෙදා දීමේ සමාරම්භක වැඩසටහන 2022/10/01 වන දින ඉ/මොහොට්ටිමුල්ල,ජාඇලවත්ත භූමි පරිශ්‍රයේදී පැවැත්වීමට හැකි වූ බවත් ඒ් සඳහා සහයෝගය ලබා දුන් කොට්ඨාස භාර ගරු මන්ත්‍රීකේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ඇතුළු සියළුම දෙනාටද,එම අවස්ථාවට සහභාගී වූ මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනාටද ස්තූතිය පුද කල අතර ඊට සමගාමීව අප සභාවේ කාර්ය මණ්ඩලයටද බීජ බෙදා දීමක් සිදු කල බවත් වගාව හා සම්බන්ධ වන ලෙස සියළුම ගරු මන්ත්‍රී මණ්ඩලයෙන්ද ඉල්ලීමක් කරන බවත් ප්‍රකාශ කරන ලදී.

06.වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් ආදායම් පරීක්ෂක නිලධාරීන් හා සහයක නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරී පී.පී.අයි.ආර්.ප්‍රනාන්දු මහතාගේ හා ප්‍රේමවංශ මුනමල්දෙණිය මහතාගේ සම්පත් දායකත්වයෙන් සිදුකිරීමට හැකිවූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

07.2022 සැප්තැම්බර් මස පහත සඳහන් මාර්ග වල වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

- පාතිමාවත්ත පාර බණ්ඩිරිප්පුව -1
- බිෂෝප්වත්ත-බණ්ඩිරිප්පුව මාර්ගය
- යෝගියාන-ධර්මවිජය මාවත-01
- යෝගියාන ධර්මවිජය මාවත -02
- කොළින්ජාඩිය-දෙවන ජුවාම් පාවුළු මාවත
- මැල්වත්ත මාර්ගය ලිහිරියාගම
- දූම්මලදෙණිය වැව අසල මාර්ගය
- පැළ තවාන පළමු අතුරු මාර්ගය ලුණුවිල
- පාතිමාවත්ත පාර බණ්ඩිරිප්පුව-02

08.වෙන්නප්පුව ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ 2013 වසරේ පැවති අරුණළු ක්‍රීඩා සැණකෙලියෙත් සමඟ අනුග්‍රාහකයින් සොයා එම අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට හැකි වූ බවත්, මෙවරද පඩිපෙළි හා තාප්ප කඩතොළු සකස් කර තීන්ත ආලේප කිරීමේ කටයුතු සිදු වන බවත් ඒ සඳහා අනුග්‍රහය ලබා දුන් පහත සඳහන් ආයතන හා මහත්ම මහත්මීන් වෙත ස්තූතිය පුද කරන ලදී.

- මැක්ෂි ප්‍රනාන්දු මහතා - මැක්ෂීස් ආයතනය,වෙන්නප්පුව
- සුරාජ් හතුරුසිංහ මහතා- එස්.සී.කේ.හෝල්ඩින් ප්‍රයිවට් ලිමිටඩ්
- වයි.එල්.ප්‍රදීප් නිශාන්ත මහතා - ට්‍රාන්ස් ඇරබියන් විදේශ රැකියා ආයතනය,වෙන්නප්පුව
- කලමනාකරු - වින්ටේජ් ආයතනය
- නෙළුකා මහත්මිය
- රවින්ද කුමාර මහතා/ සුදත් තමෙල් මහතා ඔටෝ ෆ්ලැෂ් ආයතනය
- ගාමිණී මහතා-ලක්සෝලා ආයතනය
- මෙරිල් වැන්ඩලන් මහතා - වෙන්නප්පුව ෆිනැන්ස් ආයතනය

09. සිව් අවුරුදු සැලැස්ම සඳහා සංවර්ධන යෝජනා අදාල විෂය භාර නිලධාරී වෙත ලැබීමට සලස් වන ලෙස සියළුම ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලදී.

**<u>03.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u>**

(i). ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්න අංක 01 ගරු සභාපතිතුමා විසින් පහත පරිදි ඉදිරිපත් කරමින් පිළිතුරු ලබා දෙන ලදී.

**ප්‍රශ්නය-** 2022 අයවැය ප්‍රකාශනය තුළ ඉදිරිපත් කරඇති තොරතුරු වලට අනුව ක්ෂේත්‍ර කම්කරුවන් 103ක් හා සෞඛ්‍ය කම්කරුවන් 85 වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සේවයේ නියතුව සිටී.මෙම සංඛ්‍යාවන්හි මේ වන විට වෙනසක් සිදු වී තිබේද?සිදු වී ඇත්නම් වර්තමාන සංඛ්‍යා දත්ත කෙසේද?

**පිළිතුරු-** වෙනසක් සිදු වී තිබේ.

| ක්ෂේත්‍ර කම්කරුවන් -91 | සෞඛ්‍ය කම්කරුවන්-94 |
|---|---|
| ස්ථිර-30 | ස්ථිර- 42 |
| දෛනික- 11 | දෛනික-12 |
| කොන්ත්‍රාත්- 50 | කොන්ත්‍රාත්-40 |

**ප්‍රශ්නය** -සෞඛ්‍ය කම්කරුවන් හා ක්ෂේත්‍ර කම්කරුවන් සේවයේ යොදවා ඇති ආකාරය එක් එක් ක්ෂේත්‍ර අනුව බලයලත් නිලධාරීන් කාර්යාල අනුව කොපමණද?

**පිළිතුරු-**

| | ප්‍රධාන කාර්යාලය | දන්කොටුව උපකාර්යාලය | කම්මල්පත්තුව උපකාර්යාලය | කිරිමැටියාන උපකාර්යාලය |
|---|---|---|---|---|
| ස්ථිර -සෞඛ්‍ය කම්කරු | 28 | 9 | 01 | 1 |
| දෛනික-සෞඛ්‍ය කම්කරු- | 12 | 0 | 0 | 0 |
| ස්ථිර -ක්ෂේත්‍ර වැඩ කම්කරු- | 12 | 8 | 01 | 09 |
| දෛනික ක්ෂේත්‍ර වැඩ කම්කරු- | 08 | -01 | 01 | 01 |

| |
|---|
| සෘජු කොන්ත්‍රාත් -90කි |
| කසල-40 |
| ක්‍රීඩාගාර-05 |
| විදුලි අංශය-3 |
| මාර්ග-32 |

වරිපනම් තක්සේරු-10

(ii). ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්න අංක 02 ගරු සභාපතිතුමා විසින් පහත පරිදි ඉදිරිපත් කරමින් පිළිතුරු ලබා දෙන ලදී.

ප්‍රශ්නය- වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසල කලමනාකරණයට ස්ථිර විසඳුමක් ලබාදීමේ අරමුනින් ඉදි කෙරෙන කසල අංගනයේ ඇස්තමේන්තුගත මුදල කොපමණද?

පිළිතුරු-රු.23,109,181.88

ප්‍රශ්නය- වර්තමාන මිල වැඩිවීම් අනුව කසල ප්‍රතිචක්‍රීකරණය මට්ටමට ගෙනඒම සඳහා වැයවෙතැයි ඇස්තමේන්තුගත මුදල කොපමණද?

පිළිතුරු-රු.50,000,000.00 පමණ

ප්‍රශ්නය- සෙන්දිරියාමුල්ල කසල අංගණයේ මේ වන විට වැඩ නිමකර ඇති කොටසේ වටිනාකම කොපමනද?

පිළිතුරු-රු.8,639,213.82

ප්‍රශ්නය- වැඩනිමකර ඇති කොටසින් ඉදි කිරීම් කර මේ වන විට ගෙවා අවසන් කර ඇති මුදල කොපමණද?

පිළිතුරු-රු.8,639,213.82

ප්‍රශ්නය- මෙම කසල අංගණය වෙනුවෙන් මධ්‍යම රජය වෙතින් අනුමත කර ඇති ප්‍රතිපාදන මුදල කොපමණද?

පිළිතුරු-රු.23,109,181.88

ප්‍රශ්නය- මධ්‍යම රජය අනුමත කර ඇති මුදලින් මේ වන විට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති මුදල කොපමණද?

පිළිතුරු-රු.2,008,874.19 + රු. 4,326,133.53 = රු.6,335,007.72

(iii). ගරු මන්ත්‍රී ටී.බී.ඕ.ඇන්ටනී කුමාර් මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්න අංක 01 ගරු සභාපතිතුමා විසින් පහත පරිදි ඉදිරිපත් කරමින් පිළිතුරු ලබා දෙන ලදී.

ප්‍රශ්නය- විදුලි පහන් කණු අංකණය කිරීමේ වැඩසටහන යටතේ අංකනය කල විදුලි පහන් කණු ගණන කීයද?
පිළිතුරු-16720
ප්‍රශ්නය- ඒ සඳහා යෙද වූ සේවක සංඛ්‍යාව කොපමනද?
පිළිතුරු-01
ප්‍රශ්නය- එම කාර්යය සඳහා ගත වූ කාල සීමාව කොපමණද?
පිළිතුරු-මාස 18
ප්‍රශ්නය- සේවක මහතුන් සඳහා ගෙවූ මුළු වැටුප කොපමණද?
පිළිතුරු-රු.540,350.00
ප්‍රශ්නය- අතිකාල දීමනා කොපමණද?
පිළිතුරු-ගෙවා නැත
ප්‍රශ්නය- එම කාර්යය සඳහා සම්පූර්ණ අමු ද්‍රව්‍යය(තීන්ත) වියදම කොපමණද?
පිළිතුරු-තීන්ත ලීටර් 20යි.රු.7250.00
ප්‍රශ්නය- අංකනය සඳහා භාවිතා කල තීන්ත වර්ගය කුමක්ද?
පිළිතුරු-Road marking **black**

## 04.යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

i. 2023 වර්ෂයේ අයවැය යෝජනාව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

මෙම අවස්ථාවේදී නිලධාරී කීප දෙනෙකු සඳහා ගරු මහා සභාව නැරඹීමට ගරු සභාපතිතුමා විසින් අවසර ලබා දෙන ලදී.

***ගරු සභාපතිතුමාගේ අයවැය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශය 2023***

**ගරු උප සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමනි, ආණ්ඩු පක්ෂ, ප්‍රතිපක්ෂ නියෝජනය කරන සියලුම ගරු මන්ත්‍රී තුමනි/තුමියනි,**

පුත්තලම් දිස්ත්‍රික්කයෙන් ඇරඹී වයඹ පළාත තුළ ජනගත වූ "වයඹ අභිමානය" සන්නාමය මුළු දිවයින පුරා ප්‍රචලිත කරමින් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් මාගේ දෙවන ධූර කාලයේ දී පස්වැනි වරටත් 2023 වර්ෂයට අදාල අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරිමට ලැබීම මාගේ දේශපාලන ගමන් මගෙහි මා ලද තවත් එක් භාග්‍යයක් බව සතුටින් දන්වමි.

ගරු ජනාධිපති ලේකම්ගේ 2022.08.15 දිනැති අංක 42 දරණ නිවේදනය හා ඊට සමගාමීව වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක NWP /GOV /AD02/16/13 වෙළුම II හා 2022.09.01 දිනැති ලිපියේ උපදෙස් ද පදනම් කර ගනිමින් 2023 අයවැය කෙටුම්පත සකස් කරන්නට යෙදුණු බව ප්‍රකාශ කරනු කැමැත්තෙමි .

අප බලාපොරොත්තු නොවූ අයුරින් 2022 වර්ෂය තුළ දේශපාලන ස්ථාවරත්වය බිඳ වැටිම, ආර්ථික වශයෙන් විවිධාකාර ගැටලු සහගත තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවීම, මහජන උද්ඝෝෂණ බහුල වීම, විවිධ නොසන්සුන්තාවයන් රට තුළ ඇති වීම, වෘත්තිකයින් අරගල දියත් කිරිම වැනි දේශපාලනමය හා සමාජීය ව්‍යාකූලතාවයන්ට අපට මුහුණ දීමට සිදුවූ පසුබිමක් තුළ වුව ද පළාත් පාලන ආයතනයක් ලෙස බල ප්‍රදේශයේ එක් ලක්ෂ පනස් දහසක් පමණ වූ ජනතාවට ද ද්විතික පාසල් 42 ක අධ්‍යාපනය ලබන දූවා දරුවන්ට ද බල ප්‍රදේශයේ විහාරස්ථාන, දේවස්ථාන හා රාජ්‍ය ආයතන සඳහා ද කොතෙක් අපහසුකම් තිබුණ ද පෙර ලබා දුන් සේවාවන් ඒ ආකාරයෙන්ම නොඅඩුව ලබා දීමට හැකි වූ බව මා නොපැකිළිව පවසමි.

තවද රටතුළ උද්ගත වූ මෙම තත්ත්වය තුළ පසුගිය කාල පරිච්ඡේදය තුළදි මාගේ නිලධාරීන්ට හා සේවක මහතුන්ට සේවයට පැමිණිමේ ප්‍රවාහන අපහසුතා බහුල වීම, දින 3 කට සේවා කාලය කෙටි කිරිම වැනි කරුණු හමුවේ මෙන්ම ආදායම් උත්පාදනයේ පසුබෑමක් තුළ වුවද අප ආයතනය එම සියලු අපහසුතාවයන් කළමනාකරණය කර ගැනීමට සමත් විය.

එවැනි බාධක හමුවේ අප විසින් 2023 වර්ෂයට අදාල අයවැය කෙටුම්පත සකස් කළද, එය පසුගිය වර්ෂ වලට සාපේක්ෂව බැලූ කළ ඉතා වෙහෙසකර කාර්යයක් බව පෙන්වා දෙමි. දිනෙන් දින ඉහළ යන උද්ධමනකාරී තත්ත්වයන් හමුවේ වියදම් ඇස්තමේන්තු සකස් කර ගැනිමේ දී එය කළමනාකරණය කරන්නේ කෙසේ ද? යන ගැටලුවට අපට මුහුණ දීමට සිදුවිය. භාණ්ඩ හා සේවාවන්ගේ මිල ගණන් සීඝ්‍ර ලෙස ඉහළ යමින් පැවතියද ප්‍රාදේශීය සභාවේ ආදායම් උත්පාදිත ප්‍රභවයන්ගේ වර්ධනයක් සිදු නොවූ අතර එහි හීනවීම් තත්ත්වයක් දක්නට ලැබුණි. එබැවින් වියදම් ඇස්තමේන්තු සකස් කිරීමට ප්‍රමාණවත් අයුරින් ආදායම් ඇස්තමේන්තු සාවද්‍ය ලෙස ඉහළ දැමීම සිදුකළ නොහැකි කරුණකි.

වර්තමාන තත්ත්වය තුළ වුවද අප පත්වී ඇත්තේ ඉතාමත් අසීරු බැරෑරුම් සහගත අවස්ථාවකට බව කිව යුතුය.

මෙම තත්ත්වය හමුවේ වුවද 2022 වර්ෂයේ ඉතිරි කාලය තුළදී ද පෙර මෙන්ම අපගේ සියලුම දෛනික සේවාවන් පවත්වාගෙන යාමට හැකි පරිදි ආදායම් /වියදම් කළමනාකරණය කර ගැනිමට අප යත්න දරමින් සිටිමු.

විශේෂයෙන්ම ඉහළ ගිය ඉන්ධන මිල හමුවේ මෙම වර්ෂය තුළ ඉන්ධන සඳහා වෙන්කළ ප්‍රතිපාදන මේ වන විට ඉක්මවා ඇති බැවින් වැය ශීර්ෂ මාරු කිරිම් සිදු කිරීමෙන් අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමට අපට සිදු වී ඇත..

කෙසේ වුවද 2023 වර්ෂය සඳහා රුපියල් තිස්නව කෝටි අසූඅට ලක්ෂ විසි දෙදාහක (398,822,000.00) ආදායම් ඇස්තමේන්තුවක් හා රුපියල් තිස්නව කෝටි අසූ හත් ලක්ෂ අනූඅට දහසක (398,798,000.00) වියදම් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර ඒ තුළ රුපියල් විසි හතර දහසක (24,000.00) අතිරික්තයක් පෙන්නුම් කරනු ලබයි.

මෙම රුපියල් තිස්නව කෝටි අසූඅට ලක්ෂ විසි දෙදාහසක (398,822,000.00) ආදායම් ඇස්තමේන්තුව 2022 වර්ෂයට සාපේක්ෂව බැලූ කළ රුපියල් හතලිස් හය ලක්ෂ තිස්හය දහස් හත්සිය විස්සක (4,636,720.00) වැඩි වීමක් පෙන්නුම් කරයි.

2023 වර්ෂය තුළ දී වරිපනම් බදු යටතට ගැනෙන වරිපනම් බදු/අක්කර බදු/ව්‍යාපාර බදු/කර්මාන්ත බදු/විනෝද බදු/ඉඩම් කට්ටි කිරිමේ 1% බදු යන බදු ආදායම් වලින් රුපියල් එක්කෝටි හැත්තෑ නව ලක්ෂ හැට පන්දහසක (17,965,000.00) ආදායමක් ද,

කුලී ආදායම් වශයෙන් කඩකුලී/ බදු කුලී/ වෙනත් කුලී ආදායම් මඟින් රුපියල් තුන්කෝටි විසිහත් දහස් දෙසියයක් ද (30,027,200.00) උපයා ගැනිමට හැකි වෙතැයි බලාපොරොත්තු වේ.

බලපත්‍ර ගාස්තු වශයෙන් රුපියල් හතළිස් ලක්ෂ හැටපන්දහසක (4,065,000.00) ආදායමක් ද බලාපොරොත්තු වන අතර එහිදි වෙළඳ බලපත්‍ර මඟින් රුපියල් දස ලක්ෂ පනස් දහසක් ද (1,050,000.00) පරිසර බලපත්‍ර මඟින් රුපියල් ලක්ෂ අටක් ද (800,000.00) සංචාරක හෝටල් මඟින් රුපියල් ලක්ෂ දහයක් ද (1,000,000.00) වශයෙන් හා බැනර්, දැන්වීම් පුවරු ආදි ආදායම් මඟින් ඉතිරි දොළොස් ලක්ෂ පහළොස් දහසක (1,215,000.00) ප්‍රතිපාදන උපයා ගැනිමට ඇස්තමේන්තු සකස් කර ඇත.

සේවා ගාස්තු යටතේ රුපියල් එක්කෝටි අසූහය ලක්ෂ දහනව දහස් පන්සියයක (18,619,500.00) ආදායමක් ලැබෙතැයි ගණන් බලා ඇත. ඒ සඳහා අප වෙත ආදායම් උත්පාදනය කර දෙන්නේ ආදාහනාගාර, සුසාන භූමි, ගලි බවුසර් සේවා සැපයිම්, බැකෝ ලෝඩර්,මෝටර් ග්‍රේඩර් කුලියට දීම්, ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රිඩාංගනයේ සේවා සැපයීම් වෙනුවෙන් අයකරන ගාස්තු ආදී වශයෙන් වේ.

වරෙන්තු ගාස්තු හා දඩ යටතේ 2023 වර්ෂයට ඇස්තමේන්තු කර ඇති ප්‍රතිපාදන වටිනාකම රුපියල් හයකෝටි හත් ලක්ෂ හැටහත් දහස් තුන්සියයකි. (60,767,300.00) මෙහිදී විශේෂයෙන්ම ව්‍යාවස්ථාපිත ආදායමක් වන උසාවි දඩ මඟින් රුපියල් කෝටි හයක (60,000,000.00) ප්‍රතිපාදන ලබා ගැනීමට අපේක්ෂා කරමි.

වෙනත් ආදායම් වශයෙන් රුපියල් පහළොස් කෝටි තිස් හය ලක්ෂ හැත්තෑ අටදහසක (153,678,000.00) ආදායමක් උපයා ගැනීමට ඇස්මේන්තු කර තිබෙන අතර එයට මුද්දර ගාස්තු මඟින්

රුපියල් දහතුන් කෝටි පනස් ලක්ෂයක (135,000,000.00) ආදායමක් ද ස්ථාවර තැන්පතු සඳහා පොළිය ලෙස රුපියල් එක් කෝටි විසිහය ලක්ෂයක් (12,600,000.00) ලෙස ගණන් බලා ඇස්තමේන්තු ගත කර ඇත. ඊට අමතරව සේවක ණය පොළි,විකුණුම් මගින් උත්පාදිත ආදායම් හා වෙනත් ආදායම් ගණනය කර මෙම ඇස්තමේන්තු සකස් කර ඇත.

ආදායම් ආධාර වශයෙන් වැටුප් ප්‍රතිපූර්ණ සඳහා රුපියල් එකලොස් කෝටි තිස්හත් ලක්ෂයක් (113,700,000.00) ප්‍රතිපාදන ලැබෙනු ඇති බවට ඇස්මේන්තු කර ඇත. මෙහිදි විශේෂයෙන් කිව යුතු තවත් දෙයක් ඇත. එනම්,

මේ වන විට බල ප්‍රදේශයේ වරිපනම් ඒකක වසර 11 කට පසුව නැවත තක්සේරු කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර වෙන්නප්පුව දියුණු කළ ගම් ප්‍රදේශයේ (වරිපනම් කලාපයේ) නව තක්සේරුව 2022 දෙසැම්බර් මස වන විට අවසන් කිරීමට සැලසුම් සකස් කර ඇත.ඒ අනුව වෙන්නප්පුව වරිපනම් කලාපයේ පමණක් මෙතෙක් පැවති වරිපනම් ඒකක 1760 වෙනුවට මේ වන විට සමීක්ෂණයෙන් හඳුනාගත් වරිපනම් ඒකක 8000 ක් පමණ වන අතර 2023 වර්ෂයේ දී නව තක්සේරුව සක්‍රීය කිරීමට හැකි වුවහොත් මෙතෙක් වර්ෂයකට වරිපනම් ඒකක 1760 සඳහා ලැබූ රුපියල් ලක්ෂ 36 ක් පමණ වන ආදායම තුන් ගුණයකින් පමණ ඉහළ යනු ඇතැයි බලාපොරොත්තු වේ.

වැඩිවන වරිපනම් ඒකක සංඛ්‍යාව අනුව ඉහළ ආදායමක් ලබා ගැනීමට අපේක්ෂා කරන බැවින් බදු ගෙවන ජනතාවට සහනයක් ලෙස මෙතෙක් අයකල වරිපනම් බදු ප්‍රතිශතය 5% සිට 4% හෝ 3% දක්වා අඩු කිරීමට ද අදහස් කෙරේ.

එමෙන්ම මෙවර අයවැය යටතේ ආදායම් ලෙස මෙම අපේක්ෂිත වරිපනම් ආදායම ගණනය කර නොතිබුණ ද එය ලබන වර්ෂයේ පරිපූරක ආදායමක් ලෙස අයවැය ලේඛනයට එක්කර සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට අපේක්ෂිතය.

2023 වර්ෂය තුළ දි උපයා ගත හැකි ආදායම් ඇස්තමේන්තු සලකා බලා වියදම් ඇස්තමේන්තු කෙටුම්පත් කර ඇත. දිනෙන් දින ඉහළ යන උද්ධමනකාරී තත්ත්වයන් හමුවේ අප විසින් පවත්වාගෙන යනු ලබන සියලුම සේවාවන් හා කටයුතු ඒ අයුරින්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයට මෙහිදි මූලිකත්වය දෙනු ලැබීය. විශේෂයෙන්ම එම කාර්යයන් ප්‍රමුඛතාවයේ ලා සලකා වියදම් ඇස්තමේන්තු සකස් කරන ලදි.

2023 වර්ෂයට අපේක්ෂිත මුළු පුනරාවර්ථන වියදම් ඇස්තමේන්තුව රුපියල් තිස් හය කෝටි අසූ හතර ලක්ෂ තිස් අටදහසකි. (368,438,000.00) 2022 වර්ෂයේ දී මෙම පුනරාවර්ථන වියදම් ඇස්තමේන්තුව වී තිබුණේ රුපියල් තිස් දෙකෝටි හතලිස් හතර ලක්ෂ හැටපන්දහස් පන්සියයකි. (324,465,500.00) ඒ අනුව 2022 වර්ෂයට වඩා 2023 වර්ෂයේ දි පුනරාවර්ථන වියදම රුපියල් හාර කෝටි තිස්නව ලක්ෂ හැත්තෑ දෙදහස් පන්සියකින් (43,972,500.00) වැඩි වීමක් පෙන්නුම් කර ඇත.

මෙහිදි පුනරාවර්ථන වියදම් යටතට ගැනෙන සංයුක්ත දීමනා හැර අනෙකුත් සියලුම වැය ශිර්ෂයන්ගේ එනම්, වැටුප් හා වේතන, ඉන්ධන ,සැපයුම් හා උපකරණ/නඩත්තු හා අලුත්වැඩියා,වෙනත් මෙහෙයුම් වියදම්, ආධාර මුදල් හා සහනාධාර පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රතිපාදන වැඩිවීමක් සිදු කර ඇත.

- වැටුප් හා වේතන වෙනුවෙන් රුපියල් දහසය කෝටි අනූහතර ලක්ෂ දාහතර දහසක් ද (169,414,000.00)
- සංයුක්ත හා වෙනත් දීමනා වෙනුවෙන් රුපියල් දහතුන් ලක්ෂ තිස්පන් දහසක් ද

(1,335,000.00)

- සැපයුම් හා උපකරණ (ඉන්ධන ඇතුළුව) සඳහා රුපියල් හාර කෝටි හැට එක් ලක්ෂ අනූදහසක් ද (46,190,000.00)
- නඩත්තු හා අලුත්වැඩියා වෙනුවෙන් රුපියල් හත් කෝටි හතලිස් නව ලක්ෂ දස දහසක් ද (74,910,000.00)
- වෙනත් මෙහෙයුම් වියදම් වෙනුවෙන් රුපියල් හය කෝටි විසි එක් ලක්ෂ දස දහසක් ද (62,110,000.00)
- ආධාර මුදල් හා සහනාධාර වෙනුවෙන් රුපියල් එක් කෝටි දහනව ලක්ෂ අසූදහසක් ද (11,980,000.00)
- විශ්‍රාම වැටුප් දායක මුදල් වෙනුවෙන් විසිහතර ලක්ෂ අසූ නව දහසක් ද (2,489,000.00)

වශයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇත.
මෙහිදි සැපයුම් හා උපකරණ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමේ දී,

- ලිපි ද්‍රව්‍ය හා පාරිභෝජන ද්‍රව්‍ය සඳහා රුපියල් හතලිස් දෙලක්ෂ දසදහසක් ද (4,210,000.00)
- ඉන්ධන හා ස්නේහක තෙල් වෙනුවෙන් රුපියල් දෙකෝටි විසි හතර ලක්ෂ පනස් දහසක් ද (22,450,000.00)
- වීථි පහන් මිලදී ගැනීම වෙනුවෙන් රුපියල් ලක්ෂ පනහක් ද (5,000,000.00)
- ආයුර්වේද බෙහෙත් මිලදී ගැනීම වෙනුවෙන් රුපියල් ලක්ෂ විස්සක් ද (2,000,000.00)
- ආදාහනාගාර සඳහා ගෑස් මිලදී ගැනීම වෙනුවෙන් රුපියල් ලක්ෂ තිස්පහක් ද (3,500,000.00)

මීට අමතරව කසළ කළමනාකරණය,සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා සඳහා ද්‍රව්‍ය මිලදි ගැනිම හා අනිකුත් සැපයුම් ද්‍රව්‍ය සඳහා ද ප්‍රතිපාදන වෙන් කර ඇත.

2022 වර්ෂයේ දී වාහන හා යන්ත්‍ර සඳහා ඉන්ධන වෙනුවෙන් රුපියල් එක්කෝටි හැත්තෑ හතර ලක්ෂ හැටපන් දහසක් (17,465,000.00) වෙන් කර තිබු අතර 2023 වර්ෂය සඳහා ඉන්ධන මිල වැඩිවීමට අනුව රුපියල් දෙකෝටි විසිහතර ලක්ෂ පනස් දහසක් (22,450,000.00) වෙන් කිරීමට කටයුතු කර ඇත. උපරිම වාහන පාලනයක් අපේක්ෂාවෙන් මෙම මුදල වෙන් කර ඇති බව ද සඳහන් කරමි.

නඩත්තු හා අලුත්වැඩියා යටතේ රුපියල් හත් කෝටි හතලිස් නව ලක්ෂ දසදහසක (74,910,000.00) ප්‍රතිපාදන වෙන් කර ඇති අතර මේ තුළ වාහන, යන්ත්‍ර හා උපකරණ නඩත්තුව / මාර්ග, පාලම්, කාණු, බෝක්කු නඩත්තුව මෙන්ම අනෙකුත් විෂය පථයන්ගේ නඩත්තු ද ඇතුළත් කර ඇත.

මේ වන විට අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය සැලකිය යුතු මට්ටමකින් සිදුවී අවසන් ව ඇති බැවින් මෙම සකස් කළ මාර්ග නඩත්තු කර පවත්වා ගැනීම සඳහා අප විසින් ප්‍රමුඛත්වයක් ලබා දීම වැදගත් වනු ඇතැයි මම විශ්වාස කරමි. මේ වන විට රජයේ ප්‍රතිපත්ති තීන්දු මත ප්‍රාග්ධන සංවර්ධන කටයුතු සිදු කිරීම චක්‍රලේඛ මඟින් සීමා කර ඇති තත්ත්වයක් තුළ 2023 වර්ෂයේ ද ප්‍රාග්ධන සංවර්ධන

කටයුතු සිදු කිරීමේ අවිනිශ්චිත තත්ත්වයක් උද්ගත වී ඇත.

උක්ත තත්ත්වය ද සලකා බලා 2023 වර්ෂයේ දී පුනරාවර්ථන යටතේ නඩත්තු කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කිරිමට ඒ අනුව මා විසින් තීරණය කරන ලදී. ඒ අනුව මං මාවත්/පදික වේදිකා/ පාලම් කාණු අලුත්වැඩියා හා නඩත්තුව සඳහා රුපියල් පන්කෝටි පන් ලක්ෂ හැට දහසක (50,560,000.00) ප්‍රතිපාදන වෙන් කර ඇත.

එයින් මාර්ග අංශයේ සෘජු කොන්ත්‍රාත් වැටුප් සඳහා රුපියල් එක් කෝටි හැටපන් ලක්ෂ හැට දහසක (16,560,000.00) ප්‍රතිපාදන වෙන් වන අතර කොට්ඨාසයකට මාර්ග නඩත්තුව සඳහා රුපියල් ලක්ෂ දහතුන (13,000,000.00) බැගින් රුපියල් තුන් කෝටි විසි පන් ලක්ෂයක් (32,500,000.00) වෙන් කර ඇත. ඊට අමතරව හදිසි ආපදා අවස්ථාවන් සඳහා මාර්ග හා කාණු නඩත්තු කටයුතු වෙනුවෙන් රුපියල් ලක්ෂ පහළොවක් (1,500,000.00) වෙන් කර ඇත.ඒ අනුව 2023 වර්ෂයේ දි මාර්ග අලුත්වැඩියා කටයුතු අපට සාර්ථක අයුරින් ඉටු කර ගැනිමට හැකිවනු ඇතැයි මා විශ්වාස කරමි.

මෙම අර්බුදකාරී වාතාවරණය තුළ වුවද අඩු ආදායම්ලාභි පවුල් වල දරුවන් වෙනුවෙන් අභ්‍යාස පොත් බෙදා දීම සඳහා 2023 වර්ෂයට ද රුපියල් ලක්ෂ පනහක (5,000,000.00) ප්‍රතිපාදන වෙන් කර ඇත. 2022 වර්ෂය තුළදි ද මෙම කාර්යය සාර්ථක කර ගැනිමට අපට හැකිවූ බැවින් එය බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභි පවුල් වලට මහඟු සහනයක් වූ බවත් මම විශ්වාස කරමි.

ඒ අනුව 2023 වර්ෂය තුළ දි වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොට්ඨාස 25 සඳහා හැකි අයුරින් එම කොට්ඨාස වල අවශ්‍යතා වෙනුවෙන් පහත සඳහන් පරිදි ප්‍රතිපාදන වෙන් කර ඇත. ඒ් අනුව එක් කොට්ඨාසයක් සඳහා

අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන් සඳහා අභ්‍යාස පොත් වෙනුවෙන් රු. ලක්ෂ දෙකයි
රු.200,000.00
වැසිකිළි ආධාර ලබාදීම සඳහා රු. හතළිස් දහසයි
රු.40,000.00
පාලම්, මාර්ග, බෝක්කු, කාණු නඩත්තුව සඳහා රු. ලක්ෂ දහතුනයි රු.
<u>1,300,000.00</u>
රු.
<u>1,540,000.00</u>

ඒ අනුව එක් එක් කොට්ඨාසයේ සංවර්ධන කටයුතු සඳහා රුපියල් පහළොස් ලක්ෂ හතළිස් දහසක ප්‍රතිපාදන වෙන් කර ඇත.

මීට අමතරව,

- ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා මිල්ලගහකුඹුර නයිනමඩම ඉඩම මිලදී ගැනීමට රුපියල් එක්කෝටි පනස් ලක්ෂයක් ද (15,000,000.00)
- දුම්මලදෙණිය පන්සල් හන්දිය ඉඩම බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මිලදී ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනයට රුපියල් ලක්ෂ විස්සක(2,000,000) මුදලක් ද
- පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීමට රුපියල් ලක්ෂ තිහක් ද (3,000,000.00)
- සෙන්දිරියාමුල්ල කසල අංගනයේ ඉදිකිරීම් සඳහා රුපියල් ලක්ෂ පනහක් ද (5,000,000.00)
- ප්‍රිමික්ස් අංගනයේ වහලය ඇතුළු ඉතිරි වැඩ නිම කිරීම සඳහා රුපියල් ලක්ෂ විසි පහක් ද (2,500,000.00) වශයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇත.

ආසියාවේ විශාලතම කොලනිය පිහිටි සීනෝර් ජනපදයේ පානීය ජල ගැටලුව විසඳීම සඳහා මේ වන විට මිල දී ගෙන තිබෙන ලීටර් 5000 ජල ටැංකි තැබීමට ආධාරක සකස් කරදීම සඳහා රුපියල් ලක්ෂ විසි

පහක (2,500,000.00) ප්‍රතිපාදන උපයෝගිතා කළමනාකරණය යටතේ වෙන් කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම සිංගක්කුලිය ගොවි සෙවණ ක්‍රීඩාංගනය සභාව වෙත පවරාගෙන ඉදිරියේ දී සංවර්ධනය කිරීමටත්, කහටවිල බල ප්‍රදේශයේ නොදියුණු ගම්මාන වල යටිතල පහසුකම් රේඛීය අමාත්‍යාංශ හෝ වෙනත් ආයතන වලින් ලැබෙන ප්‍රතිපාදන උපයෝගී කරගෙන වැඩිදියුණු කිරීමටත් ඉදිරියේ දී බලපොරොත්තු වෙමි.

අප පළාත් පාලන ආයතනය මගින් මේ වන විට පවතින විදුලි අර්බුදය විසඳීම සඳහා දේශිය ණය සහ සංවර්ධන අරමුදලෙන් ණය මුදලක් ලබාගෙන සූර්ය බලශක්ති පද්ධතියක් (Solar Power System) වෙන්නප්පුව ප්‍රධාන කාර්යාලයට හා වෙන්නප්පුව ඇල්බට් ඇෆ් පිරිස් ක්‍රීඩාංගනයට සවි කිරීම සඳහා කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇත.

2022 වර්ෂය තුළ දි කොතෙක් අර්බුද හමුවේ වුවද සියලුම කාර්යය මණ්ඩලයන්ගේ වැටුප් ගෙවීම්, නඩත්තු කටයුතු, කසළ කළමනාකරණය, ණය වාරික හා පොළී ගෙවීම් ,ආයුර්වේද මධ්‍යස්ථාන ,පුස්තකාල සේවාවන් හා පෙර පාසල් කටයුතු හා අනෙකුත් සියලුම අපගේ විෂය පථයට අයත් සේවාවන් ඉටු කිරීමට හැකි වීම අප ලද ජයග්‍රහණයන් බව සිහිපත් කරමි.

මාගේ දෙවන ධූර කාලය තුළ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව අත්පත් කරගත් සුවිශේෂි ජයග්‍රහණයන් අතර පළාත් පාලන ආයතනයේ තිරසාර බව තහවුරු කරමින්,

- වෙන්නප්පුව බල ප්‍රදේශයේ වෙන්නප්පුව, කම්මල්පත්තුව, දංකොටුව හා කිරිමැටියාන වරිපනම් කලාප ලෙස භාවිතා කරනු ලබන ''දියුණු කළ ගම් ප්‍රදේශ'' GIS තාක්ෂණය උපයෝගී කර ගනිමින් නිවැරදි ඛණ්ඩාංක සලකුණු කරමින් සිතියම්ගත කර ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීම ද,
- වයඹ පළාත තුළ මෙතෙක් කිසිදු පළාත් පාලන ආයතනය විසින් සිදුකර නොමැති දියුණු කළ ගම් ප්‍රදේශයේ වරිපනම් ඒකක GIS තාක්ෂණය මගින් තොරතුරු එකරාශී කරමින් ලේඛණගත කර නව තක්සේරුවක් කරා මෙහෙය වීම ද, දැනටමත් වෙන්නප්පුව දියුණු කළ ගම් ප්‍රදේශයේ සමීක්ෂණය අවසන් කර තක්සේරු නිලධාරින් විසින් තක්සේරු කරමින් පැවතීම ද,
- වයඹ පළාත තුළ වැඩිම මාර්ග සංඛ්‍යාවක් වන බල ප්‍රදේශයේ මාර්ග 4013 ක් GIS තාක්ෂණය උපයෝගී කරගනිමින් සිතියම්ගත කර ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කිරීම ද,
- සභාවට අයත් ඉඩම් සියල්ල සමීක්ෂණය කර ලේඛණගත කිරීම ද,
- ICT ආයතනයේ සහාය ද ඇතිව කිරිමැටියාන මහජන පුස්තකාලය වයඹ පළාතේ පළමු ඩිජිටල් පුස්තකාලය බවට පත් කිරීමට හැකි වීම ද
- CAT 2020 වැඩ සටහන යටතේ බලපත්‍ර ලබාදීම, මාර්ගගත ක්‍රමවේදය යටතේ බිල්පත් ගෙවීම, ඉන්ධන නිකුත් කිරීම, ගොඩනැගිලි අයදුම්පත්‍ර පිළිබඳ කටයුතු කිරීම, ගබඩාකරණය, ලේඛණාගාරය විධිමත් කිරීම ද,
- වසර ගණනාවක් පැවති ගැටලුවක් වූ ජයකොඩි ක්‍රීඩාංගනයේ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම ද, වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව ලද සුවිශේෂි ජයග්‍රහණයන් බව කිව යුතුමය.

මේ සියලු කටයුතු සිදුකිරීමේ දි ලේකම්තුමා විසින් සිදුකළ මෙහෙය මෙහිදී මා විසින් විශේෂයෙන්ම ඇගයිය යුතුය. පසුගිය කාල වකවානුව තුළ නිලධාරින්ගේ පැමිණීමේ අපහසුතා ඇති වූ විට හා සේවා

කාලය දින කිහිපයකට පමණක් සීමාවන් වූ අවස්ථාවන් වල ද පෙර පරිදිම හැකි උපරිමයෙන් මෙම ආයතනයේ කටයුතු හා ඉන් පරිබාහිර අවශ්‍ය කටයුතු ද කළමනාකරණය කිරීමට එතුමා බොහෝ වෙහෙස මහන්සි විය.

ඊට අමතරව වසර ගණනාවක් පුරාවට ගැටලුවක් ව පැවති නිලධාරීන්ගේ විශේෂයෙන්ම සුළු සේවකයින්ගේ පෞද්ගලික ලිපිගොනුවල ගැටලු නිරාකරණය කර දීමටත් ඔවුන්ගේ හිඟ වැටුප් ලබා දීමටත් එතුමා කළ මෙහෙය සුළුපටු නොවන බවද මා ඔබට අවිවාදයෙන් ප්‍රකාශ කරමි. එතුමා මෙම වර්ෂය අවසානයේ විශ්‍රාම ගැනීමට නියමිතව ඇති අතර එතුමාගේ සේවා කාලයේ දී විශාල මෙහෙයක් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට සිදුවූ බව ගෞරවයෙන් සිහිපත් කරමි.

ගෙවුණු වසර තුළ මෙම සියලු කටයුතු සාර්ථක කරගෙන යාමට සහය දුන් ලේකම්තුමා ඇතුළු සියලුම කාර්යය මණ්ඩලයට මාගේ හෘද්‍යාංගම ස්තුතිය පුද කරමි.

එමෙන්ම මාගේ දෙවෙනි ධුර කාලය තුළ මේ සියලු ජයග්‍රහණයන් මා විසින් තනිව ලබාගත් ජයග්‍රහණයන් නොවන අතර සභාවක් ලෙස ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනීම සඳහා මා සමඟ එකට අත්වැල් බැඳ ගනිමින් මා දිරිමත් කළ මා දැනුවත් කළ මාගේ ගරු උප සභාපතිතුමා ඇතුළු කමිටු ගරු සභාපතිවරුන් ද, ආණ්ඩු පක්ෂයේ සියලුම ගරු මන්ත්‍රී මණ්ඩලය ද , ගරු විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රී මණ්ඩලයට ද මාගේ හෘද්‍යාංගම ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

තවද අපගේ ඉල්ලීම් හා අපගේ අවශ්‍යතා පිළිබඳව මැදහත් සිතින් යුතුව සලකා බලමින් හැකි සෑම විටම අප ධෛර්යමත් කළ පළාත් පාලන කොමසාරිස්තුමා ඇතුළු එම කාර්ය මණ්ඩලය ද, වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ව ද සභාව වෙනුවෙන් මාගේ ගෞරවාදර ස්තුතිය පිරි නමමි. විශේෂයෙන්ම වයඹ පළාත් හිටපු ගරු ආණ්ඩුකාර අප අතරින් සමුගත් අධි නිතීඥ රාජා කොල්ලුරේ මැතිතුමන්ව ද ගෞරවයෙන් සිහිපත් කරමි.එමෙන්ම ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා,ගරු රෝෂාන් රණසිංහ ඇමතිතුමා,ගරු සන්ද්‍යා රාජපක්ෂ මැතිතුමා,ගරු ට්‍රෙවින් ප්‍රනාන්දු මැතිතුමා,ගරු මල්රාජ් පීරිස් මහතා, ගරු ධර්මසිරි ඇරැව්ගොඩ මහතා ඇතුළු සියළුම දෙනාවද මෙම මොහොතේදී සිහිපත් කරමි.

2023 වර්ෂය තුළදී ද සියලු කටයුතු සාර්ථක කර ගනිමින් ප්‍රදේශයේ ජනතාවට සුබ විහරණය හා සුභ සිද්ධිය සැලසීමට සැවොම මා සමඟ එක්ව කටයුතු කරමින් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වයඹ අභිමානය ලෙසින් තවදුරටත් පෙර ගමන් කරවීමට අවශ්‍ය කටයුතු කිරිම සඳහා ඔබ සැමගේ සහය ලැබෙතැයි ගෞරවයෙන් අපේක්ෂා කරමි.

ගරු සභාපතිතුමා විසින් 2023 වර්ෂය සඳහා ගරු මහා සභාවට අළුත්වැඩියාව සඳහා ඉදිරිපත් කල අයවැය ප්‍රකාශය සඳහා වූ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.

රීතිවලට අනුව 2023 අයවැය ප්‍රකාශනය සඳහා සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙන බව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට දැනුම් දෙන ලදී. ඉන් අනතුරුව සංශෝධනය ඉදිරිපත් කල ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාට එම සංශෝධන යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලදී.

ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙම වර්ෂය සියළුම දෙනාට ආර්ථික වශයෙන් අමාරු කාලයක් බවත්,තමන් මෙම සංශෝධනය ඉදිරිපත් කරනුයේ පාසල් දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් බවත්,මෙම වර්ෂයේ ඒ සඳහා අයවැය තුළ ලක්ෂ 50ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර තිබෙන බවත්, ඒ වෙනුවෙන් නැවත නැවතත් ගරු සභාපතිතුමාට

ප්‍රදේශයේ ජනතාව හා අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන් වෙනුවෙන් ස්තුතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම එම සංශෝධනය පහත පරිදි ඉදිරිපත් කරන ලදී.

**2023 අයවැය කෙටුම්පත සඳහා සංශෝධන ඉදිරිපත් කිරිම.**

සභා බල ප්‍රදේශයේ පාසල් 42 ක පමණ අඩු ආදායම්ලාභි පවුල් වල දරුවන් සඳහා පාසල් අභ්‍යාස පොත් ලබා දිම වර්ෂ ගණනාවක සිට අප සභාව විසින් සිදු කරන විශේෂ ව්‍යාපෘතියන් වන අතර එහිදි බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභි පවුල් වලට විශාල සහනයක් සැලසෙන බව පෙන්වා දෙමි.

එහෙත් අප ආයතනය රජයේ ආයතනයක් වන SPC ආයතනයෙන් අඩු මුදලට පොත් මිලදි ගත්ත ද මේ වන විට එම ආයතනයේ මිල ගණන් ද පෙර වර්ෂයට වඩා 250% වැඩි මුදලකින් මිල ගණන් වැඩි වී ඇත.

ඒ අනුව 2023 වර්ෂයට අදාලව ක්‍රියාත්මක කිරිම සඳහා ඉදිරිපත් කර ඇති අයවැය කෙටුම්පත සඳහා පහත සංශෝධනය ඉදිරිපත් කරමි.

| | කෙටුම්පතේ වෙන් කර ඇති මුදල | සංශෝධනය විය යුතු මුදල |
|---|---|---|
| බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභි පවුල් වල පාසල් දරුවන් සඳහා අභ්‍යාස පොත් ලබාදීම | රු. 5,000,000.00 | රු. 10,000,000.00 |

තවද දැනට වෙන් කර ඇති මුදලට අමතරව වෙන්කල යුතු ලක්ෂ 50 ක මුදල පුවරාවර්ථන වියදම් යටතේ කොට්ඨාශ වෙනුවෙන් වෙන් කර ඇති මාර්ග/පදික වේදිකා/පාලම්/කාණු නඩත්තු වලට අදාල රුපියල් 50,560,000 ක් මුදලින් වෙන් කිරිම සුදුසු බව යෝජනා කරමි.

යු.ජුඩ් එම්මානුවෙල්,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.

මෙම යෝජනාව කාලෝචිත යෝජනාවක් බැවින් එම යෝජනාව ස්ථිර කරන බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී සංශෝධන වලට යටත්ව අයවැය ස්ථිර කලයුතු නොවේදැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

රීති වලට අනුව කටයුතු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දෙන්නේදැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

අවස්ථාවක් ලබාදෙන බවත්,ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ඉදිරිපත් කල සංශෝධනය පිලිගන්නා බවත්,ඒ සඳහා සියළුම දෙනා එකඟතාවය ලබා දෙන්නේදැයිද ගරු සභාපතිතුමා විමසා සිටින ලදී.

මන්ත්‍රීවරුන්ගේ විරුද්ධතාවයක් නොමැති බව ප්‍රකාශ කරන ලදී.

එම සංශෝධනය පිළිබඳව අදහසක් ඉදිරිපත්කිරීමට තිබේදැයි ගරු සභාපතිතුමා විමසා සිටින ලදී.

ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව 2023 වර්ෂයේ අයවැය කෙටුම්පත ගරු සභාපතිතුමා ඉදිරිපත් කර තිබෙන බවත්,සංශෝධනය ඉදිරිපත් කල පසුව මෙහි වෙනසක සිදු වන බවත්,සංඛ්‍යා වෙනස් වන බවත් එබැවින් කෙටුම්පත අද ඉදිරිපත් කිරීමට නොහැකි බවත් සංශෝධනය කර ඉදිරිපත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

මෙම අවස්ථාවේදී සංශෝධනය ගරු සභාවට ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම සංශෝධනය ඇතුළත් කර නිවැරදි කර එවන ලෙසත්,සංඛ්‍යා වෙනසක් සිදු වන බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් නිකුත් කරන ලද රීති අඩංගු ගැසට් පත්‍රය සියළුම දෙනාට මීට පෙර ලබා දී තිබෙන බවත්,එම රීති වලට අනුව මෙම වසරේත් අයවැය කෙටුම්පත සෑදීම සඳහා සභාවෙන්ම සම්මත කර ගත් බවත්,රීති වලට අනුව ගරු සභාපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් පසුව අයවැය කෙටුම්පත සම්මත කර ගැනීමට යෝජනාවක් ස්ථිර කර ගත යුතු බවත්,රීති 11 යටතේ සංශෝධනයක් ඉදිරිපත් කර නොතිබුණහොත් 12 යටතේ අයවැය පිළිබඳ විවාදයක් කර ඡන්ද විමසා අයවැය සම්මත කර ගැනීම සිදු විය යුතු බවත්,නමුත් යම් ලෙසකින් සංශෝධන ඉදිරිපත් කරන්නේ නම් මහා සභාව පැවැත්වෙන දිනට දින 3කට පෙර ලේකම්වරයා අතටඑම සංශෝධන ලැබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.ඉන් පසුව ඒවා සභාපතිවරයා සමඟ සාකච්ඡා කර අද දින ගරු මන්ත්‍රීවරුන්ගේ අතට ලබා දෙන බවත් එමෙන්ම මෙම සංශෝධනය පිළිබඳ යම් අදහසක් ඉදිරිපත් කිරීමට තිබේ නම් අදහස ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම සංශෝධනයට ඡන්දය විමසා එය සංශෝධනය කර ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී. ඉන් පසුව සමස්ථ අයවැයට විවාද පවත්වා ඡන්දය විමසා සංශෝධනයට යටත්ව එකඟතාවය ලබා දිය යුතු බවත්,අද දින කෙටුම්පත ලබා දී ඇති බවත් ලබන වසරේ අයවැය නිකුත් කරනුයේ සංශෝධන සහිතව බවත්,කෙටුම්පත සංශෝධනය කර නැවත කෙටුම්පතක් ලබා දීමට අවශ්‍ය නොවන බවත්,මෙතැන සංශෝධනය අනුමත වුවහොත් එම යෝජනාව ලේකම්වරයා විසින් අයවැය ලේඛණයට ඇතුළත් කර නිවැරදි අයවැය ලේඛණයක් ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

මෙහි සංඛ්‍යා වෙනස් වීමක් සිදු වෙන බවත්,සංශෝධනය ඇතුළත් කර නැවත ඉදිරිපත් කල යුතු බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමාගේ කෙටුම්පත සභාගත කල බවත්,ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා සංශෝධනය ඉදිරිපත් කල බවත්,එම සංශෝධනය සභාව කැමති නම් පිළිගන්නා බවත්,නැත්නම් අයවැය එතැනින් අවසන් වන බවත්දැනට සංශෝධනය සඳහා සභාවේ එකඟතාවය ලැබී ඇති බැවින් එම සංශෝධනයට යටත්ව අයවැය කෙටුම්පත සම්මත කරගත යුතු බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව විපක්ෂනායකතුමාගේ කාරණාවට යම් අදහසක් ඉදිරිපත් කිරීමට කැමති බව ප්‍රකාශ කරන ලදී.මෙම ඉදිරිපත් කර තිබෙනුයේ අයවැය කෙටුම්පත බවත්,කෙටුම්පතක් ඉදිරිපත් කරනුයේ පාර්ලිමේන්තුවට හෝ අදාල මණ්ඩලයට මේ මේ කටයුතු මෙලෙස කරමුයැයි යෝජනාවක් ලෙස බවත්, ඉන්පසුව එහි කොටස් ඉවත් කර ඇතුළත් කර අවශ්‍ය නම් අධිකරණයටද ගොස් අවසන් වශයෙන් එම සම්මත කර ගන්නා බවත් ඉන්පසුව එය ප්‍රින්ට් කර අත්සන් කර අවසන් වන බවත් නමුත් නැවතත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරන ලදී.

නව ක්‍රමවේදය පිළිබඳ තිබෙන අපහැදිලිතාවයක් හේතුවෙන් මෙලෙස ගැටළු මත වන බවත්,අයවැය ඉදිරිපත් කල බවත්,විරෝධතාවයක් නොමැති බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.

විරෝධතා විමසීමක් නොකල බවත්,ඒ සඳහා අවස්ථාව ලබානොදුන් බව ගරු මන්ත්‍රීටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා එකඟදැයි විමසූ බවත්,මෙය නිරවුල් කර ගැනීමට අවශ්‍ය බවත්,මීන්පෙර සිදු වූ සිදු විමට හා මෙය වෙනස් බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී. අයවැය සම්මත කලද සම්මත කල අයවැය පිළිබඳව පක්ෂ විපක්ෂ ඕනෑම මන්ත්‍රීවරයෙකුට තම අදහස ඉදිරිපත් කිරීමට මෙම රීති ඇතුළත බාධාවක් තිබේදැයිද විමසා සිටින ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව රීති අංක12(i) යටතේ හා 12(ii) යටතේ පළමුව සංශෝධනයට විවාදයක් කැඳවා අදහස් දැක්වීමෙන් පසුව ඉදිරියට කටයුතු කල හැකි බව එම රීති පෙන්වා දෙමින් පැහැදිලි කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා මෙම සංශෝධනය පිළිබඳව තම අදහස ඉදිරිපත් කරන බවත්,ඒ පිළිබඳ කිසිවෙකු උරණ නොවන ලෙසත් ඉල්ලා සිටින ලදී.මිලියන 05ක් වෙන්කර තිබෙන බවත්,මිලියන 10 දක්වා සංශෝධනයක් තිබෙන බවත්,එය ලබා ගන්නා වැඩ විෂයද සඳහන් කර තිබෙන බවත්,එම කටයුත්තද එවිට අඩාල වන බවත් ප්‍රකාශ කරන ලදී.කොට්ඨාස මන්ත්‍රීවරයෙකුට ලක්ෂ 2ක් පසුගිය වසර වල ලබා දුන් බවත්,අඩුආදායම්ලාභී දරුවන්ට පොත්දීම හොඳ කටයුත්තක් බවත්, තමන්ද ප්‍රතිපාදන නොලැබුණද පෞද්ගලිකව පොත් ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදී.මෙම අවස්ථාවේදී තමන් මෙම ලක්ෂ 02 ලක්ෂ 04 දක්වා වැඩි කර පොත් ලබා දීම දකිනුයේ මන්ත්‍රීවරුන්ට ලබා දෙන වක්‍රාකාර අල්ලසක් ලෙස බවත්,පලාත් පාලන මැතිවරණයක් අබියස සියළු දෙනාම සිටින බවත්,පොත් දෙන ලෙසට එය සිදු කරන බවත් මෙය තම පෞද්ගලික අදහස බවත් නමුත් පොත ලබා දීම ඉතාමත් හොඳ වැඩකටයුත්තක් බවත් ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව......

මේ වන විට පොත් වල මිල වැඩි වී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා මෙහිදී ප්‍රකාශ කර සිටියේ මෙවරද ලක්ෂ 02ක් වෙන් කර තිබුණද ගිය වසරේ එස්.පී.සී.ආයතනයේ මිල ගණන් හා මේ වසරේ මිල ගණන් සභාවෙන් ලබා ගෙන සසඳා බලන ලෙසයි.රු.37.00ට තිබූ පිටු 40 තනිරූල් පොත මේ වන විට රු.75ක් පමණ වී ඇති බවත්,රු.210.00ට තිබූ පිටු 160 සීආර් පොත මෙ වන විට රු.485.00ක් පමණ වී ඇති බවත් පොත් වල මිල දෙගුණයකටත් වඩා වැඩි වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.මෙම ලක්ෂ 4 වෙන් කලද මින් පෙර බෙදූ තරමින් පොත් බෙදීමට නොහැකි වේයැයිද, මෙය මැතිවරණයක් බලාපොරොත්තුවෙන් සිදු නොකල බවත් ලබන වසරේ මැතිවරණයක් නොතිබීමටද හැකි බවත් ප්‍රකාශ කරන ලදී.තම කොට්ඨාසයේ පොත් ඉල්ලූ කිසිම දරුවෙකුට වර්ග කර පොත් ලබාදී නොමැති බවත්,කවුරුන් හෝ අයදුම්පත්‍රයක් ලබාදී ඉල්ලීමක් කලේ නම්,එමෙන්ම විදුහල්පති ග්‍රාම නිලධාරී සහතික කලේ නම් පමණක් සභාවෙන්ද අයදුම්පත්‍රය භාරගත් බවත් ප්‍රකාශ කරන ලදී.බෙදූ සියළු දෙනාගෙන්ම අත්සන් ලේඛණයක් ලබා ගත් බවත්,ඕනෑම පොත් ලැබුණ කෙනෙකුගෙන් ලැබුණු පොත් පිළිබඳව විමසීමක් කල හැකි බවත්, පටු දේශපාලන අරමුණකින් සිදු නොකල බවත්, පවුලක පාසල් යන දරුවන් තිදෙනෙකු සිටී නම් අඩුම තරමින් එම බෑග්,පොත්,සපත්තු ගැනීමට රු.50,000ක් පමණ යන බවත්,එයට සහයෝගයක් වශයෙන් පොත් ලැයිස්තුව හෝ පෙර ලබා දුන් ආකාරයටම ලබා දීමට හැකි නම් වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.ලක්ෂ 2ක මුදල ලක්ෂ 4 දක්වා යෝජනා කල බවත්,එලෙස ඡන්දය ලබා දුන්නේ නම් සියළුම ඡන්දය තම පක්ෂයට ලැබිය යුතු බවත්, නමුත් එලෙස නොලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී.අයදුම්පත් නිකුත් කරන්නේ සභාවෙන් ග්‍රාම නිලධාරී සහතික කර තිබුණහොත් පමනක් බවත් එබැවින් ගැටළුවක් ඇති නොවන බවත් තවදුරටත් ප්‍රකාශ කල අතර තම කොට්ඨාස වල සිටින අඩුආදායම්ලාභීන් මේ සඳහා යොමු කරවන ලෙසද ඉල්ලා සිටින ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතාට සෑම වසරකම පොත් ලබා දෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම සංශෝධනය අද උදෑසන ඉදිරිපත් කල බවත්,එය රීති වල සඳහන් කර ඇත්තේ කෙසේදැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

සභාවේ ලේකම්වරයාට මහා සභාවට දින 03කට පෙර ලබා දිය යුතු බවත්,එය මහා සභාව පැවැත්වෙන අවස්ථාවේ මන්ත්‍රීවරුන් අතට පත් කලයුතු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මුදල් වැඩි කිරීම පිළිබඳව ගැටළුවක් නොමැති බවත්, දරුවන්ට දෙගුණයක් වැඩිකර හෝ ලබාදුන්නද ගැටළුවක් නොමැති බවත්, එයින්ම අනෙක් පසින් දරුවන්ට පොත් ගැනීමටවත් මුදල් නොමැති බව

පිළිඹිබු වන බවත්, එමහින්ද ගරු සභාපතිතුමන්ලාගේ උඩ තිබෙන දේශපාලනය අර්ථකථනය වන බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

අරගලයත් එයට හේතුව වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය හොඳ යෝජනාවක් බවත්,ගරු සභාපතිතුමන්ලාම එම අමාරුකම් තේරුම්ගෙන මෙම සංශෝධනය ඉදිරිපත් කිරීම පිළිබඳව ස්තූතිවන්ත වන බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම සංශෝධනය සඳහා පූර්ණ එකඟතාවය ලබා දෙන්නේදැයිද ගරු සභාපතිතුමා විසින් විමසා සිටින ලදී.

සියළුම දෙනා එකඟතාවය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 05

ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විසින් ඉදිරිපත් කල පහත සඳහන් සංශෝධනය සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

| යෝජනාව | වෙන් කර තිබූ මුදල | සංශෝධිත මුදල |
|---|---|---|
| බල ප්‍රදේශයේ අඩු අදායම්ලාභී පවුල්වල පාසල් දරුවන් සඳහා අභ්‍යාස පොත් ලබා දීම | රු. 5,000,000.00 | රු. 10,000,000.00 |
| මාර්ග/ පදික වේදිකා/පාලම්/කාණු නඩත්තු | රු. 50,560,000.00 | රු. 45,560,000.00 |

ඉන් පසුව අයවැය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට ගරු සභාපතිතුමා අවස්ථාව ලබාදෙන ලදී.

❖ ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ගරු සභාපතිතුමාගේ දෙවන ධුර කාලයේ 5වන අයවැය ඉදිරිපත් කර තිබෙන බවත්,"පහසුකම් සපිරි යහපාලිත පුරවරයක්" යනුවෙන් සභාවේ දැක්ම තිබෙන බවත්, සභාවේ මෙහෙවර ලෙස "වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය නංවාලීම උදෙසා පහසුකම් සපයමින් සභාව සතු සම්පත් හා අනෙකුත් ආදායම්, ආධාර,කාර්යක්ෂමව,ඵලදායීව කළමනාකරණයකර පුළුල් ජනතා සහභාගීත්වයෙන් යුක්තව උපරිම සේවාවක් සැපයීම අපගේ මෙහෙවර වේ" ලෙස තිබෙන බවත්, තමන් මෙහිදි කාරණා කීපයක් මතු කිරීමට සූදානම් වන බවත් සංඛ්‍යා ලේඛණ පිළිබඳව කතා නොකරන බවත් කෝටි ගාණක ආදායම් හා ඒවා වියදම් කරන ආකාරය ද මේ සභාවේ දුටු බවත් ප්‍රකාශ කරන ලදී. කාරක සභා කීපයක් තිබෙන බවත්, සෞඛ්‍ය හා පරිසරය ගතහොත් සභාවේ පරිසර කමිටුවක් තිබෙන බවත්,එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේද පරිසර කමිටුවක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.ගංගා හා මුහුදු වෙරළක් අපට තිබෙන බවත් ඒවා සලකා බැලීමේදී ඒ අවට රක්ෂිත ප්‍රදේශ වලට කුමක් සිදු වී තිබේදැයි නිරීක්ෂණය කරන ලෙසත්, අයවැය සම්මත කර ගැනීමට මහා ලොකුවට රීති කතා කරන බවත්, අයවැය ඒකමතිකව සම්මත කර ගත්තද එය ගැටළුවක් නොමැති බවත් අයවැය බෙදීම් ඉල්ලන බැවින් මෙවැනි රීති ද ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. පරිසරයට , වෙරළට සිදු වී ඇති හානිය ගොස් බලන ලෙසත්, එක් දවසක ව්‍යාපෘතියක් කර යන බවත්, තමන් පවසනුයේ සංයුක්ත සැලසුමක් පරිසර කමිටුවට නොමැති බවයැයිද , එසේ තිබුණේ නම් අද වන විට පරිසරය මෙලෙස විනාශ නොවන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. තම ඉඩමට අල්ලපු ඉඩම වෙල්යායක් බවත්,අද වන විට එහි පොලිතීන් හා ප්ලාස්ටික් කොපමණ තිබේද? එමෙන්ම වෙන්නප්පුවට ඉතිරි වී තිබෙන ජල පෝෂක ප්‍රදේශයද එය බවත් කුඹුරුයාය ගොඩ කරමින් ගියද ඒ සඳහා පරිසර කමිටුව මෙතෙක් ගත් ක්‍රියා මාර්ගයක් නොමැති බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී. සංඛ්‍යා ලේඛන වලින් පරිසරය නැන්වීමට පරිසරය පිරිසිදු කිරීමට මුදල් වෙන් කර ඇතිමුත් එය ජන ජීවිතයට බලපාන කාරණා වලදී මුදල් වෙන් කිරීම් බලපා නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා සුනඛ සෙවණ ඉදි කල බවත්,යම් වැය විෂයකින් සභාවේ අරමුදල්ද ඒ සඳහා වෙන් වූ බවත්, නමුත් අද වන විට එහි සුනඛ සෙවණක් නොමැති බවත්, ගඳ ගසනා කුණු ගොඩක් පමණක් ඉතිරි වී ඇති බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.ගරු සභාපතිතුමා කසල ප්‍රතිචක්‍රීකරණ ආයතනය ඉදි කල පසුවවත් එය විසඳාවියැයි බලාපොරොත්තුවක් තබා ගනිමුයැයිද ප්‍රකාශ කරන ලදී. පරිසර කමිටුවේ ගරු සභාපතිතුමා හා කමිටු සාමාජිකයින් මෙහි සිටින බවත් ගිංඔය රක්ෂිතයේ කුණු පිරවූ බවත් ඊට උඩින් බොරළු දමා වසා දමන බවත් අයවැය තුළින් මුදල් වෙන් කරනුයේ ඒ සඳහාදැයිද විමසා සිටින ලදී.එම කසල උඩින් ජලය වැටී කාන්දු වී අපද්‍රව්‍යය සියල්ලම ගඟට ගලා යන බවත්, අනුන්ගේ ඉඩමක්, එම රක්ෂිත ප්‍රදේශය ගරු සභාපතිතුමා ගොඩ කරදී තිබෙන බවත්,ඒවා වෙනම දේශපාලන ව්‍යාපෘති බවත් සුනඛ සෙවණ ගැනීමේදී සතෙකු වෙනුවෙන් කල එම හොඳ කාර්යය පවත්වාගෙන යාමට නොහැකි වී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

මුදල් පිළිබඳ මතකයක් නොමැති බැවින් ගිය වසරේ වෙන් කල මුදල් පිළිබඳ සිතා බලන ලෙසත්, පොදු පහසුකම් කමිටුව තිබෙන බවත්, ඊයේ වර්ෂාව පටන් ගත් බවත්, අද උදෑසන මන්ත්‍රීවරුන්ද පාරේ එන්නට ඇතැයිද ආපදා කලමනාකරණයට ඕනෑතරම් මුදල් වෙන් කර වියදම් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.තමන්ද එම කමිටුවේ සාමාජිකයෙකු බවත්, නමුත් යෝජනාවක් කමිටුවට ඉදිරිපත් කල විට එය කමිටුවේ සාකච්ඡා නොවූ බවත් එම යෝජනාවම මාස කීපයකට පසුව වෙනත් මන්ත්‍රීවරයෙකු කමිටුවට ඉදිරිපත් කරන බවත් එය කොතරම් ජඩ දැයි සිතා බලන ලෙසත් ප්‍රකාශ කරන ලදී. වයඹ අභිමානය ලෙස පැවසුවද අද මහා සභාවට යෝජනාවක් ඉදිරිපත් කල බවත්, දරුවන්ට මන්ද පෝෂණය තිබෙන බවත්,ලෝකයේ තුන්වන හයවන ස්ථානයට පැමිණ තිබෙන බවත්, දරිද්‍රතාවයෙන් පවුල් ලක්ෂ 93 සිටින බවට ඊයේ පේරාදෙණිය සරසවියෙන් කල සමීක්ෂණ වාර්තාවෙන් ඔප්පු වූ බවත් එසේ තිබියදී වෙන්නප්පුව බල ප්‍රදේශය,අප ආසනය තුළ ළදරු පාසල් දරුවන්ට පෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලෙසට තමන් යෝජනාවක් ඉදිරිපත් කලද එය හැරෙන තැපෑලෙන් ප්‍රජා සංවර්ධන කමිටුවට යොමු කල බවට ලිපිය එවූ බවත් නමුත් එය එම කමිටුවෙන් විසඳිය නොහැකි බවත් මන්ද තමන් එහිදි වෙන්නප්පුව බල ප්‍රදේශයේ තිබෙන සියළුම පෙර පාසල් වල සිටින දරුවන් සලකා එය ඉදිරිපත් කල බවත් ප්‍රකාශ කරන ලදී.නමුත් ගරු සභාපතිතුමා එය මහා සභාවට ඉදිරිපත් කිරීමටවත් කාරුණික නොවූ බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

වෙන්නප්පුවේ තිබෙන ජල ප්‍රශ්නය,එයට අදාල සියළු දෙනා සම්බන්ධයෙන්, එහි සියළුම කාරණා සම්බන්ධයෙන් මීට පෙර මහා සභාවට තමන් යොමු කර තිබෙන බවත්, එම යොමු කල එක් යෝජනාවක් හෝ මහා සභාවට නොපැමිණි බවත්, එය ඉතාමත් කණගාටුවෙන් ප්‍රකාශ කරන බවත් පවසා සිටි අතර දරුවන්,මාර්ග පද්ධතිය, පරිසරය වෙනුවෙන් කල එක් වැඩ වැඩසටහනකටවත් කෙදිනකවත් විරුද්ධ වී නොමැති බවත් නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් නිහඬව මේවා දෙස බලා සිටින බවත් තමන් ඔවුන්ට චෝදනා කරන බවත් මේවායෙහි සිදු වන අකටයුතුකම් සොයා බලා ජනතාවගේ ප්‍රශ්න කතා කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී. රනිල් රාජපක්ෂ හා මහින්ද වික්‍රමසිංහ ලෙස මෙම දෙපිරිසද එකතු වී හෝ එකතු වීමට යන්නේද යන්න තමන් නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

සතිපොලවල් වල ගැටළුවක්ද තිබෙන බවත්,තමන් මේවා පවසනුයේ අයවැයෙහි කෙතරම් මුදල් වෙන්වුවද මේවා කෙතරම් දුරට ජන ජීවිතයට බලපාන්නේද යන්න පැවසීමට බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.ප්‍රජා සේවා තිබෙන බවත්,තමන්ද පෙර පාසල් දරුවන්ට පෝෂණ වැඩ සටහනක් ඉදිරිපත් කල බවත් ප්‍රජා කමිටුවේ සභාපතිතුමාද මෙහි සිටින බැවින් එයට කෙතරම් දුරට සාධාරණයක් කරාවිදැයි බලමුයැයිද, අඩුම තරමින් තමන් කල එම යෝජනාව හෝ ඉටු කරන ලෙසටද ඉල්ලා සිටින ලදී. විපක්ෂයේ මන්ත්‍රීවරුන් ලෙස නැගිට මොනා පැවසුවද මෙය ගරු සභාවක් ලෙස පැවසුවද මෙතෙක් මෙම සභාවට සාදාචාරසම්පන්න වගකීමක් හෝ යුතුකමක් නොතිබුණ බවත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන් පක්ෂපාතිව යෝජනා වලට අත ඔසවන බවත් අද දිනද අයවැය ඒකමතිකව ලෙස දමා ගන්නා බවත් නමුත් විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට රුපියලක වියදමක් හෝ වෙන් නොකල බවත් ප්‍රකාශ කරන ලදී.

විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලබා දී තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කිසිවක් ලබා නොදුන් බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතාට ලබා දුන් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පක්ෂ විපක්ෂ නොමැතිව සියළුම මන්ත්‍රීවරුන්ට එක සමාන වරප්‍රසාද ලැබිය යුතු බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

එසේ සිදු වන්නේ පාර්ලිමේන්තුවේ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිද එලෙස සිදු විය යුතු බවත්,මුදල් වෙන් කිරීමේදී පමණක් එය තිබෙන බවත් තමන් සදාචාරය පිළිබඳව කතා කරන බවත් නීතිය පිලිබඳ කතා කිරීමේදී මෙහි නීති නොමැති බවත්,මෙතැනම නීතියට උදාහරණ තිබෙන බවත් කමිටු වාර්තා අද උදෑසන ලැබුණ බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

ඒවා මන්ත්‍රීවරුන්ගේ whatsapp group එකට යොමු කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කියවීමට හා නැවත පිටපතක් ගත හැකි ලෙස ඒවා ඉදිරිපත් කරන ලෙසත්,තාක්ෂණය පිලිබඳව පවසන බවත් තාක්ෂණය උපරිමයෙන් ගෙනාවා CAT වැඩසටහන් ගැන කතා කරන බවත් වාර්තාවක් PDF File එකක් කර නොදමන බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.ගරු සභාපතිතුමාගේ අද උදෑසන ලබා දුන් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වෙන්නප්පුව බල ප්‍රදේශයේ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම උසස් කරන්නේ කෙසේද යන්න සඳහන් වී නොමැති බවත් ප්‍රායෝගික සැලැස්මක් තිබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

පාසල් වල නඩත්තු කටයුතු සියල්ල අප සභාව මගින් සිදු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සෞඛ්‍යට මුදල් වෙන් කරන බවත්,නමුත් අප සතුව අප බල ප්‍රදේශයේ සිටින නිදන්ගත රෝගීන්ගේ ලැයිස්තුවක් අප සතුව තිබේදැයිද?දත්ත සංඛ්‍යා ලේඛණ තිබේදැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

ඒවා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පසුගිය වසරට සාපේක්ෂව මේ වසර පිළිබඳව එම සමාලෝචන වාර්තාවල සඳහන් වී නොමැති බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.ආදායම් ඉපයීම පිළිබඳ කතා කිරීමේදී ලස්සන වෙරළ තීරයක්,ගඟක් ,මෝයක් තිබෙන බවත්,මේවා වලින් ඕනෑ තරම් ආදායම් උත්පාදනය කිරීමට හැකි බවත් කිසිඳු අයවැයක එ්වා ප්‍රයෝජනයට ගන්නා බවක් පෙනීමට නොමැති බවත්,වෙරළ උද්‍යාන සාදා ඇති බවත් ඒවාට වී තිබෙන දෙය එහි ගොස්ම බලන ලෙසත් ප්‍රකාශ කරන ලදී.වෙන්නප්පුව ආසනයේ සමෘද්ධිලාභීන් කී දෙනෙකු සිටීද? ඒ සියළු දෙනා යනු අපගේ දිළිඳුකම බවත්,එම දිළිඳුකම නැති කිරීමට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවෙන් ගත් පියවර මොනවාද? ඒවා ජන ජීවිතය හා ගැටුනු ආකාරය? මෙහෙවරෙහි පුළුල් මහජන සහභාගීත්වයක් යනු එය බවත්,මේවා ජන ජීවිතය හා සම්බන්ධ වී නොමැති බවත්, දවසින් දවස සමෘද්ධිලාභීන් වැඩි කිරීමට නොව ඒවා නැති කිරීම කල යුතු බවත් එම ජනතාව දෙපයින් නැඟිටවා ආර්ථික වශයෙන් උඩට ඔසවා කටයුතු කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.අද දින දීමනාව ගනුයේ එම දිළිඳු ජනතාවගේ මුදලින්ම බවත් එම ජන ජීවිත එසවීමට යෝජනා තිබෙනුයේ කොහිදැයිද විමසා සිටින ලදී.මෙම ප්‍රාදේශීය සභාවේ දීර්ඝකාලීන,මධ්‍යකාලීන හා කෙටිකාලීන වැඩපිළිවෙලක් නොමැති බවත්,වාර්ෂික අයවැයක් ඉදිරිපත් කලද ජන ජීවිතය හා බද්ධ වූ දීර්ඝකාලීන වැඩ පිළිවෙලක් නොමැති බවත්,ජනතාව ඊළඟ වර්ෂයේදී කොතැනට යන්නේදැයිද අපගේ ව්‍යාපාර ඊළඟ වර්ෂයේදී කොතැනට යන්නේදැයිද ඒවා ජාතික ආර්ථිකයට කෙතරම් බද්ධ කරන්නේද යන්න මේ තුළ නොමැති බවත්,ඩොලර් ගෙන ඒමට මෙම කර්මාන්ත කෙතරම් දුරට භාවිතා කරන්නේද යන්න ඉලක්කයක් නොමැති බවත් එම කිසිවක්ම මෙයට ඇතුළත් වී නොමැති බවත් එබැවින් මෙයට තමන් විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදී.ජන ජීවිතය සමඟ ඉලක්කගත වැඩ පිළිවෙලක් කෙදිනකවත් කර නොමැති බැවින් විරුද්ධ බව තවදුරටත් පවසා සිටින ලදී. එය තමන් මෙම කතාවෙන් ඔප්පු කල බවත්, සංඛ්‍යා ලේඛණ සමඟ තමන් නොළල්ලුන බවත් පවසමින් තම කතාව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා නඟපු චෝදනාවට තමන් දෙයක් පැවසීමට කැමති බවත්, ජනතාවට ආදරය කරන පක්ෂයක් ලෙස ඔවුන් ලෝකයට රටට පවසන බවත්, පරිසර කමිටුවට ජනතා විමුක්ති පෙරමුණේ නියෝජනය නොමැතිව වසර 3ක් පමණ වන බවත්, පසුගිය කමිටු

වාර්තාව එතුමා කියවා තිබේ නම් එතුමා පැවසූ කාරණා වල අන්තර්ගතයන්ද ඒවායෙහි අඩංගු වී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

ගිංඔය සම්බන්ධව එතුමා පැවසූ බවත්, ගිං ඔයට අයිතිකරුවෙකු නොමැති බවත්,මධ්‍යම රජයට අයිතිවිය යුතු අන්තර් පලාත් ඔයක් බවත්,පළාත් කීපයක් පසුකරගෙන ගොස් මුහුදට වැටෙන්නේ නම් එය මධ්‍යම රජයට අයිති බවට මතයක් තිබෙන බවත්, ගිංඔය සංරක්ෂණ කමිටුවේ දිසාපතිතුමා ප්‍රධානත්වයෙන් තමන් ද සිටින බවත්, ගිං ඔය සංරක්ෂණය කිරීමේ අසාර්ථක උත්සාහයක තමන්ද යෙදෙන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. ගිං ඔයට අයිතිකරුවෙකු නොමැති තත්ත්වයක් තුළ එයට මායිම්ව සිටින සියළුම දෙනා මිනින්දෝරුවන් ගෙනැවිත් පිඹුරුපත් සකස් කර තම ඉඩමට එම කොටසක එකතු කර ගන්නා වාතාවරණයක් මේ වන විට තිබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.මේ පිළිබඳ තමන් රටේ නායකයින් ඇතුළු වාරිමාර්ග දෙපාර්තමේන්තුවට යනාදී සියළු දෙනාට ලිඛිතව ඉල්ලීම් කලද අවසානයේ බැරිම තැන ගිං ඔය සංරක්ෂණය කර දෙන ලෙසට ඕලන්දයේ dutch panel එකටද ඉල්ලීමක් කල බවත්, ඕලන්ද රජය විසින් අප රට පාලනය කල අවධියේදී මෙම ගිං ඔය ඔවුන්ගේ ප්‍රධාන සැපයුම් මාර්ගයක් ලෙස තිබූ බැවින් එය සිහිවටනයක් ලෙස සංරක්ෂණය කිරීමට අවශ්‍ය සහයෝගය දෙන ලෙසට ඉල්ලීම කල බවත් ප්‍රකාශ කරන ලදී.පුත්තලමේ ආරම්භයේ සිට අවසානයේ ගිං ඔයෙහි කොටසක් වැටෙන බවත්, ඉන් පසුව මෝදරට ගොස් ඕලන්ද ඇලට වැටෙන බවත් එක් එක් කාල වල රට පාලනය කල පාලකයින් ගිං ඔයේ ආරම්භක හා අවසාන ස්ථානය පිළිබඳ නොදන්නා බැවින් ඒ සඳහා අයිතිකරුවෙකු නොමැති වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

පරිසර කමිටුවේ ගරු සභාපතිතුමා ලෙස රටට ඩොලර් පැමිණෙන ප්‍රධාන ප්‍රදේශයක තමන් සිටින බවත්,සංචාරක හෝටල් පරිශ්‍රයක අප සිටින බවත් එම සංචාරක හෝටල් හිමියන් හා ප්‍රාදේශීය සභාව එකතු වී අසීමිත අවස්ථා වල ගිං ඔය පිරිසිදු කිරීමේ වැටසටහන් සිදු කර එම සියළුම අපද්‍රව්‍යය ඉවත් කර ඇති බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. පරිසර කමිටුවේ පසුගිය වාර්තා කියවා බලන ලෙසත්,පරිසර කමිටුව ලෙස පුළුල් කටයුතු වල යෙදී තිබෙන බවත්, ඉතාමත් අපහසුතා මධ්‍යයේ වුවද වෙන්නප්පුව පිරිසිදු නගරයක් කිරීමට හැකි සෑම විටම උත්සාහ කර තිබෙන බවත් පසුගිය කාලය තුළ ඉන්ධන ගැටළු තිබියදීද යම් අවස්ථාවල QR code එකට පමණක් ඉන්ධන ලබා දීම තුල වුවද උපරිමයෙන් ඒ සියල්ල කලමනාකරණය කර අත්‍යවශ්‍යම ස්ථාන වල පමණක් කසල එකතු කරමින් ක්‍රමානුකූලව හා විධිමත්ව කටයුතු කල බවත් ප්‍රකාශ කරන ලදී.

ගිං ඔය අපිරිසිදු කිරීම් වැනි දැට නීතියක් පාර්ලිමේන්තුව තුළ ස්ථාපිත කර එවන ලෙසට පැවසුවද ඒවා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කර නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වෙනත් අසන වල මිනිසුන්ද මෙම ප්‍රදේශයට කසල බැහැර කර යන බවත්, ඒවාද අපට කර ගැසීමට සිදු වී තිබෙන බවත්,අප වරිපනම් සීමාව කොතැනද එයින් ඔබ්බට යන සීමා නොබලා ආසනය තුළ සමස්ථ ජනතාවට සමසේ සේවයක් ලබා දීමේ මතය තුල සිට එම කටයුතු කරගෙන යන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.එමෙන්ම කසල එකතු කිරීමට අමතරව අධ්‍යාපනය, ක්‍රීඩාව පසින් කෙතරම් කැප කිරීම් කරන්නේද යන්න මතක් කල යුතු බවත්, සියළුම පාසල් වල ක්‍රීඩා පිටි සුද්ද පවිත්‍ර කර දෙන බවත්,පාසල් බැහැර කරන කසල සියල්ලම එකතු කරන බවත් දරුවන්ගේ ක්‍රීඩා කෞශල්‍යයට හා ඔවුන්ගේ මානසික තත්ත්වයටද ප්‍රදේශීය සභාවක් ලෙස කැප වන බවත්, වැරදි කෝණයෙන් සෑම දෙයම බලා කටයුතු නොකරන ලෙසත් පවසා සිටින ලදී. එටට ඩොලර් ලැබෙන ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු ලෙස තමන් සංචාරක හෝටල්හිමියන් එකතු කර ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කර වෙරළ පිරිසිදුව පවත්වා ගැනීම හා සංචාරකයින්ට වෙරළට ආසාවෙන් යාමට හැකි තත්ත්වයක් සෑම මාසයකටම වරක් සුහදව සාකච්ඡා කර වෙරළ ආරක්ෂා කරගෙන ගිය බවත් ප්‍රකාශ කරන ලදී. ධීවර කර්මාන්තයත් සමඟ නොදිරන කසල වෙරළට පැමිණෙන බවත්,ප්‍රධාන ගංගාවල් දෙකක් මුහුදට වැටෙන බැවින් අපද්‍රව්‍යය පැමිණෙන බවත්,ධීවර යාත්‍රා දියත් කර ගැනීමටනොහැකි බව පැවසූ බැවින් ඊයේ දිනයේදීද මොය කපා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.

පසුගිය වර්ෂාවත් සමඟ ධීවරයින්ගේ මංකඩ සියල්ල අපවිත්‍ර වූ බවත්,සභාවේ බැකෝ යන්ත්‍රය මඟින් ඒ සියල්ල පිරිසිදු කර දුන් බවත්, කිසිවක් සොයා නොබලා කතා නොකරන ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ජනතාව ජලයට යටවන සෑම අවස්ථාවේදීම වගකිවයුතු ප්‍රාදේශීය සභාවක් ලෙස පරිසරයට ආදරය කරන සභාවක් ලෙස පරිසරයට හානියක් නොවී,බාදනයක් නොවී විධිමත්ව වෙරළ සංරක්ෂණ ආයතනයත්

සමඟ එකතු වී මෝය කපන බවත්,මීට සති තුනකට පමණ පෙර දැවැන්ත ශ්‍රමදානයක් මඟින් වයික්කාල වෙරළ පිරිසිදු කල බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

කාන්තාවන් 100කට අධික පිරිසකට රැකියා ලබා දී තිබෙන බවත්, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ එකතු වී රු.3000ක් දිනකට ගෙවා වෙරළ පිරිසිදු කරන බවත්,රේඛීය අමාත්‍යාංශයෙන් ඒ සඳහා ගෙවීම් කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ජනතා විමුක්ති පෙරමුණේ සමහර ආකල්පක් තිබෙන බවත්,ජනතාව අසීමිත ලෙස දරිද්‍රතාවයට පත් කර දුකට පීඩාවට පත් කර බලයට පැමිණිය හැකි දැයි ඔවුන් උත්සාහ කරන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.ඔවුන් පාලනයට ආවද මෙම දරිද්‍රතාවයම පවතින බවත්,එබැවින් සියළුම දෙනා එකතු වී කටයතු කරමුයැයිද, යම් යම් විදේශ ප්‍රේෂණ පැමිණීම වලකා ඒ තුළින් රටේ ජනතාව දරිද්‍රතාවයට පත් වී ඒ තුළින් පාලන බලය ගැනීමට හැකිදැයි සිතන බවත්, දරුවන් විදේශීය මුදල් නොඑවීම තුළ ඔවුන්ගේ දෙමාපියන් දුක් විඳිනා බවත් කිසිත් නොසිතා එසේ සිදු නොකරන ලෙසත්, රට යහපත් නැතිනම් කෙසේ මුදල් උපයා තිබුණද ජීවත් වීමට නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.වැරදි අඩුපාඩු පෙන්වා දීම වටිනා බවත්, නමුත් කුඩා අඩුපාඩු සොයා සිදු කල සියළුම සත්ක්‍රියා යටපත් කර පෙන්වා දීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන ලදී.ගිංඔය පිළිබඳව අවධානයෙන් සිටින බවත්, ඒ පිළිබඳව ඉල්ලීම් කර තිබෙන බවත්,මැනුම් කටයුතුද කර සංචාරකයින්ට වාහන තදබදයෙන් තොරව කොළඹට යා හැකි හොඳ බෝට්ටු සේවාවක් සැපයීමේ මාර්ගය සකස් කර දෙන ලෙසට තමන් යෝජනා කල බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව හැකි සෑම අවස්ථාවකම ගිංඔය වෙනුවෙන් විශාල කැපවීමක් කරන බවත්,අවස්ථා ගණනාවකදී භාහිර මිනිසුන් පැමිණ ගිං ඔයට කුණු උර දමා ඒවා වෙරළට නැවත පැමිණෙන බවත් ප්‍රකාශ කරන ලදී.මෙම කටයුතු පවත්වා ගෙන යාමට සහයෝගය ලබාදෙන ලෙසත්,ඊළඟ පරිසර කමිටුවට හෝ ජනතා විමුක්ති පෙරමුණේ නියෝජනයක් ලබාදෙන ලෙසත් කුඩා අඩුපාඩු ප්‍රසිද්ධියේ පෙන්වා දී විවේචනය නොකරන ලෙසත් ඉල්ලා සිටිමින් තම කතාව අවසන් කරන ලදී.

❖ ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව ගරු සභාපතිතුමාගේ අයවැය කෙටුම්පතත් සමඟ සතුටක් හිතේ තිබෙන බවත්,එය සාර්ථක අයවැයක් ලෙස දැකීමට හැකි බවත් ප්‍රකාශ කරන ලදී.පෙරපාසල් ගුරුවරියක් මවක් ලෙස තමාට අදහසක් එකතු කිරීමට තිබෙන බවත්, අධ්‍යාපනය යනු රටේ අනාගතය බවත් නමුත් අධ්‍යාපනය ලබන දරුවන්ගේ පසින් සිතා බැලීමේදී යම් යම් හේතු පදනම් කරගෙන දෙමාපියන් අධ්‍යාපනය ලබාදිය නොහැකි පුංචි අපහසුතාවයකට පත් වී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. තමන් මෙහිදී කතා කරනුයේ එය කාගේ කොතැනින් වැරදුනාද යන්න පිළිබඳව නොවන බවත්,වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව ලෙස අපට හැකිනම් වෙන්නප්පුව බල ප්‍රදේශයේ සිටින දුවා දරුවන්ට අධ්‍යාපනය පසින් ලබාදෙන දායකත්වය තවදුරටත් වැඩි කිරීමට එය වටිනා බවත් ප්‍රකාශ කරන ලදී. ගරු සභාපතිතුමා සෑම විටම මෙම ප්‍රදේශයේ දරුවන් පිළිබඳ සොයා බලනා බවත් මේ වන විට දරුවන්ගේ අධ්‍යාත්මික ගුණ, සාරධර්ම පිරිහී පාසල තුලට දරුවා මත්ද්‍රව්‍යය ගෙනයන තත්ත්වයට පත් වී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. මෙහිදී දහම්පාසල් අධ්‍යාපනය දරුවාට සුවිශේෂී අවස්ථාවක් බවට පත් වන බවත් මීට වසර ගණනාවකට පෙර දහම්පාසල් තරඟ ක්‍රියාත්මක වූ බවත්,දරුවන් දහම් පාසලට පැමිණෙන ප්‍රවණතාවයද වැඩි වී තිබූ බවත්,නමුත් රටේ පැවතුන රෝග තත්ත්ව තුළ ඒවා සීමා වූ බවත් එබැවින් වෙන්නප්පුව ශාසනාරක්ෂක බල මණ්ඩලයත් දංකොටුව ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයත් ලෙස වෙන් කර දහම් පාසල් දරුවන්ගේ පවත්වා ගෙන පැමිණි තරඟාවලිය නැවතත් යාවත්කාලීන කර දෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී. එමෙන්ම එහිදී දරුවන්ගේ ජයග්‍රහණයන් වෙනුවෙන් ලබාදෙන සහතික පතකට හෝ පුංචි දායකත්වයක් ලබා දීමට හැකි නම් එය සුවිශේෂී අවස්ථාවක් ලෙස දකිනා බවත්, අයවැයට නැවත එකතු කිරීමට පවසනවා නොව යොදා ගත හැකි ක්‍රමවේදයක් තුළින් එම කර්තව්‍යය සිදු කරන්නේ නම් හොඳයැයිද ප්‍රකාශ කරන ලදී.

පාසල් අධ්‍යාපනය පළාත් සභාව මධ්‍යම ආණ්ඩුව තුළින් ක්‍රියාත්මක වුවද, මේ වන විට දරුවන්ට පැවැත්වෙන විභාගත් සමඟ ප්‍රශ්න පත්‍ර කට්ටලයක් ලබා ගැනීමට දෙමාපියන්ට අපහසුතා පවතින බවත්, එබැවින් සම්මන්ත්‍රණ වැනි පුංචි අවස්ථා කීපයක් පාසල් වලට දියත් කර එම දරුවන් ඉදිරිපත් වන කඩඉම් විභාග ජය ගැනීමට පුංචි ශක්තියක් එකතු කිරීමට හැකිනම් සභාවක් ලෙස අපි එතැනදී හොඳ සත්කාරයක් කලායැයි හැඟිම අපට දැනේවියැයිද ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.එමෙන්ම ගරු සභාපතිතුමා විසින් ළමුන්ට ලබාදෙන පාසල් පොත්ද ඉතාමත් වටිනා

බවත්,ගුරුවරුන් ලෙස දරුවාට පොතක් ගෙන ඒමටවත් අපහසුතා තිබෙන බව දකිනා බවත්,දරුවන් කීප දෙනෙකු සිටින පවුලක දෙමාපියන්ට එය කිරීමට ඉතාමත් අපහසු බවත්, එම පොත් ලබා දීමට මුදල් වැඩි කිරීමේ යෝජනාව එම ආදරණීය අම්මා තාත්තාට ලබා දුන් විශාල ශක්තියක් අත්වැලක් බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම පාසල් වල සිටින දරුවන් වයස අවුරුදු 12-13 වන විට මත්වන දරුවන් බවට පත් වී සිටින බවත්,වැඩිහිටි පිරිස මෙයින් මුදවා ගැනීම අපහසු බවත් මේ විනාශ වනුයේ රටේ කොඳුනාරටිය අනාගතය බැවින් සම්පත් දායකත්වයක් තුළ පාසල් වලින් ලබා ගත යුතු අවසර ගෙන එම දරුවන් මෙම භයානක තත්ත්වයෙන් මුදවා ගැනීමට කටයුතු කරමුයැයිද,දරුවන්ට ආදරයෙන් මෙහි භයානක තත්ත්වය කියා දීමට හැකි හොඳ දේශකයෙකු සම්බන්ධ කර ගෙන එක් එක් පාසලට මාස 2කට වරක් හෝ දරුවන්ට මඟපෙන්වීමක් කල හැකි නම් හොඳ බවත් ප්‍රකාශ කරන ලදී.එය සිදු කිරීමට හැකි නම් ගරු සභාපතිතුමාගේ ධුර කාලය ඉතිහාසගත වේවියැයිද, එය වටිනා සේවයක් වේවියැයිද ගරු සභාපතිතුමාට එය කිරීමට හැකි දැයි තමන් නොදන්නා බවත්,නමුත් කුමක් හෝ තැනකින් පුංචි කොටසක් හෝ යොදාගෙන හැකි නම් මන්ත්‍රීවරුන් ලෙස ගරු සභාපතිතුමා ලෙස ලබන ජයග්‍රහණය එය බවත්, තමන් අයවැය ලේඛණය පිළිබඳව කතා නොකරන බවත්,සමාජය තුළ දකිනා ප්‍රශ්නයක් බවට පත් වී ඇති දේ පැවසූ බවත් දරුවන් දහම් පාසල් අධ්‍යාපනය යොමු කිරීම,පාසල් අධ්‍යාපනයට දරුවන්ට පුංචි හෝ අතහිත දීමක් සිදු කිරීමට හැකිනම් වටිනා බවත් යෝජනා කරමින් තම කතාව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව දරුවන් සම්බන්ධව අද දින කතා කල බවත්, පාසල් වලත් දරුවන් මත්ද්‍රව්‍යය සඳහා ඇබ්බැහි වීමේ ප්‍රවණතාවයක් ඇති වී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.පුනරුත්තාපන මධ්‍යස්ථාන හිස් වී ඇති බැවින් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවෙන් මේ සඳහා යෝජනාවක් සම්මත කර ගැනීමට හැකි නම් හොඳ බවත් ප්‍රකාශ කරන ලදී.උසාවි වලට තිබෙනුයේ පාර්ලිමේන්තුවේ 225 දෙනා සම්මත කර එවන පණත අනුව කටයුතු කිරීම බවත්,දෙමාපියන් පැමිණ දරුවා පුනරුත්තාපනයට යොමු කරන ලෙසට ඉල්ලීම් කරන බවත්, නමුත් එය අධිකරණයට කල නොහැකි බවත්,පණතේ අධිකරණයට තිබෙනුයේ දඩය ගසා ගෙදර යැවීමට බවත් ප්‍රකාශ කරන ලදී.මෙය පාර්ලිමේන්තුවේ සංශෝධනය විය යුතු බවත්, මේ පිළිබඳව තමන් පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරුන්ටද මේ පිළිබඳව පැවසූ නමුත් තවමත් ඒ පිළිබඳව කතා කර නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.පාසල් වලින් පිටතට පැමිණෙන දරුවන්ට නිපුණතා සංවර්ධන අංශයකින් වෘත්තීය පුහුණුව අනිවාර්යය කල යුතු බවත්, මන්ද පාසලින් ඉවත් වූ පසුව ත්‍රීවීලර් රථයක් අතට ගෙන තරුණ ජවය එය තුලට කොටු වන බවත් ප්‍රකාශ කරන ලදී.ලෝකයේ විශාල ලෙස ලංකාවේ නිපුණතාවයක් තිබෙන ශ්‍රම බලකායට ඉල්ලුමක් තිබෙන බවත්,එයට අනිවාර්යයෙන්ම උසස් අධ්‍යාපනයට නොයන දරුවාට පාසලින් ඉවත් වන විට වෘත්තීය පුහුණුවක් ලබා දීමට අනිවාර්යය නීතියක් ගෙනා යුතු බවත්, ඔවුන්ට ලෝකයේ පිළිගත් NVQ level සහතිකයක් පරිනමා ඒ සඳහා යොමු කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

අද වන විට අම්මාවරුන් නොව තරුණ දරුවන්,සැමියාව මැද පෙරදිග රටවල සේවයට යැවිය යුතු බවත්,මේවා සියල්ල වෙනස් කල යුතු බවත්, පාර්ලිමේන්තුවෙන්ද මේවා වෙනස් කල යුතු බවත්,එයින් බැරිනම් වෙන්නප්පුවේ පුංචි පාර්ලිමේන්තුවෙන් හෝ ඒ සඳහා ආරම්භයක් තබමුයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදි.රටේ නිදහස් අධ්‍යාපනය ලබා විදෙස් සේවයට යන පිරිසට උණ්ඩියල් ක්‍රම හරහා නොව නියම ලෙස රටට ඩොලර් ලැබෙන ලෙස නීතියක් අනිවාර්යය කල යුතු බවත්,අරගල කර මෙම රට සැදිය නොහැකි බවත්,අරගලය තුළින් එක් ඩොලරයක් හෝ ලංකාවට නොගෙන ආ බවත්, ලංකාවේ හදවතේ ලෝකයේ පිළිගත් සංචාරක ව්‍යාපෘතියේ හදවත මාස ගාණක් එහි අරගල කල බවත් ප්‍රකාශ කරන ලදී.

මත්ද්‍රව්‍යය සඳහා අබිබැහි වූ පිරිස හඳුනාගත යුතු බවත්, කෙසේ කටයුතු කලද හැදෙන්නේ නැති පිරිසක්ද රටේ සිටින බවත්, පළමු වතාවට ඇඟිලි සලකුණු ගෙන දඩ ගසා යැවිය යුතු බවත්, දෙවන වරද කරන අවස්ථාවේදී මාස 06ක් වසරක් ලෙස පුනරුත්තාපන කාලයක් ලබා දිය යුතු බවත්,එහිදී අනිවාර්යයෙන් ඔවුන්ව රැකියාවට දමා පවුලේ සාමාජිකයින්ට එම වැටුප යැවිය යුතුයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.මත්ද්‍රව්‍යය භාවිතා කිරීමට කෙනෙකු නොමැති වූ විට එය ගෙන්වීමද අඩුවන බවත්,අප ප්‍රදේශයේ මත්ද්‍රව්‍යය ඉතාමත් සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන බවත්,තරුණ දරුවන් ආරක්ෂා කර ගැනීමට විශාල සටනක් තිබෙන බවත්, යෝජනාවක් ලෙස මෙය ඉදිරිපත් කරන බවත් අදාල ව්‍යාවස්ථා කෙටුම්පත් මණ්ඩලය වෙත,නීතිපති දෙපාර්තමේන්තුව වෙත,කැබිනට් මණ්ඩලය වෙත මේවා යොමු කරන ලෙසටද ඉල්ලා සිටිමින් තම කතාව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව, පළමුව 2023 වර්ෂයේ අයවැය කෙටුම්පතට සුභ පැතුම් එක් කරන බව ප්‍රකාශ කරන ලදී. බණ්ඩිරිප්පුව මොන්ටිකාලෝ ක්‍රීඩාංගණය සංවර්ධනය කර දෙන ලෙසට තමන් ගරු සභාපතිතුමාගෙන් පුද්ගලිකව සෑම විටම ඉල්ලීමක් කල බවත්, එහි ක්‍රීඩා කිරීම අපහසුතා තිබෙන බවත් නමුත් ඒ සඳහා ලබන වසරේ මුදලක් වෙන් කර නොමැති බවත්, එය මොනයම් මුදලකින් හෝ සංවර්ධනය කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.මේ වන තුරු මන්ත්‍රීවරයෙකුට ලැබෙන වරප්‍රසාධ වලට අමතරව රුපියලක්වත් විශේෂ වරප්‍රසාධ බණ්ඩිරිප්පුව කොට්ඨාසයට ලැබී නොමැති බවත්,මෙය පමණක් ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම බණ්ඩිරිප්පුව දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය වෙනුවෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව මඟින් සිදු විය යුතු යටිතල පහසුකම් සියල්ලම ගරු සභාපතිතුමා ඉතාමත් හොඳින් සිදු කර දුන් බවත් දේවස්ථානයෙන් ස්තුතියක් නොකලද තමන් පෞද්ගලිකව ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සහයෝගය ලබා දුන් සියළුම කාර්ය මණ්ඩලයටද,කොට්ඨාසය භාර මන්ත්‍රීවරයා ලෙස ස්තුතිය පුද කරමින්,2023 වර්ෂයේ අයවැයට නැවතත් සුභ පැතුම් එක් කරමින්ද තම කතාව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා,ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව,2023 අයවැය වෙත තම සුභ පැතුම් එක් කරන ලදී. ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනි කුමාර් මහතා අදහස් ඉදිරිපත් කල බවත් තමන් එතුමා සිතනා තැන එනම් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව කිසිවක් නොකරනවා යැයි පවසන තැන නොමැති බවත් එමෙන්ම ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා අදහස් ඉදිරිපත් කල බවත් එතුමා පවසන තැනද තමන් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව යනු පාසල් යන කාලයේ පටන් හොඳින් දැනුන ජීවිතයේ ආරම්භයේ සිට අවසානය දක්වා බොහෝ සේවා සැපයෙන ආයතනයක් බවත් ප්‍රකාශ කරන ලදී. යම් යම් කාල වල සාධනීය තත්ත්වයක් දක්නට ලැබෙන බවත් යම් ක්ෂේත්‍ර වල කඩා වැටීම් දක්නට ලැබෙන බවත් යම් විට තමන් පවසන දේ වැරදි වීමටද හැකි බවත් තමන් පවසනුයේ තමන්ට හැඟෙන පරිදි යැයිද ප්‍රකාශ කරන ලදී.

අයවැය ප්‍රකාශනයේදී ඉදිරිපත් වූ බොහෝ අදහස් ඇතුලත රටේ සමස්ථය ගැන කියවෙන බවත්,ලංකාවේ විවිධ ආයතන සෑදුව බවත් මධ්‍යම ආණ්ඩුව තිබෙන බවත්,සමෘද්ධි පිළිබඳ කතා කල බවත් ලංකාවේ දිළිඳුකම පිටුදැකීමේ වැඩ කටයුත්ත වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට කිරීමට නොහැකි බවත් ඒ සඳහා සමෘද්ධි හා දිළිඳුකම පිටුදැකීමේ අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය කටයුතු කල බවත්,පරිසර සම්බන්ධව අපට වැඩ කටයුත්තක් තිබෙන බවත් පණතේ ඒ පිළිබඳ පැහැදිලිව පෙන්නුම් කර තිබෙන බවත් කසළ කළමණාකරනය වැනි ප්‍රාදේශීයව අප බල ප්‍රදේශයට බලපාන ගැටළු තිබෙන බවත් ගිං ඔය ,වෙරළ වැනි දෑ රේඛීය අමාත්‍යාාංශ වලට යා යුතු වැඩ කටයුතු බවත් ප්‍රකාශ කරන ලදී. පළාත් සභා තිබෙන බවත් , පළාත් පාලන ආයතන වලට පණතේ මංමාවත් ,කසළ වැනි ප්‍රමුඛ සේවා බෙදා දී තිබෙන බවත්,ඒවා සිදු කල පසුව අමතරව කොටස් කීපයක්ද බෙදා දී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. තමන් සිතනා පරිදි සභාවත් ලෙස අපි මෙම ආයතනය යනු කුමක්ද? අපට පැවරී තිබෙන කාර්යභාර්ය කුමක්ද? යන්න සිතා බලා කටයුතු කල යුතු බවත්, පන්සාලේ ,පල්ලියේ කටයුතු,පොත් බෙදීම ආදී සියළු කාරනා සමඟ අපගේ ආදායම පිළිබඳව ද සිතා බැලිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.ස්වයං උත්පාදිත ආදායම් හා ව්‍යවස්ථාපිත ආදායම් අපට තිබෙන බවත්, ව්‍යවස්ථාපිත ආදායම් ගැනීමට ගරු සභාපතිතුමා අවශ්‍ය නැති බවත් බදු,උසාවි දඩ ප්‍රාදේශීය සභාවට නොව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවන බවට රජයේ චක්‍රලේඛනයක් ගැසුවොත් එය අපට නොලැබෙන බවත් එබැවින් ස්වයං උත්පාදිත ආදායම් පිළිබඳ සිතා අප එයට වැඩි නැඹුරක් දැක්විය යුතුයැයි තමන් විශ්වාස කරන බවත් ප්‍රකාශ කරන ලදී.
2023 වර්ෂය ඉතා සුන්දර වර්ෂයක් වේයැයි තමන් නොසිතන බවත්,2023 වර්ෂයේත් කෝටි 39 ක ආදායමක් සහ කෝටි 39 අසූහත් ලක්ෂ අනූ අට දහක වියදම් හා විසිහතර දහසක අතිරික්තයක් පෙන්නුම් කර තිබෙන බවත්, මෙම ඉලක්කයට යාම ඉතාම අපහසු කාරණාවක් බවත්,මෙම ඉලක්කයට යාම ඉතාම අපහසු කාරණාවක් බවත්,ප්‍රකාශ කරන ලදී. ලැබී ඇති ආදායම් වියදම් විශ්ලේෂණ සලකා බැලීමේදී අගෝස්තු මස 31 වන දින වන තෙක් ලැබී ඇති බවත්,රටේ ඇති වූ කොවිඩ් - 19 තත්වය,තෙල් හා අනෙකුත් ද්‍රව්‍ය වල මිල ගණන් වැඩි වීමත් සමඟ පුනරාවර්තන වියදම් වැඩි වන බවත් ඒ්වා සමඟ අයවැයට යාමට නොහැකි වී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. මුදල් වල වටිනාකම 2022 දී කෝටි 39 යනු 2023 වන විට කෝටි 80 පමණ විය යුතු බවත්, මෙම වසරේ රුපියලින් කල දේ ලබන වසරේදී කල නොහැකි බවත් එය ලෝක ආර්ථිකයේ වෙනස් වීමත් සමඟ සිදු වූ දෙයක් බවත්, එම තත්ත්වයට මුහුණ දීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.තමන් මෙහිදී කිවීමට උත්සහ කරනුයේ අයවැයහි අන්තර්ගතය ,

ඉලක්කම් ගැන, ඒ ඉලක්කම් තුල මන්ත්‍රීවරුන් සිටින අමාරුකම ගැන පිළිබඳ බවත්,යෝගියාන කොට්ඨාසයට ක්‍රීඩාපිටියක් මිලදී ගැනීමට 2022 අයවැයෙහි ඇතුලත් කර තිබෙන බවත්, නමුත් එ්වා ගැන කෙදිනකවත් තමන් කතා නොකල බවත් මන්ද ප්‍රාග්ධන වියදමක් ලෙස ඉඩමක් මිලදී ගැනීමට ලක්ෂ 150 ක් පමණ වියදම් කිරීමට මෙය සුදුසු කාලයක් නොවන බව තමන් සිතනා බවත් ප්‍රකාශ කරන ලදී. 2022 අයවැයේදී කෝටි 39 ආදායමක් අපේක්ෂා කරන බවත්,අගෝස්තු 31 වන විට රු.122,731,510.61 අපේක්ෂිත ආදායමින් 31% පමණක් උපයා ඇති බවත් ඉතිරි මාස 3 තුල 69% සොයාගත යුතු බවත්, එය සිදු කල නොහැකි බවත් ,නමුත් වියදම ලෙස 48% ක්ම රු.191,782,304.01 ආදායමක් නොමැතිව වියදම් කර අවසන් බවත් , ආදායම කෝටි 12 වියදම කෝටි 19 ක් බවත් ,ස්ථාවර තැන්පත් හෝ ලබා ගෙන සංචිත භාවිතා කර කෝටි 10 කට ආසන්න පෙර මුදල් කීපයක් ලබාගෙන තිබෙන බවත්,පසුගිය දිනවල අයවැය සඳහන් වී නොමැති දේවල් වලට ගෙවීමේදි අදහස් ඉදිරිපත් කල බවත්,කෝටි 10 පමණ උපයපු නැති මුදලක් වියදම් කර තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.
ගෙවීම් නොකල ගෙවීම් කල යුතු බිල්පත් තිබිය හැකි බවත්,ඒවා වාර්තාවල පෙන්නුම් නොකරන බවත්,ගරු සභාපතිතුමාගේ කමිටු සභාපතිතුමාලාගේ අවධානය ඒ සඳහා යොමු බවත් ප්‍රකාශ කරන ලදී.
වැටුප් පිළිබඳ සලකා බැලීමේදි කෝටි 12 ක් උපයා ඇති බවත් නමුත් අගොස්තු 31 වන විට කෝටි 10 ක් පමණ මුදලක් වැටුප් ගෙවා ඇති බවත් ආයතන පද්ධතිය ස්ථාපිත කිරීමේදි බලාපොරොත්තු වූ අරමුණ එය නොවන බවත්, මේ සඳහා ගරු සභාපතිතුමාගේ විශේෂ අවධානය යොමු කරන ලෙසත්,රටේ තත්ත්වයද එයට බලපාන්නට ඇතැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

සභාවේ මුදල් පිළිබඳව එනම් අපගේ අත ඉතිරි මුදල,ඉතිරි කිරීමේ මුදල,ස්ථාවර තැන්පතු,අණ්ඩුවෙන් ලැබිය යුතු මුදල්,අපට ගෙවීමට තිබෙන මුදල් ආදිය පිළිබඳ තොරතුරු ලබාදෙන ලෙසත්,එවිට ස්වයං උත්පාදිත ආදායමක් නොමැතිව අපට යා හැකි දුර පිළිබඳ පෙනේවි යැයිද,ඉන්පසුව ප්‍රාග්ධන වත්කම් විකිණීමට සිදුවේයැයිද ප්‍රකාශ කරන ලදී.වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව කාලයක සිට ජනතාවට සහයෝගය දෙන බවත්, අඩුපාඩු සිදුවුවද එ්ම කටයුතු සිදුවන බවත්, සෑම විටම මහ සභාවේ කටයුතු වලටද සහයෝගය ලබා දී තිබෙන බවත්,යම් අවස්ථාවල විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුටත් එහා ගොස් මතවාදී ගැටළුද ඇති වී ඇති බවත් මන්ත්‍රීවරුන් බලයට පත්කල ප්‍රජාවක් සිටින බවත්, එම ජනතාවගේ අභිලාශයන් ආරක්ෂා කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී. රටේ ආර්ථිකයට වී තිබෙන දෙය සභාවේ ආර්ථිකයට සිදු වී නොමැති බැවින් එම ගැටළු තවමත් ලිහා ගැනීමට හැකි බවත්,එම මහපෙන්වීම ලේකම් මහතාගෙන්ද බලාපොරොත්තු වන බවත් මන්ද කෝටි 10 ක් 12 ක් වසරක් ගානේ ඇති වුවහොත් ප්‍රශ්නය විසඳන්නේ කෙසේද යන්න ගැටළුවක් මතුවන බවත් ප්‍රකාශ කරන ලදී. එබැවින් අයවැය ලේඛනය තුලම කටයුතු කරමුයැයිද, කෝටි 2 ක 3 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුනද, නමුත් කොට්ඨාසවල ප්‍රාග්ධන වැඩ කටයුතු බොහොමයක් සිදු වී නොමැති බැවින් අයවැය ගත නොවූ ප්‍රාග්ධන වැඩ සිදු කර ඇති බවත්,කුමන ඇස්තමේන්තු ගත්තද එය වියදම් කරන්නේ කෙසේද යන්න අර්බුදයක් පැන නැගෙන බවත් තම කොට්ඨාසයේ දම්මවිජය මාවතේ පළුදු ප්‍රතිසංස්කරණය ඇරුණු විට වෙනත් කටයුතු සිදු වී නොමැති බවත්, සිදු කිරීමට හැකි හොඳම කටයුත්ත ප්‍රාග්ධන වැය විෂය පුනර්වර්තන වලට මාරු කර ගැනීම බවත් ප්‍රකාශ කරන ලදී.ඉදිරි මාස කීපය සැලසුමකට අප සිටිනා තැන හඳුනාගෙන වැඩ කටයුතු කරමුයැයිද, ඒවා පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙසට ඉල්ලමින් අයවැයට සුභ පතමින් තම කතාව අවසන් කරන ලදී.

❖ ගරු මන්ත්රී සී.පී.සරත් වික්රමරත්න මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව 2023 වර්ෂයට අයවැය ඉදිරිපත් කරන මෙම මොහොතේදී 1991 සිට තමන් හා ආණ්ඩුපක්ෂයේ සිටින ගරු මන්ත්රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්රම මහතා මන්ත්රීධූරය හොබවන බවත්,1997 සිට ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා සිටින බවත්, එදා සිටම අයවැයක් පැමිණි විට විවාදයක් තබා සාකච්ඡා කර යම් ක්‍රමවේදයකට එය සිදු කල බවත්, අයවැය විවාදය සඳහා කාලයද ගත වන බවත්, පසුගිය වසරේ සිට චක්‍රලේඛයක් මඟින් එම ක්‍රමවේදය වෙනස් කර තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.1991 වර්ෂයේ ලැරින් පෙරේරා මැතිණියගේ සභාපතිත්වයෙන් රුපියල් ලක්ෂයකින් මෙම සභාව ආරම්භ කර අද ගරු සභාපතිතුමා ඉදිරිපත්කල අයවැය රු.398,822,000.00ක් බවත් තමන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස ආඩම්බර වන බවත් ප්‍රකාශ කරන ලදී.අප කතාවට ගිය විට සිදු වී ඇතිදේ සිදු විය යුතු දේ පවසන බවත්,එය ලෝක ස්වභාවය බවත් කෙතරම් කලද කෙදිනකවත් හොඳක් ඇසීමට සිදු නොවන සමාජයක අප ජීවත් වන බවත් එය වරදක් නොව ලෝක ස්වභාවය බවත් ප්‍රකාශ කරන ලදී.

තමන් උළු මෝල් හිමියෙකු බවත්,උළු 4000ක් පැටවූ පසුව වැඩිපුර උළුකැට 5ක් දමන බවත් නමුත් කෙදිනකවත් වැඩිපුර උළුගැන නොව ඒජන්සිකරු කැඩී ඇති උළු ගැන කතා කරන බවත් එය සමාජයේ හැටි බවත් ප්‍රකාශ කරන ලදී.1991 වර්ෂයේ තමන් පැමිණිමේදී වෙන්නප්පුවේ තාර පාරවල් ඉතාමත් අල්ප ප්‍රමාණයක් තිබූ බවත්,කොළින්ජාඩිය ගතහොත් තම නිවස දෙපසද බොරළු පාරවල් තිබූ බවත්, නමුත් අද වන විට දියුණුවක් ලබා ඇති බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.ප්‍රශ්න තිබෙන බවත්,කිසිවෙකු ඒවා පිලිබඳව කතා නොකර සිදු වූ අඩුව පිළිබඳව කතා කරන බවත්,එම නිසා ලංකාවට අද වන විට මේ තත්ත්වය උදා වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.ගරු කල යුත්තාට ගරු කල යුතු බවත්,පිදිය යුත්තාට පිදිය යුතු බවත්, පිළිගතයුත්තාව පිළිගත යුතු බවත් ප්‍රතික්ෂේප කල යුත්තාව ප්‍රතික්ෂේප කල යුතු බවත් නමුත් ප්‍රතික්ෂේප කරන පුද්ගලයාව පිළිගන්නා බවත් එවැනි කාල වකවාණුවක ගරු සභාපතිතුමාගේ දෙවැනි ධූර කාලය තුළ අතිරික්ත අයවැයක් ඉදිරිපත් කිරීමට වාසනාව ලැබීම පිළිබඳ සතුටු වන බවත් ප්‍රකාශ කරන ලදී.ඌණතාවයක අයවැයක් කෙදිනකවත් ඉදිරිපත් වී නොමැති බවත්,අයවැය කතාවලදී අයවැයට සාපේක්ෂව කතා කරන ලෙසත් දෝශාරෝපණයක් නොව චෝදනාවක්ද නොවන බවත් නමුත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා පමණක් අයවැයට සාපේක්ෂව කතා කල බවත් නවක මන්ත්‍රීවරුන් මෙහි සිටින බවත් ඉලක්කම් හසුරුවන ආකාරය පිළිබඳව තර්ක කලයුතු බවත් ප්‍රකාශ කරන ලදී.

2023 වර්ෂයේදී රු.398,822,000.00ක ආදායමක් යෝජනා කර තිබෙන බවත්,2022,2021 වර්ෂයේ ගණන් බලා එය සකසනමුත් මෙම යෝජිත ආදායම නොලැබෙන බවත්, ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා පැවසූ පරිදි අගෝස්තු මාසයේ තිබෙන දේ බැලූ විට පුනරාවර්ථන ආදායම රු.122,731,510.61 ක් තිබෙන බවත්,ලේඛණ සියල්ලම එවා ඇති බවත්,අගෝස්තු මාසය වන විට රු.191,782,304.01 ක් වියදම් කර තිබෙන බවත් මෙහිදී වියදම් කර තිබෙන්නේ මොනවාද යන්න විමසා සිටින ලදී.

1987 වර්ෂයේ ප්‍රාදේශීය සභා පණත පිළිගන්වන විට එම පණතේ ව්‍යවස්ථාපිත ආදායමට ඉඩම් කට්ටිකිරීමේදී මුද්දර සල්ලි වල ආදායම පිළිබඳ සඳහන් වන බවත්,එමඟින් විශාල ආදායමක් ලැබෙන බවත්,53% පමණ ලැබෙන බවත්, මෙම වර්ෂයේදී අපේක්ෂිත ආදායමට අඩුවෙන් ලැබී ඇති බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.පණතේ එය සඳහන් කර ඇති බැවින් කෝටි 09 ස්ථාවර තැන්පතු වල දැමීමට හැකි වී ඇත්තේ එම නිසා බවත් ප්‍රකාශ කරන ලදී.

මේ වන විට කෝටි 10ක් ස්ථාවර තැන්පතු වල දමා තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අද රටේ තිබෙන තත්ත්වය,ලෝක ආර්ථිකය බැලීමේදී වියදම් කිරීමට අපහසු වී ඇති බවත්,ආදායම් ප්‍රභවය කෙසේ වේදැයි නොදන්නා බවත්, උත්පාදිත ආදායම කෙලෙස වැටෙයිදැයි නොදන්නා බවත්, බදුකුලී ආදායම්,ස්වභාවධර්මයේ ව්‍යාසනයන් කෙලෙස ඇතිවේදැයි නොදන්නා බවත්,ඩීසල් 300% කින් පමණ වැඩි වීඇති බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. මන්ත්‍රීවරුන් ලෙස ඉවසීමෙන් හිඳ පරිත්‍යාගශීලිව මෙම ගමන යායුතු බවත් ප්‍රකාශ කරන ලදී.වැටුප් හා වේතන වෙනුවෙන් රු.169,414,000.00 ක මුදලක් සඳහන් කර ඇති බවත්,ස්ථිර සේවක වැටුප ප්‍රතිපූර්ණය වන බවත්,ප්‍රතිපූර්ණය නොවන මුදලේ ගැටළු තිබෙන බවත් එය අඩුකර ගැනීමට හැකි නම් හොඳ බවත්,මේ පිළිබඳ තමන් නිතරම කතා කරන බවත්, වියදම් පාර්ශවය සීමා කර ගැනීම සම්බන්ධව කතා කලයුතු බවත් ප්‍රකාශ කරන ලදී.2023 වර්ෂයේදී රු.කෝටි 9 වැටුප් හා වේතන සඳහා 43% 44% පමණ යන බවත්,එය අවම කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කර ගත යුතුයැයිද ප්‍රකාශ කරන ලදී.වැටුප් ප්‍රමාණය සේවක සංඛ්‍යාව පාලනය කර ගැනීම පිළිබඳව සිතා බැලීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙය චෝදනාවක් නොව ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතාද මේ පිළිබඳව කතා කල බවත්,බොහෝ සේවකයින් වැඩ නොකරන බවත්,කිරිමැටියාන පිළිබඳ ලොකු චෝදනා තිබෙන බවත්,සේවකයින් 90%කට වඩා පොත අත්සන් කර ගියද වැඩ නොකරන බවත් එය පරීක්ෂාවට ලක් කරන ලෙසත් එසේ වීමට ඉඩ ලබානොදෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.වැටුප් ගෙවන බවත්,රු.100න් කිරීමට තිබෙන කටයුත්තට රු.500ක් පමණ අප නොදැනුවත්වම ගොස් ඇති බවත්,එය පරිපාලනය කර ගැනීමට සිදු වන බවත් මුදල් කමිටුවේදීද තමන් නිතරම කතා කරන පරිදි ද්‍රව්‍යය මිලදී ගැනීමේ ක්‍රියාවලිය ඉතාමත් අසාර්ථක බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.ගරු සභාපතිතුමා,උපසභාපතිතුමා ජේෂ්ඨ මන්ත්‍රීවරුන් අත්සන් කර තමන් වෙත පැමිණීමේදී ඒවායෙහි අඩුපාඩු තමන් පෙන්වා දෙන බවත් එය සිදු කරනුයේ තරහාවකට නොව නිවැරදි දේ කිරීමට අවශ්‍ය නිසා

බවත් ප්‍රකාශ කරන ලදී.නිලධාරීන්ද ඒවා දන්නා බවත් ඒවා වෙනස් විය යුතු බවත්,තමා තමාට,සමාජයට,ගන්නා වැටුපට අවංක නොවුනහොත් මෙම රටවත් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවවත්,තමාවවත් ගොඩ ගැනීමට නොහැකි වන බවත් ප්‍රකාශ කරන ලදී.ගරු සභාපතිතුමා දරණ උත්සාහයට,ඉන්ධන ප්‍රශ්නයත් සමඟ ගරු සභාපතිතුමාගේ කාර්යක්ෂමතාවයට විපක්ෂයක් ලෙස ස්තූතිවන්ත වන බවත්,විපක්ෂය ලෙස කිසිදු දෙයකට විරුද්ධ වී නොමැති බවත්,සාධාරණය තුල විරුද්ධවිය යුතු දේට විරුද්ධ වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

සියළු දෙනාම එකතු වී උත්පාදිත ආදායම වැඩිකර ගැනීමට කටයුතු කරමුයැයිද, 2008දී හිටපු සභාපති ට්‍රෙවින් ප්‍රනාන්දු මහතා වරිපනම් බදු සීමා දික් කිරීමේ ගැසට් පත්‍රය ප්‍රකාශ කල බවත්, අද වන විටත් එය තවමත් කර ගැනීමට නොහැකි වූ බවත්, එතැන මන්ත්‍රීවරුන් පවසන ප්‍රමාදය තිබෙන බවත්,පසුගිය මහා සභාවේද කතා කල දංකෙ ාටුව වෙළඳ සංකීර්ණය පිළිබඳව වසර 3ක පමණ සිට කතා කරන බවත්,ස්ථාන පරීක්ෂාවද සිදු කල බවත් එවැනි කටයුත්තක් සිදු කර ගැනීමට හොහැකි වීම අප සියළු දෙනාගේම අඩුපාඩුවක් බවත්,ඒවාට උත්තර බඳින ලෙසත් ඒවායින් ආදායම් ලබා ගැනීමට හැකි බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ශ්‍රී ලාංකිකයෝ වශයෙන් මේ අපේ රට අපේ ප්‍රාදේශීය සභාව අපේ දරුවන්ට දායාද කරන අපේ ගම දරුවන්ට හොඳ තැනක් ඉතිරි කිරීමට මන්ත්‍රීවරුන් ආදර්ශමත් වන ලෙසත්,"ඔබා දෙනු පරහට-තමා සම්මතෙහි පිහිටා සිට!" ඇඟිල්ල දික්කල යුතු පිරිසක් සිටින බවත් නමුත් තම ප්‍රතිපත්තිය වන සෑම කෙනෙකුගේම පමණක් කියන බවත් වැරදි දේ අඩුවෙන් කියන බවත් නරක 70%ක් හොඳ 30%ක් තිබියද හොඳ පිළිබඳව පැවසුවහොත් නරක 69%ක් හෝ වන බවත් ප්‍රකාශ කරන ලදී.තමාට බලය ලැබුණායයි කියා අනවශ්‍ය ක්‍රියාමාර්ග වලට නොඑළඹෙනලෙසත්,ඒවායෙහි පලවිපාක ඇහැට දැක ඇති බවත්,සියළු දෙනා එකතු වී අඩුපාඩු සකසා ගෙන වැඩ කටයුතු කරමුයැයිද, පරිපාලන,මුදල රෙගුලාසි අනුව වැඩ කටයුතු කරමුයැයිද ,පසුවිපරම් කල යුතු වැඩ හැකි ඉක්මනින් කරන ලෙසත් ගරු සභාපතිතුමාට පවසා සිටින ලදී.මුදල් කමිටුවේ,කර්මාන්ත කමිටුවේ ගත් තීන්දු තීරණ ක්‍රියාත්මක කරමුයැයිද, මන්ත්‍රීවරුන් යම් විට දෝශාරෝපණය කරන බවත්,ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතාද නිතරම කතා කරන බවත් එවැනි අඩුපාඩු නොකරන ලෙසත් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

අප අඳුරු යුගයක සිටින බවත්,විවේචනය කරමින් නොසිට සියළු දෙනා අත්වැල් බැඳගෙන කටයුතු කරමුයැයිද, අඩුපාඩු සකස් කිරීමට විපක්ෂයද සහය වන බවත්,ලිහිරියාගම පොලට වූ දෙය පිළිබඳව ලොකු දුකක් හිතේ තිබෙන බවත් එහි චෝදනාව කිසි දිනක තමන් සිතින් ඉවත් නොකරන බවත් එහි පල විපාක ඉදිරියේදී ලැබේවියැයිද,එය විශාල වරදක් බවත්,නිලධාරීන්ද හෘද සාක්ෂියට එකඟව කටයුතු කර නොමැති බවත්, ලක්ෂ 200 පමණ එයට වියදම් වූ බවත්,දේශපාලනික වශයෙන් තීන්දු නොගන්නා ලෙසත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. තමන් සීනෝර් ජනපදයට සීට්ටු ක්‍රමය යටතේ වැසිකිලි 1680 සාදා දුන් බවත් අද ඒ ජනපදයට යාමටවත් නොහැකි බවත්,අත්දැකීම් වලින් කතා කරන බවත් ඡන්දය බලාගෙන කටයුතු නොකර හරි දේ කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.තමන්ගේ දරුවන්ට සිටීමට රටක් ඉතිරි කරන ලෙසටද ඉල්ලා සිටින ලදී.තමන්ට ආඩම්බරයක් දැනෙන බවත්,ජනතාවට සේවයක් කර,හරිදේ කර,මහජන මුදල් ආරක්ෂා කර දී තිබෙන මන්ත්‍රීවරයෙකු ලෙස ආඩම්බර වන බවත්,මෙහි සිටින කණ්ඩායමට දුර ගමනක් යා හැකි බවත්,ආදර්ශයක් ගන්නා ලෙසත්, මේවා ඉගෙන ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.අතිරික්ත අයවැයට සුභ පැතුම් එක් කරන බවත්, විපක්ෂයේ සහයෝගය ලබා දෙන බවත්,වැඩ කල් නොදමා සිදු කරමුයැයිද ගන්නා තීන්දු ක්‍රියාත්මක වීමට කල් ගත වන බවත්, නව වර්ෂයේදී ඒවාද නිවැරදි කර ගනිමුයැයිද එහිදී නව ලේකම්තුමෙකු සමඟ කටයුතු කිරීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.තමා තමාට,පවුලට,දරුවන්ට ආදරය කල යුතු බවත් නමුත් ලැබෙන මුදලට ආදරය නොකල යුතු බවත් ප්‍රකාශ කරන ලදී. ලෝකයේ සුන්දර රටක් වන ලංකාව නැති කර නොගන්නා ලෙසත්,දරුවන්ට අනාගතයක් පවතින රටක් ඇති කර ගැනීමට මුල් තැන පාර්ලිමේන්තුවටත් වඩා ප්‍රාදේශීය සභාවට තිබෙන බවත්,ගරු සභාපතිතුමාට පාර්ලිමේන්තු මන්ත්‍රී ඇමති කෙනෙකුටත් වඩා වැඩක් කිරීමට හැකි බවත්,පණතේ ශක්තිය එය බවත් මෙය උත්තරීතර ආයතනයක් බවත් ගරුත්වය රකිමින් සියළුම මන්ත්‍රීවරුන් අවංක වන ලෙසටද පවසමින්, ශක්තිය ධෛර්යය සියළුම දෙනා ලබාගෙන මහජනතාවට අවංකව සේවය කර ලැබෙන මුදල මහජනතාවට වියදම් කර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව ආදර්ශමත් ප්‍රාදේශීය සභාවක් කිරීමට ගරු සභාපතිතුමාට උපසභාපතිතුමාට සියළුම දෙනාට ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් තම කතාව අවසන් කරන ලදී.

❖ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව වර්ෂ 2023 ලෙස සභා ශාලාවේ ඇති ඡායාරූප පෙළේ අට වන සභාපතිවරයා ලෙස රු398,822,000.00ක ආදායමක්,රු398,798,000.00කවැය ශීර්ෂයක් බලාපොරොත්තුවෙන් රු24,000.00 ක අතිරික්තයක් තුළ ගරු සභාපතිතුමා ගරු මහා සභාවට අයවැය කෙටුම්පත සභාගත කල බවත්, මේ සියළු කාරණා තුලදී විපක්ෂනායකතුමාගේ කතාවට භාගයකට තමන් හවුල් වන බවත්, ඒ පිළිබඳ විපරම් නොකර දෛවයේ තීන්දුවකට සභාපතිධුරය හා විපක්ෂ නායකතුමාවද මෑත කාලයේදී කොළින්ජාඩිය ප්‍රදේශයට දුන් බවත් ඒ පිළිබඳ ඊර්ශ්‍යාවක් සිතේ නොමැති බවත් තමන් විපක්ෂනායකතුමා පිළිබඳව සතුටු වන බවත් ප්‍රකාශ කරන ලදී. 31 වන අයවැය ලෙස මෙම අයවැය සභාගත වන බවත්, ලැරින් පෙරේරා මැතිණිය හා ඩේවිඩ් ආතර් මැතිතුමාගේ කාලයේ වසර 4ක සභාව තිබූ බවත් එයටද දරදිය ඇදි පුද්ගලයෙකු ලෙස විපක්ෂ නායකතුමා හඳුන්වාදිය හැකි බවත්,පක්ෂ දෙකක සිටියද මිතුරුකමක් එතුමා සමඟ තමන්ට තිබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම පෝල් ප්‍රනාන්දු ලේකම්වරයා ලෙස වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයවැය ලේඛණයක් ඉදිරිපත් කරන අවසන් ලේඛණය මෙය වන්නට ඇතැයිද, ගරු ජනාධිපතිතුමා සේවා දිගුවක් නැවත ලබාදේයැයි තමන් නොසිතන බවත් එම නිසා ලේකම්මහතාට හා මෙම අයවැය කෙටුම්පත් කිරීමට වෙන්නප්පුව බල ප්‍රදේශයේ එක් ලක්ෂ පනස් දහසක් වූ ජනතාවගේ සුබවිහරණයට මෙය ගිණුම්ගත කිරීමට සහයෝගය ලබා දුන් ගිණුම් අංශයේ සියළුම දෙනාටද, ප්‍රධාන කමනාකරණ සේවා නිලධාරීතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටද ස්තුතිය පුද කරන ලදී.උත්පාදිත ආදායම වැය කිරීමට අප සභාවේ සිටිනවාද නැද්ද යන්න ප්‍රශ්නාර්ථයක් තිබියදී ගරු සභාපතිතුමා වෙන්නප්පුව බල ප්‍රදේශයේ පළමු පුරවැසියා ලෙස මහත්මා ගුණයෙන් යුතුව අද මෙම රාජකාරිය කර තිබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

1987 පණත ලෙස අපට කටයුතු කිරීමට තිබෙනුයේ පණතේ තිබෙන වගන්ති හා නීති රාමුව පමණක් බවත්,ඊට එහා මධ්‍යම රජයේ හා පලාත් සභාවේ විධි විධාන වලට යාමටවත් අපට නොහැකි බවත්, කමිටු අනුමත කර මහා සභාවට යොමු කර නැවත කොමසාරිස්වරයා වෙත හෝ ආන්ඩුකාරතුමා වෙත යන්නේද එම කාරණා සඳහා අවකාශය සලසා ගැනීමට හැකිදැයි අනුමැතිය ගැනීමට බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.එබැවින් අප සභාවට මුදල් වැඩි නිසාදෝ මේ සියළු ප්‍රශ්න යන්නත් වේලාවකට සිතෙන බවත් ආනමඩුව ,නවගත්තේගම වැනි සභාවලින් වෙන්නප්පුවේ එහෙම ඒවා වෙනවාද යන්න විමන බවත් එම නිසා වයඹ අභිමානය අභිමානවත් සභාපතිවරයා ලෙස ගරු සභාපතිතුමාට ඉතිරි වැඩ කටයුතුද මෙම මාස ත්‍රිත්වය තුළ සම්පූර්ණ කිරීමට ඉඩකඩ තිබෙන බවත් ප්‍රකාශ කරන ලදි.

ගිණුම් අංශය විසින් අගෝස්තු මස වාර්තා වල අපගේ ලැබීම් සාරාංශය රු139,612,303.59ක් ලෙස සඳහන් කර තිබෙන බවත්,වාර්තා වල ගණන් පැවසුවද අයවැය සකස් කලද ලැබිය යුතු මුදල් ජූනි මාසය ජූලි මාසය වන විට ලැබෙන බවත් පලාත් පාලනයේ ස්වභාවය එය බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.2023 වර්ෂය සාදන කෙටුම්පතේ මූල්‍ය සාරාංශයක් සාදන්නේ නම් එය වර්ෂයේ මැද සෑදිය යුතු බවත් මෙය මෙහි තිබෙන සැබෑම කාරණාව බවත් ප්‍රකාශ කරන ලදී. කොරෝනා වලින් ආරම්භ වූ අපහසුතාවයේ සිට මන්ත්‍රීවරුන් යම් යම් මත ඉදිරිපත් කලද අය කර ගැනීමට තිබූ බදු මුදල්ද ගරු සභාපතිතුමා නිදහස් කල බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා නිවැරදි බවත්, ව්‍යාපාරික ප්‍රජාවට අපහසුයැයි අප ප්‍රදේශයේ ජනතාවට අපහසුයැයි ඒවා ගරු සභාපතිතුමා සද්භාවයෙන් නිදහස් කල බවත් ප්‍රකාශ කරන ලදී.හිභයට යන විට ඒ සියල්ලම දරා ගැනීමට සිදු වන බවත්, අසීමිත වූ විදුලිබිල්, අසීමිත වූ ඉන්ධන මිල, වාහන අළුත්වැඩියා අමතර කොටස්, ලිපි ද්‍රව්‍යය සියළුම දේ එදා තිබූ අයවැය ලේඛණයට වඩා ඉක්ම ගොස් ඇති බවත් ප්‍රකාශ කරන ලදී. අප ස්වයංපෝෂිත බවත් එදින තීන්දුවක් ගෙන මෙම ගොඩනැගිල්ල ඉදි නොකලේ නම් අද මෙසේ රැස්වීම් තැබීමට ගොඩනැගිල්ලක් නොමැති බවත් දේශපාලන ඉහළ අධිකාරිය ගොඩ නැඟූ දේ අප සුරක්ෂිත කල බැවින් ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ සිට පුස්තකාල පද්ධතියේ නවීකරණ ආදී සියළුම දේ ආයුර්වේද,පෙරපාසල් ආදිය එමෙන්ම කර්මාන්ත කමිටුව, පරිසර කමිටුව ආදී කමිටු මඟින් සිදු කල සියළුම කටයුතු පොදු පහසුකම් කමිටුවේ සභාපතිතුමා විදුලි බල්බ මිල වැඩි වීමත් සමඟ අසරණ වන බවත් ඒ සියල්ල වැය මාරු කරමින් සභාවේ කටයුතු පවත්වාගෙන ගිය බවත් එමෙන්ම ක්‍රීඩා කමිටු සභාපතිතුමා ක්‍රීඩාංගන නවීකරණය හා එය පරිපාලනය කිරීමට දරන්නාවූ උත්සාහය එමෙන්ම ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා ඇතුළු උපදේශන කමිටු සාමාජිකයින්ගේ සහයෝගය ආදී සියළුම දෙනාගේ සහයෝගය තුළ මෙම ගමන පැමිණි බවත්,ඒවා අගය කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන්ම වයසින් අඩු පුද්ගලයෙකු ලෙස ගරු සභාපතිතුමා වාද විවාද දරාගනිමින් ඒ සියල්ලම

නිහතමානීව විද ගනිමින් කවුරුන් දොස් පැවසුවද නැවත ඔවුන් හා සමඟ එකතු වී සුහදත්වයෙන් වැඩ කරන පුද්ගලයෙකු ලෙස ගරු සභාපතිතුමාව හැඳන්විය හැකි බවත් එතුමාට එය පරම්පරාවෙන් ලැබුණු බවත් විශේෂයෙන්ම එය ගරු මිල්රෝයි ප්‍රනාන්දු ඇමතිතුමාටද තිබූ ගුණාංගයක් බවත් සිහිපත් කරන ලදී. එම අභාශය ගෙන සියළුම කටයුතු කිරීමට ගරු සභාපතිතුමා දක්ෂ වූ බවත් 2023 වර්ෂයේදී මෙම ගමන යාමට ගරු සභාපතිතුමාටශක්තිය ධෛර්යය ලැබේවායි විපක්ෂය සුභ පැතුවා සේම ආණ්ඩුපක්ෂයේ සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන්ලා සුභ පැතුම් එක් කරන බවත් පවසමින් යළිත් වතාවක් මෙම කාල සීමාව තුළ දුන් සියළුම සහයෝගයට ලේකම්තුමාටද ස්තුතිවන්ත වෙමින් තම කතාව අවසන් කරන ලදී.එමෙන්ම මෙම 2023 අයවැය සඳහා සියළුම දෙනාගේ එකඟතාවය ද පල කරන ලදී.

බෙදීමක් අවශ්‍යදැයි ගරු සභාපතිතුමා ගරු මහා සභාවෙන් විමසා සිටින ලදී.

අවශ්‍ය නොමැති බව ගරු මහා සභාව පැවසීමෙන් අනතුරුව 2023 වර්ෂයේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ අයවැය කෙටුම්පත සංශෝධනයද ඇතුළත්ව ඒකමතිකව සභා සම්මත විය.

| |
|---|
| තීරණ අංක 06<br><br>2023 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය සහිතව සභා සම්මත වන ලදී. |

ii. වෙන්නප්පුව බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් වල පාසල් දරුවන් සඳහා 2023 වර්ෂයට අදාලව මිලියන 10ක අභ්‍යාස පොත් ලබා දීම සුදුසු බවට යෝජනාව
ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

| |
|---|
| තීරණ අංක 06/i<br>රටේ පවතින වර්තමාන මිල ගණන් වැඩි වීම හේතුවෙන් අඩු ආදායම්ලාභී පවුල් වල දෙමාපියන්ට ශක්තියක් වෙමින්ද දරුවන්ගේ අධ්‍යාපන මට්ටම නංවාලීම අරමුණු කර ගනිමින්ද වෙන්නප්පුව බල ප්‍රදේශයේ පාසල් 42ක අඩු ආදායම්ලාභී පාසල් දරුවන් සඳහා කොට්ඨාස 25ම ආවරණය වන පරිදි එක් කොට්ඨාසයකට රු.400,000.00ක් බැගින් රුපියල් මිලියන 10ක පාසල් අභ්‍යාස පො ලබා දීම සුදුසු බවත් ඒ සඳහා වයඹ පලාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

Iii. දංකොටුව, සී.ජේ.මාවතේ ජයසිංහ ප්‍රොපර්ටි ඇන්ඩ් ක්‍රෙඩිට්(ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය මඟින් පිඹුරු අංක 7827 දරණ ඉඩම කට්ටි කර විකිණීමේදී සභාවට ලබා දිය යුතු 10%ක පොදු ඉඩම් කොටස සඳහා අඩුවෙන් ලබා දී ඇති පර්චස් 7.28ක භූමි ප්‍රමාණය සඳහා එම ඉඩමට පමණක් පෞද්ගලික වන සේ තක්සේරු වටිනාකම අයකර කට්ටි සැලැස්ම අනුමත කිරීම සඳහා මහා සභාවේ තීරණයක් ගෙන කටයුතු කරන ලෙස දන්වා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අංක වපපාදෙ/03/13/9/2021 පොදු(පුත්) හා 2022-07-11 දිනැති ලිපියේ උපදෙස් අනුව මහා සභා තීරණයක් ගැනීම සඳහා සුදුසු බව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය මහා සභාවේ නිවේදන යටතේ සිදු කල යෝජනාව බවත්,ඉඩමක් කට්ටි කිරීමේදී පොදු කොටසක් වෙන් කරන බවත්, එය පොදු භාවිතයට වෙන් කරන බැවින් මෙමඟින් මුදලක් ලබා ගත් විට එම පරමාර්තය එතැනින්ම බිඳී යන බව ප්‍රකාශ කරන ලදී. අයවැයෙහි සංඛ්‍යා ලේඛණ පිළිබඳව කතා නොකලේ කතා කර වැඩක් නොමැති නිසා බවත්, මෙම කාරණාව සම්බන්ධයෙන් එකඟවිය නොහැකි බවත්,මෙය මහා සභාවේ සම්මත කිරීමම ගැටළුවක් බවත්,යායුතු පටිපාටියෙන් සම්පූර්ණයෙන්ම බැහැර වී වරදක් සිදු කර ඇති බවත් එම ඉතිරි ඉඩම් කොටස ලබාගත නොහැක්කේ මන්දැයිද විමසා සිටින ලදී.

මෙම ඉඩම් කට්ටි සඳහා අනුමැතිය ලබා දීමට පෙර එහි ඉඩම් කොටස් අලෙවි කර තිබීම නිසා සභාවට වෙන් කල යුතු බිම් ප්‍රමාණය වෙන් නොකිරීම පිළිබඳ ගැටළුවක් වූ අවස්ථාවේ වයඹ පලාත් පාලන කොමසාරිස්තුමා වෙත මෙම ගැටළුව ඉදිරිපත් කිරීමෙන් පසු ඉහත අංක හා දිනැති ලිපිය මඟින් මෙම ඉඩම් කොටස් මිල දී ගත් පදිංචිකරුවන්ට ඉදිරියේදී ඇතිවිය හැකි ගැටළු පිළිබඳ සලකා ඉහත උපදෙස් අනුව සභා තීරණයක් ගෙන මෙම ඉඩම සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කරන ලෙස පලාත් පාලන කොමසාරිස්තුමා ලිඛිතව දන්වා ඇති බව ගරු සභාපතිතුමා පෙන්වා දෙන ලදී.

මෙම වැරැද්ද කලේ කවුදැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

මෙහි මුල් ඉඩම කොටස් දෙකට කඩා වෙන වෙනම විකිණීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉල්ලුම් කර තිබියදී එම ඉඩම් කොටස් දෙක වෙන වෙනම විකිණීම තුළ සභාවට ලැබිය යුතු 10% බිම් කොටස නොලැබී යන බව අනාවරණය වූ නිසා ලේකම්මහතා හා වැඩ අධිකාරී මහතා විසින් මේ පිළිබඳව පලාත් පාලන කොමසාරිස්තුමා වෙත කරුණු ඉදිරිපත් කර උපදෙස් ලබාගත් අතර මෙම දැනුම් දීම හරහා වයඹ පලාතටම අදාල වන සේ නව ක්‍රමවේදයක් සකස් කර මෙවැනි ඉඩම් කට්ටි වලින් ඒ ඒ කොටස සඳහ 10%ක බිම් ප්‍රමාණ සභාවට ලබා ගැනීම සඳහා කටයුතු කල යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.තවද අනුමැතිය ලබා දීමට පෙර මෙම ඉඩම් කොටස් කර අලෙවි කිරීමට කටයුතු කර තිබූ බැවින් සභාවට ලැබිය යුතු මුළු බිම් ප්‍රමාණයට පර්චස් 7.28 ක් අඩු කොටසක් සභාවට ලබා ගැනීමට ඉතිරි වී ඇති අතර ඉතිරි බිම් කොටස සඳහා තක්සේරු වටිනාකම ලබා ගැනීමට කටයුතු කරන ලෙස පලාත් පාලන කොමසාරිස්තුමා විසින් උපදෙස් ලබා දී ඇති බව නැවත සභාව දැනුවත් කරන ලදී.

සැලසුම් කමිටුවට එය පැමිණියේ ඉඩම විකුණුවාට පසුවදැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

මෙම ගැටළුව පළමුව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ඉදිරිපත් කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ආදායම් පරීක්ෂකවරුන්ට වැටුප් ගෙවන බවත්,මෙම ගැටළුව පිළිබඳව ඔවුන් දැන් නොසිටියේදැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

මෙය අනුමැතියට දැමීමේදී අප දුටු බවත්,සංවර්ධනය කිරීමට යෝජනාව දමන විට ඒ සඳහා අවසරය ලබා දෙන බවත් පසුව අනුමැතිය ලබා දෙන බවත් ගරුසභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කාරක සභාවක් තිබෙන බවත්, මෙම ඉඩම් කට්ටි කිරීම් සම්බන්ධයෙන් මෙම සභාවට කිසිඳු වාර්තාවක් පැමිණ නොමැති බවත්,කිසිවෙකුත් කුමන ඉඩමක් කට්ටි කලාදැයි නොදන්නා බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

එය කාරක සභාවට අයිති නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අවශ්‍ය ලිපිගොණු ගෙන එන තෙක් මෙම යෝජනාව කල් තබන ලදී.

(iv).පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීමට අදාලව අයවැයෙහි සඳහන් මුදල් ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

මෙය කියවීමේ මාසය බැවින් අයවැයෙහි සඳහන් මුදල ලබා දීමට යන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 07

පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීමට අදාලව අයවැයෙහි වෙන් කර ඇති මුදල් ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී.

(v). 2022-09-23 වන දින පැවති මුදල් කමිටුවේදී අනුමත කරන ලද 2023 වර්ෂය සඳහා බදු හා ගාස්තු පැනවීමට අදාල නිවේදනය ගැසට් මගින් ප්‍රසිද්ධ කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම පිණිස ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

තීරණ අංක 09

මේ පිළිබඳව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේද සාකච්ඡා කොට ඇති බැවින් 2023 වර්ෂය සඳහා වන බදු හා ගාස්තු නිවේදනයේ සඳහන් යෝජනා 11ක් සඳහා වෙන් වෙන්ව අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

**b. ගරු මන්ත්‍රී යෝජනා**

(i). දකුණු දුම්මලදෙණිය ශාන්ත නිකුලා දෙව්මැදුර අසලින් ඇති මාර්ගය අළුත්වැඩියා කර තාර දමා ගැලවී ඇති කොටස් ඉවත් කර දෙන ලෙසට ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව සඳහා ගරු මහා සභා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ඉදිරිපත් කරන ලදී.

තීරණ අංක 08

දකුණු දුම්මලදෙණිය ශාන්ත නිකුලා දෙව්මැදුර අසලින් ඇති මාර්ගය අළුත්වැඩියා කර තාර දමා ගැලවී ඇති කොටස් ඉවත් කර දෙන ලෙසට ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව එම යෝජනාව සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

(ii).2022 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි ගරු මන්ත්‍රීවරුන්/වරියන් විසින් ඉදිරිපත් කරඇති යෝජනා සංශෝධන සලකා බැලීම

තීරණ අංක 10

පහත සඳහන් ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කර ඇති 2022 වර්ෂයේ අයවැය යෝජනා සංශෝධනය කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී.

| අ/අ | ගරු මන්ත්‍රීතුමාගේ නම | කොට්ඨාසය | අළුත්වැඩියා කල යුතු මාර්ගය හෝ වැඩ විෂය |
|---|---|---|---|
| 01 | ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා | මොහොට්ටිමුල්ල | 1. ඉ/දුම්මලකොටුව මැන්රෝසා මාර්ගය ප්‍රතිසංස්කරණය<br>2. ප/දුම්මලකොටුව නෙවිල් ප්‍රියන්ත මාවත අලුත්වැඩියාව |

| | | | |
|---|---|---|---|
| | | | 3. ප/දුම්මලකොටුව සුනිල් මාවත අලුත්වැඩියාව<br>4. ප/දුම්මලකොටුව ඩෙක්ස්ටර් කොට් අළුත්වැඩියාව |
| 02 | ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා | උදාසිරිගම | 1. උදාසිරිගම 6වන මාර්ගය අළුත්වැඩියාව<br>2. පහලවත්ත මාර්ගය අළුත්වැඩියාව |
| 03 | ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා | බණ්ඩිරිප්පුව | 1. ගාලවත්ත ජනපද ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීම |
| 04 | ගරු මන්ත්‍රී කේ.එන්.සුදත් ජානක පෙරේරා මහතා | සිරිගම්පල | 1. ද/ලුණුවිල පන්සල් මාවත පිළිසකර කිරීම |
| 05 | ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා | කම්මල | 1. 481 සින්ද්‍රාත්‍රිය ග්‍රාම සේවා වසමේ සණස මාවතේ කෙළවරේ ඇති හැමිල්ටන් ඇල හරහා ඉදිකර ඇති දුම්රිය පෙට්ටි පාලමට බස් තහඩු යොදා පදිකයින්ට ගමන් කිරීමට හැකි වන ලෙස තාවකාලිකව සකස් කිරීම<br>2. 481/ඒ,අලුත්තොට ග්‍රාම නිලධාරී වසමේ කරීටාසෙඩෙක් ගම්මානයේ මාර්ගය ප්‍රතිසංස්කරණය |
| 06 | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා | යෝගියාන | 1. සිංගක්කුලිය දෙසින් දික්වෙල මැදගොඩැල්ල මාර්ග<br>2. යෝගියාන ධම්මවිජය මාවත ජංකුරාවෙල සුසාන භූමිය දක්වා<br>3. ජංකුරාවෙල දෙසින් කූනින් ඇළ පාර ද/ඇටියාවල දක්වා<br>4. ද/ඇටියාවල සමදරා ඇළ පාර හා නෙවිල් කරුණානායක මාවත |
| 07 | ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය | කහටවිල | 1. නැ/කහටවිල මහායායවත්ත අංක 02 ජනපදයේ ප්‍රධාන මාර්ගය අළුත්වැඩියා කිරීම<br>2. මැල්වත්ත දියවර ගම්මානයේ ක්‍රීඩා පිටියේ ඉදි කර ඇති නළළිඳ අළුත්වැඩියා කිරීම |

## 05. කාරක සහා වාර්තා සලකා බැලීම.

i. 2022.09.13 හා 2022.09.23 වන හා 2022-10-04 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සලකා බැලීම.

තීරණ අංක 11

2022.09.13 හා 2022.09.23 වන හා 2022-10-04 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ සහ ගරු මන්ත්‍රීනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

ii. 2022.09.02 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව සලකා බැලීම

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා මෙහිදී පවසා සිටියේ ගරු මන්ත්‍රීවරුන්ගේ වාර්තා ඉක්මනින් කමිටුව වෙත ලබාදෙන ලෙසයි.මන්ද අළුත් ක්‍රමවේදය තුළ ණයගිම් කල නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.

සම්මත වී ඇති යෝජනා වල වැඩ ආරම්භ කරන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත්කරු ලවා ඒවා ක්‍රියාත්මක කිරීම අපහසු වි ඇති බවත්,කෙසේ නමුත් ඒවා නිලධාරීන්ගේ වැඩකටයුත්තක් බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 12<br><br>2022.09.02 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ සහ ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

iii. 2022-09-29 පරිසර හා මහජන සෞඛ්‍ය පහසුකම් කාරක සභා වාර්තාව සලකා බැලීම

මෙම වාර්තාවේ අංක 06 බලන ලෙසත්,මෙම ගාස්තු අඩු කරමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එය අඩු නොකරන බවත්, තිබෙන ගාස්තුව සාධාරණ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සිරිගම්පල වලවල් බැඳීමට ඉඩ ලබා නොදෙන බවත්, සීල් තබා වල බැඳීම තුළ මාස 3න් පිරී යන බවත් ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී. පවුලක් තමා වෙත පැමිණි අවස්ථාවේදී ගරු සභාපතිතුමා වෙත යොමු කිරීමෙන් පසුව ගරු සභාපතිතුමා සහය වූ බවත් ඒ සඳහා ස්තූතියද පුද කරන ලදී. මෙහිදී සිරිගම්පලට පමණක් හෝ ක්‍රමවේදයක් සකසා දෙන ලෙසටද ඉල්ලා සිටින ලදී.

මේ සඳහා ග්‍රාම සේවක නිර්දේශයක් ලබා ගනිමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 13<br>2022-09-29 පරිසර හා මහජන සෞඛ්‍ය පහසුකම් කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

iv. 2022.09.12 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම.

| |
|---|
| තීරණ අංක 14 |
| 2022.09.12 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රීඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දිමස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

v. 2022-10-07 වන දින පැවති සංවර්ධන උපදේශක කාරක සභා වාර්තාව වාර්තාව සලකා බැලීම.

| |
|---|
| තීරණ අංක 15<br>2022.09.12 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ හා ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මහා සභාවේ ඒකමති අනුමැතිය ලබා දෙන ලදී. |

## 06.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.

**i. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය -2022 අගොස්තු**

**ii. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය -2022 අගොස්තු**

| |
|---|
| තීරණ අංක 16 |
| 2022 වර්ෂයේ අගොස්තු මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ 2022 වර්ෂයේ අගොස්තු මස ඒකාබද්ධ ගෙවීම් සාරාංශය පිළිබඳ වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය |

iii. 2022 සැප්තැම්බර් මස ඉන්ධන හා අළුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව සලකා බලන ලදී.

iv. 2022 වර්ෂයේ සැප්තැම්බර් මස වීථි පහන් නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව සලකා බලන ලදී.

## 07. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.

(i). ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ගරු සභාපතිතුමාගේ අවසර ගැනීමෙන් පසුව ලුණුවිල පාලම් දෙක අසල ලක්ෂ ගානක් වැය කර විදුලි බල මණ්ඩලයෙන් වයර් එකක් දැමූ බවත්, නමුත් මේ වන විට බල්බ 2ක් පමණක් පත්තු වන බවත්,ඉතිරි බල්බ 3 දැන් මාස 3කට වැඩි කාලයක සිට අක්‍රීය වී ඇති බවත් නමුත් එවැනි බල්බ වෙනත් ස්ථාන වල අළුත්වැඩියා කරනවා තමන් දැක ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ඊයේ දිනය තම කොට්ඨාසයේ අළුත්වැඩියා කටයුතු සිදු වන බැවින් වාහනයට දැනුම් දී තිබුණද එය සාදා නොමැති බවත් එම ප්‍රදේශයේ නිවෙස් නොමැති බවත්, දෙපස වෙල්දෙක තිබෙන බවත් ,ගරු සභාපතිතුමාට පැවසීමේදී කොට්ඨාසයේ ලයිට් හදන දිනයට සාදනවා යැයි පැවසුවද

ඊයේ සාදා නොමැති බවත්, ඒ පිළිබඳ තමන්ගේ අප්‍රසාධයද පල කරන ලදී. මෙය තම කොට්ඨාසයේ පමණක් නොව කිරිමැටියාන දෙසට යන ජනතාවගේද ගැටළුවක් බවත්,ඒ පිළිබඳ සොයා බලා කඩිනමින් කටයුතු කරන ලෙසටද ඉල්ලා සිටින ලදී.

(ii). ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව මැදිකැලේ බදු ඔප්පුව සභාගත කරන ලෙසට ඉල්ලීමක් කල බවත්, එය සිදු වී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. තම ඉඩමට යාව සභාවේ ඉඩමක් බදුගෙන පසුව දෙකම අල්ලා තාප්පයක් ගැසීමට හැකිදැයිද?විමසා සිටින ලදී.

එය එසේ කිරීමට නොහැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් මැදි කැලේ සිදු වී ඇත්තේ කෙසේද යන්න ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

එහි සම්පූර්ණ වාර්තාවක් ගෙන එන ලෙසට ආදායම් පරීක්ෂක මහතාට පවසා තිබෙන බවත් තවම වාර්තාව නොලැබුණ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ආදායම් පරීක්ෂක මහතාට දිනයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ලබන සතියේ කමිටුවට එය ඉදිරිපත් කරන බවත් අපේ ඉඩම ස්වාධීනව තිබීමට අවශ්‍ය බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

බදු ලබා දුන් ඔප්පුවක් තිබෙන බව පැවසූ බවත් එය සභාගත කර නොමැති බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

ගිවිසුමක් තිබෙන බවත්,එය සභාගත කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දංකොටුවේ ආයුර්වේදයේ ගාමිණීව හා තවත් නිලධාරියකුව මාරු කර තිබෙන බවත් මාරු කල පදනම කුමක්ද? යන්න ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා

සාමාන්‍යයෙන් පැමිණිලි කීපයක් පැමිණි විට ඒ පිළිබඳව සොයා බැලිය යුතු බවත්, එමෙන්ම කම්මල්පත්තුවේද ආයුර්වේදය දියුණු කර ගත යුතු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. නිලධාරින් අභ්‍යන්තර මාරුවට කිසිවෙකුගේ අනුමැතියක් අවශ්‍ය නොමැති බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

හේතුව විමසූ බවත්, මන්ත්‍රීවරයකුට එය ඇසීමට අයිතියක් තිබෙන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදි.

වසර ගණනාවක් එක් ස්ථානයට නොතබන ලෙස ඔබතුමන්ලාම පවසන බවත්,ස්ථාන මාරුවක් කරමත් එය ගැටළුවක් කර ගන්නා බවත්,සේවා අවශ්‍යතාවය මත මාරු කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම පැමිණිලි සභාගත කරන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ඉල්ලා සිටින ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව සේවකයින්ගේ අභ්‍යන්තර සථානමාරු හා සේවකයින්ගේ කටයුතු පිළිබඳ කතා කිරීමේදී එය විමසා ගරු සභාපතිතුමාව අපහසුතාවයට පත් කිරීම නොකල යුතු බවත්,පරිපාලන නිලධාරියා ලෙස ලේකම්වරයා එය සිදු කරන ලද බවත් ප්‍රකාශ කරන ලදී. මෙය සභාපතිතුමාට අදාල කාරණාවක් නොවන බවත්,පරිපාලන කටයුතු කරගෙන යාමේදී සේවකයින් සම්බන්ධ තීන්දු තීරණ කාගෙන් හෝ විමසා සිදු නොකරන බවත්,තමන් තීරණය කර සේවා අවශ්‍යතාවය අනුව තීරණ ගන්නා බවත්, ආයතනයේ සියළු නිලධාරීන් හා සේවකයින්ගේ ස්ථාන මාරු උසස් වීම් වුටුප් වර්ධක,විනය කටයුතු සියල්ල පැවරී ඇත්තේ ලේකම්වරයාට බවත්,එය වෙනත් කිසිඳු පාර්ශවයකට සිදු කල නොහැකි බවත් මෙම බලතල සියල්ල

ගැසට් පත්‍රයක් මඟින් ලේකම්වරයාට පවරා ඇති බවත් පැහැදිලි කරන ලදී.සියළුම සේවකයින් ස්ථාන මාරු වලට යටත් බව පත්වීම් ලිපියේම සඳහන් බවත්,එකම ස්ථානයක සේවය කල යුතු යැයි නීතියක් නොමැති බවත්,වරින් වර ස්ථාන මාරු කර සියළු කටයුතු සෑම සේවකයෙකුටම පුහුණු වීමට අවස්ථාව ලබා දිය යුතු බවත්, වැඩිදුරටත් පැහැදිලි කරන ලදී.

ඔහුට විරුද්ධව තිබෙන චෝදනා පිළිබඳව සභාපතිතුමාගෙන් විමසූ බවත් එය නැවතත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

චෝදනා කීපයක්ද තිබෙන බවත්,සියල්ලම සමඟ අභ්‍යන්තර මාරුව සිදු කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එකම සේවකයෙකු එකම ස්ථානයක වසර 10-15 සිටීම අවශ්‍ය නොවන බව ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් ආදහනාගාරයේ තුෂාර මහතා වසර ගණනාවක් එම ස්ථානයේ සිටින බව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

ආදායම් පරීක්ෂකවරුන් මාරු කල බවත්,බලයලත් නිලධාරීන් මාරු කල බවත්,ඊළඟ ගැටළුව තිබූ තැන ආයුර්වේදය බවත් එලෙස පරිපාලන කටයුතු කරගෙන යන බව ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.

(iii). ගරු මන්ත්‍රීනී අයි.එච්. නයෝමි රම්‍යලතා මහත්මිය ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව විදුලි අංශය පිලිබඳ කතා කිරීමේදී කහටවිල කොට්ඨාසයේ පොතුවටවන හා නැ/කහටවිල යන වසම් දෙකෙහි මරණ ගෙවල් දෙකක් සිදු වූ බවත්, ගරු සභාපතිතුමාගෙන් ෆ්ලෑෂර් දෙකක් ලබාදෙන ලෙසට ඉල්ලීමක්ද කල බවත් ප්‍රකාශ කරන ලදී. එතැනට ගොස් එම සේවකයින් එම නිවැසියන් එය එපායැයි පැවසූ බව පවසා නැවත පැමිණ තිබූ බවත්, එතැන සැඟවුන කාරණාවක්ද තිබෙන බවත් මරණගෙයක් සිදුවූ විට කොට්ඨාසයේ ජනතාව ෆ්ලෑෂරයක් හෝ බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී.එම අවස්ථාවේදී වංචා සහගත ලෙස කටයුතු කර තිබෙන බවත්,වැඩ කටයුතු සිදු කිරීමට ක්‍රමවේදයක් තිබෙන බවත්,අවමංගල්‍යයක් අවස්ථාවේදී ෆ්ලෑෂරයක් එපායැයි පවසන්නේ කවුරුන්දැයිද විමසා සිටින ලදී.නිවසේ අයිතිකරු සමඟ කතා කිරීමට තිබූ බවත්,එලෙස කූට ලෙස කතා කිරීමට සභාවේ සේවකයින්ට තිබෙන අවශ්‍යතාවය කුමක්දැයිද විමසා සිටින ලදී.

එය වැරදි අවබෝධයක් බවත්,එය ඉරිදා දින තමාට පැවසූ බවත්,ඉරිදා දින සේවකයින් නිවාඩු බැවින් සඳුදා යන විට මිනිය ගෙන අවසන් බවත් ,අනවශ්‍ය බව එතැන සිටින පුද්ගලයෙකු පවසන්නට ඇතැයිද, සේවකයින් නිවසේ අයිතිකරු කවුරුන්දැයි නොදන්නා බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය කිසිසේත් තමන් පිළිනොගන්නා බවත්,පැහැදිලිවම ඒ පිලිබඳව මිනිය ගෙන අවසන් බව ගරු සභාපතිතුමාට පැවසූ බවත්,විදුලි අංශයේ සේවකයින් එදින කණ්ඩායම් රැස්වීම අවස්ථාවේදී ගරු සභාපතිතුමාට ඒ පිළිබඳව දුරකථනයෙන් පැවසූ බව පවසන බවත්, එම රැස්වීමට තමන්ද සහභාගී වූ බවත් එසේ නම් ගරුසභාපතිතුමා තමාව එම අවස්ථාවේදී දැනුවත් කරන බවත් ගරු මන්ත්‍රීනී අයි.එච්. නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

එදින දුරකථන ඇමතුමක් පැමිණි බවත්, එපා කියන්නේ නම් ෆ්ලෑෂරය නොගසන ලෙසට තමන් පැවසූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මිනිසුන් දින හත යන තෙක් එය බලාපොරොත්තු වන බව ගරු මන්ත්‍රිනී අයි.එච්. නයෝමි රමාලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

අද දින ගසන ලෙසට තමන් පැවසූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙතැන ගැටළුවක් තිබෙන බව ගරු සභාපතිතුමා දන්නා බවත්,එසේ නම් මෙයට ක්‍රමවේදයක් සකස් නොකරන්නේ මන්දැයිද ගරු මන්ත්‍රිනී අයි.එච්. නයෝමි රමාලතා මහත්මිය විමසා සිටින ලදී.ජනතාව අපහසුතාවයට පත් වන බවත්,එවැනි දේ සිදු නොවීමට ඉඩ නොතබන ලෙසත්,එය සොයා බලන ලෙසත් ඉල්ලා සිටින ලදී.

(iv).ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා විසින් ඉදිරිපත් කර ඇති නොවැම්බර් මස විදේශ නිවාඩු ඉල්ලීමට අදාල ලිපිය සලකා බැලීම

| |
|---|
| තීරණ අංක 17<br><br>ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා විසින් ඉදිරිපත් කර ඇති නොවැම්බර් මස විදේශ නිවාඩු ඉල්ලීමට අදාල ලිපිය සලකා බැලූ ගරු මහා සභාව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී. |

(v). නැවතත් මින් පෙර කල් තැබූ ගැටළුව සම්බන්ධයෙන් සාකච්ඡාව ආරම්භ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මෙම කාරණාව සම්බන්ධයෙන් මේ වන විට බොහෝ සාකච්ඡා කර ඇති බවත්,2021/07/28 දින මෙම ඉඩම කැඩීමට ඉල්ලුම්පත්‍රයක් සභාවට පැමිණි බවත්,2021/08//03 වන දින ආදායම් පරික්ෂක නිලධාරීන් හා කාර්මික නිලධාරීන් ඉඩම පරීක්ෂා කර වාර්තාවක් ලබා දුන් බවත්,ඉන්පසුව 2021/08/12 වන දින කොමසාරිස්තුමාගේ අනුමැතියට යැවූ බවත්, මෙසේ සිදු කර තිබෙනුයේ ඉඩමක් කට්ටි කිරීමේ ගැසට් පත්‍රයට අනුව සිදු විය යුතු ක්‍රියාවලිය බවත් ප්‍රකාශ කරන ලදී.කොමසාරිස්තුමා විසින් 2021/09/02 වන දින අනුමැතිය එවූ බවත්,2021/11/03 වන දිනයේදී මෙම ඉඩම කට්ටි කර විකුණන පුද්ගලයාට කොන්දේසි 19ක් සහිත කොන්දේසි ලිපිය යැවූ බවත් එම කොන්දේසිද සභාවට ඉදිරිපත් කරමින් ලේකම්මහතා පවසා සිටින ලදී.එහි පාරවල්,බෝක්කු, කානු විදුලිය ලබා ගැනීම ආදී සියළු කාරණා ඇතුළත් වූ බවත්, ඔහු ඒවා සියල්ල සකස් කර අපට දැනුම්දිය යුතු බවත්, නමුත් දැනුම් දීමක් සිදු නොකර 2022 වන විට ඉඩම කොටස් විකුණා ඇති බවත් ඉන් පසුව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා මේ පිළිබඳ සභාවේ කතා කල බවත් ප්‍රකාශ කරන ලදී.

පළමු ඉඩම් කොටස සමඟ ගිවිසුම් ගත වී තිබෙන්නේ කවදාදැයි යන්න ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

එය අපට අදාල නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධයෙන් තමන් දැනගත් වහාම මෙම පුද්ගලයාට තමන් 2022/03/02 දින ලිපියක් මඟින් දැනුම් දුන් බවත්,එහි පිටපත පලාත් පාලන කොමසාරිස්තුමාටද යැවූ බවත්,මින් පෙර මුළු ඉඩමම සභාවද නොදැනුවත්ව විකුණූ අවස්ථා ඕනෑ තරම් තිබෙන බවත්, මේ වන විට ආදායම් පරීක්ෂකවරුන් ඒවා වාර්තා කරන බවත්,දිගින් දිගටම මෙම පුද්ගලයා මේ සම්බන්ධයෙන් කටයුතු නොකරන බැවින් අපට ලැබිය යුතු 10% ප්‍රමාණය අනුව පර්චස් 42.08ක් ලැබිය යුතු බවත්,නැවතත් තාක්ෂණ නිලධාරීන් මඟින් සොයා බලන ලෙසටද එම නිළධාරීන්ටද ලිපියක් මඟින් දැනුම්දුන් බවත් ලේකම්මහතා ප්‍රකාශ කරන

ලදී.මොහු දිගින් දිගටම හොරෙන් කැබලි විකිණීමට පටන් ගත් බැවින් කොමසාරිස්තුමාට ලියා මෙම ඉඩමේ බල පත්‍රය තහනම් කල බවත්,ඉන්පසුව ආදායම් පරික්ෂකවරුන් එය අනවසරයෙන් කඩන ඉඩමක් ලෙස දැන්වීම දැමූ පසුව ඔහු කොමසාරිස්තුමා හමුවීමට ගිය බවත් ,එවිට විමර්ශන කර එවූ ලිපිය ගියවර සභාගත කල බවත් එබැවින් ඉතිරි පර්චස් ප්‍රමාණයට මෙම ඉඩමට පමණක් බලපැවැත්වෙන සේ සභාවටද දැනුවත් කර තක්සේරු මුදල ලබා ගන්නාලෙස දැනුම් දී තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම ඉඩම් කැබැල්ලට යාබද ඉඩම් කැබැල්ලක් නොමැතිදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

සියළුම ඉඩම් විකුණා ඇති බවත්,මෙයද අතහැරියහොත් මෙම මුදලද නොලැබී යන බව ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

1% බද්ද ගෙවා තිබේදැයි ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා විමසා සිටින ලදී.

ඒ සියල්ලම ගණනය කර ලබා ගන්නා බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මොහු වරදක් කර තිබෙන බවත්,මොහුට විරුද්ධව නඩු නොදමන්නේ මන්දැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

මෙතුමාගේ ප්‍රශ්නය හොඳ බවත්,නීති වියදම්, අපට ලැබෙන ප්‍රමාණය හා කාලය අනුව එය බැලිය යුතු බවත්,1% ලබාගෙන තිබේ දැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

අනුමැතිය තවමත් ලබානොදී ඇති බැවින් 1% බදු මුදලක් ලබා ගැනීමට නොහැකි බව ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

වරදකරු මොහු බව පෙනීයන බවත්,එබැවින් අපට වැය වන මුදල නැවත අයකර ගැනීමට හැකි වන බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම මුදලින් ලක්ෂ 21ක් පමණ සභාවට ලැබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම පුද්ගලයාව බේරා ගන්නට උත්සාහකරනුයේ විශේෂ කෙනෙකුදැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

ඔහුව black list කරාදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

ඔහුගේ බලපත්‍රය තහනම් කර තිබෙන බව ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ක්‍රියාපටිපාටිය ලේකම්මහතා පැහැදිලි කල බවත්,එම පුද්ගලයාගේ ඉඩම් කට්ටි කිරීමට තිබෙන බලපත්‍රය අවලංගු කර තිබෙන බව ලේකම්මහතා පැවසූ බවත්, දැන් තිබෙනුයේ කට්ටි සැලසුම් අනුමත කිරීම හා 1% අයකර ගැනීම බවත් එවිට සභාවට ලැබිය යුතු ඉඩම් ප්‍රමාණය වෙන්කර දි තිබේදැයි සලකා බැලිය යුතු බවත් එය වෙන් කර දී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. එම පුද්ගලයා අපගේ අනුමැතියෙන් තොරව ඉඩම් ඉඩම් විකිණීම සම්බන්ධයෙන් ඔහු වගබලා ගත යුතු බවත්,එය අපගේ ගැටළුවක් නොවන බවත්, සභාවට ලැබිය යුතු ඉඩම් කොටස ලබා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.ඉඩම් කට්ටිකරු එම ඉඩම් ගැනුම්කරුවන් සමඟ එය විසඳා ගනීවියැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී. වැරැද්දක් කර ලේකම්තුමා ගත් නීතිමය කියාමාර්ගය තුළ කොමසාරිස්තුමාව හමු වී කොමසාරිස්තුමා මෙයට පමණක් තීරණයක් ගන්නා ලෙස පවසන බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව නීතිය ක්‍රියාත්මකවීම සාධාරණව සියළුම පුද්ගලයින්ට එක සේ සිදුවිය යුතුයැයිද ප්‍රකාශ කරන ලදී. ඉඩමක් කැඩීමේදී ඉඩම් කැබැල්ලක් ගැනීමට මිනිසුන් යන බවත් ගොස් අත්තිකාරම් මුදල් ලබා දී වෙන් කර ගන්නා බවත් එම ගැටළුව ඔවුන් දෙපාර්ශවය විසඳා ගනිවියැයිද ප්‍රකාශ කරන ලදී.තම පිළිතුර නම් අනෙක් ලැබිය යුතු කොටසද එම ඉඩමෙන්ම ලබා ගන්නා ලෙස බවත්, එමෙන්ම සභාවට ගතහැකි සෑම නීතිමය පියවරයක්ම මෙම පුද්ගලයා වෙනුවෙන්ද ගන්නා ලෙසත්,එලෙසම සැලැස්ම අනුමත නොකර යම් කිසි පුද්ගලයෙකු ඉඩම් කැබලි කර විකුණා තිබේනම් ඒ අයටද නීතිමය පියවර ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.තමන් අසලට ඔප්පු ලිවීමට පැමිණි විට පිඹුරුපත අනුමත වි නොමැති බව පවසා යැවූ විට නැවත ඔප්පු ලැබීමද වලකා

අනීතික ලෙස පුද්ගලයින් කටයුතු කරන බවත්,නීතියෙන් මේ සියළු දෙනාටම කටයුතු කරන ලෙසත්,දඩයක්ද සමඟ මින් පෙර ඉඩම් කඩා ඇති අයගෙන් අයකර ගැනීමටද කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

සොයා බැලීමේදී යම් පුද්ගලයින් මිය පරලොව ගොස් ඇති බවත්, යම් අය විදේශගත වී සොයාගත නොහැකි වී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.බැංකුවෙන් ණය ගැනීමට අවශ්‍ය පුද්ගලයා කිසිවක් නොදැන අදාල වැඩකටයුතු සඳහා පැමිණෙන බවත්, ඒවා පරිපාලනයේ තිබෙන ප්‍රශ්න බවත්,එක් අයෙකු විකුණා තවත් අය මිලදී ගෙන එම මිලදීගත් පුද්ගලයාද නැවත විකුණා එලෙස ගැටළු අප වෙත එන බවත් ප්‍රකාශ කරන ලදී.සමහර විට මධ්‍යස්ථ වී අදාල කොටසට 1% අරගෙන නීතියේ රාමුවෙන් පිට පලාත් පාලන කොමසාරිස්තුමාට අදාල නිලධාරීන්ට කරුණු කාරණා පවසා මිනිසුන් වෙනුවෙන් වැඩ කටයුතු කරන බවත් දුප්පත් මිනිසුන් මෙම ඉඩම් මිලදී ගන්නා බවත් සානුකම්පිතව බලා මෙම කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා මෙම කාරණය සම්බන්ධව පළමුව තමන් සභාවට ඉදිරිපත් කල බවත්,එම පුද්ගලයා ඔප්පුවක් ලිවීමට තමා අසලට පැමිණි බවත්, මෙම ක්‍රියා පටිපාටිය තමන් නොදැන සිටි බවත්, එම පුද්ගලයාගේ පිඹුරු පත අනුමත කරන්නේ කවදාද යන්න එම වැඩ පිළිවෙල ද දැන ගැනීමට අවශ්‍ය වී තිබූ නිසාත් එය සභාවට ඉදිරිපත් කල බවත්,ලේකම්මහතාගෙන් විමසීම් කල බවත්, ඉන්පසුව මේ පිළිබඳව උනන්දු වූ බවත් ප්‍රකාශ කරන ලදී. මුල් අවස්ථාවේදීම පලාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉඩමේ අනුමැතිය ගැනීමට යවන අවස්ථාවේදී අප ප්‍රාදේශීය සභාවට වෙන්වන 10% ප්‍රමාණය හඳුනා ගන්නේ නැතිදැයිද විමසා සිටින ලදී. එම අවස්ථාවේදී එය හඳුනා ගැනීමට තිබුනේ නම් ඉතිරි ඉඩම් පිළිබඳ ප්‍රශ්නය නොපැමිණෙන බවත්, තම කොට්ඨාසයේ තවත් ඉඩමක් කොටස් කරන බවත්, එහි තොරතුරු තමාට නොලැබුණ බවත් ලේකම්මහතාගෙන් ඒ පිළිබඳ විමසීමේදී එය ඉදිරිපත් වී නොමැති බවට පැවසූ බවත්, මෙහිදී ආදායම් පරීක්ෂක මහතුන් කුමක් කරන්නේද යන්න ගැටළුවක් බවත් තමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන තෙක් ආදායම් පරීක්ෂකවරුන් නිහඬදැයිද, ඉඩමක් කොටස් වන විට ආදායම් පරීක්ෂකවරුන්ගේ යම් දැනුමක් තිබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. සැලසුම් කමිටුවේ යම් යම් සේ සිදු වන බවත්, එහි සිදු වන දේ මහා සභාවක් ලෙස අපට සෙවීමට නොහැකි බවත්,ඒවා කර්මාන්ත කමිටුවට වාර්තා වන්නේදැයිද නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී. සරලව ඒවා වාර්තා වූයේනම් හොඳ බවත්, මෙම ප්‍රශ්නගත ඉඩමේ ඉඩම් කොටස් විවිධ පුද්ගලයින් මිලදී ගෙන තිබෙන බවත්,මෙම ඉඩමට අනුමැතියක් නොමැතිකම ඔවුන්ට ගැටළුවක් වී ඇති බවත්, අසංක ජයසිංහ නමැත්තා වරදක් කර තිබෙන බවත් එය කුමන කාරණාවක් නිසා සිදු වූයේදැයි නොදන්නා බවත්,කොන්දේසි ලිපිය භාරදුන් පසුව ඔහුද ඒ පිළිබඳව අවබෝධයක් ගත යුතු බවත්,මෙය ඔහුගේ පළමු ඉඩම් කොටස් කිරීමද නොවන බවත් ප්‍රකාශ කරන ලදී.වරද කොතැනද නොදන්නා නමුත් එමඟින් පීඩාවට පත්වනුයේ ඉඩම් මිල දී ගත් උදවිය බවත් ප්‍රකාශ කරන ලදී.මෙවැනි කාරණා මින් පසුව සිදු නොවිය යුතු බවත් ඉඩමක් කොටස් කිරීමේදී ඇලවල් සඳහාද වෙන් කල යුතු කොටසක් තිබෙන බවත්, ඇලවල් පවිත්‍රකිරීමට යාමේදී එම ගැටළුවට මුහුණ දීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.තම කොට්ඨාසයේ කොටස් කරන අනෙක් ඉඩමේ ඇළක් සම්බන්ධයෙන්ද ලේකම්මහතාට ලිපියක් ගෙනැවිත් දුන් බවත්, ඒ සම්බන්ධයෙන්ද කටයුතු කර ඇතැයි සිතනා බවත් ප්‍රකාශ කරන ලදී.මේ සිද්ධිය සම්බන්ධයෙන් අසංක ජයසිංහ නමැත්තාගෙන් සභාවට නොලැබෙන ඉඩම් ප්‍රමාණයට මුදල් අයකර දෙන ලෙසට පලාත් පාලන කොමසාරිස්තුමා පවසා ඇති බවත්, එය අප හිස උඩ තබා තිබුණද අප ප්‍රදේශයේ උදවිය අපහසුතාවයට පත්වේනම් එමෙන්ම ඉදිරියේදී නඩු වලට යාමට යම් යම් කටයුතු කිරීමට සිදු වේවියැයිද නමුත් මෙම පුද්ගලයා තවමත් අප යටතට පැමිණ ඇති බැවින් ඒ තුළ මෙ වරද ඉදිරියට නොවීමට වගබලා ගනිමින්ද, මේ සඳහා අවසරයක් ලබා දීම නුසුදුසු නොවන බව පවසන බවත් ප්‍රකාශ කරන ලදී.

ඉදිරියේදී පළමු කොන්දේසිය ලෙස 10% කොටස, පලාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යවන අවස්ථාවේදීම කැබලි කරන පුද්ගලයාට අවබෝධයක් ලබාදෙන ලෙසත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. දැනට වසර 02කට පමණ පෙර සරත් තිසේරා නම් සෙමුතු ව්‍යාපාරයේ අධිපතිතුමාට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවෙන් නඩුවක් වැටුන බවත්,එම පුද්ගලයා අපේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සුගත් තිසේරා මහතාට ඉඩමක් විකුණා තිබූ බවත්, එම සුගත් තිසේරා මහතා එය කැබලි විකුණා තිබූ බවත්,නමුත් එය අයිතිකරුගේ නමින් විකුනූ බවත් එහිදී

නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව මඟින් එම කැබලි කිරීම සම්බන්ධයෙන් ලැබිය යුතු මුදල්,ලැබිය යුතු ඉඩම් කොටස් නොලැබුණු බවට නඩුවක් දැමූ බවත්, එවිට ඉඩම් අයිතිකරුට නඩුව වැටුන බැවින් අදාල පුද්ගලයා ගෙවීම්,දඩ මුදල් සියල්ල ගෙවීම් කර නඩුව සමථයකට පත් කර ගත් බවත්, එලෙස අප සභවට කිරීමට බොහෝ දේ තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

අප සභාවේ උපසභාපතිවරයෙකුව සිටි කබ්රාල් මහතා මැටිකොටුව ප්‍රදේශයේ ඉඩමක් කොටස් කර විකුණා තිබූ බවත්, එම ඉඩමට අනුමැතිය ගැනීමට යාමේදී එම මහතා මියපරලොව ගොස් තිබූ බවත්, එම අවස්ථාවේදී 1% කොටස ගෙන එම කටයුත්ත කල බවත්, එවැනි අවස්ථාවල නම්‍යශීලී වීමට සිදු වන බවත් පිටරටක සිටියද නඩුවක් දැමීමට හැකි බවත්, විදේශ ගමන් තහනමක්ද දැමීමට හැකි බවත්, ඉදිරියේදී එවැනි කටයුතු වලට යමුයැයිද ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. එවිට ඉඩම් කැබලි කරන පුද්ගලයින්ගෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අහිමි වී ගිය ආදායම් ප්‍රමාණයක් ලබා ගැනීමට හැකි වේයැයිද ප්‍රකාශ කරන ලදී. අප පවසන දේට ඇහුම්කම් දීමට සිටින මෙම තැනැත්තාට අවස්ථාවක් ලබා දෙමුයැයිද මෙම ඉඩමට අනුමැතිය ලබා දෙමුයැයිද යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය විකුණුම්කරු ඔප්පුවේදී විකුණුම්කරු විකිණීමට පසුවද එම දේපල සම්බන්ධව යම් ආරවුලක් පැමිණියහොත් එහිදී වග උත්තර කියා නිරවුල් කරදෙන හැටියටද එසේ නොපුළුවන් වී නම් වන්දි ගෙවන හැටියටද මම මාගේ උරුමක්කාර යන පිරිස සමඟ බැඳෙන බව තිබෙන බවත්,එම තැනැත්තා මිය ගොස් නම් අනෙක් පිරිස ඉන්න බවත් උනන්දුවක් තිබේනම් සභාවට ආදායම් වැඩ කරගැනීමට අවශ්‍ය නම් සිදු කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.

මේ සියළු කාරණා වලින් පෙනී යන්නේ සභාව පස සිට වැඩ කිරීම නොව මෙම පුද්ගලයාව ආරක්ෂා කරන බවයැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.මුදල් ගන්නේ නම් මොහුගෙන් මුදල් ගන්න නමුත් තමන් මේ සඳහා බෙදීමක් ඉල්ලා යෝජනා කරන බවත්,මේ සඳහා අපට හසු වීමට නොහැකි බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

පර්චස් 7.28ප්‍රමාණයක් අඩු වී තිබෙන බවත් ඉතිරි කොටස නිරවුල්ව ලබා ගැනීමට හැකිදැයි ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා විමසා සිටින ලදී.

එය ලබා ගැනීමට හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා විසඳුමක් ලබා ගත යුතු බවත්, ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවියගේ පැහැදිලි කිරීම හොඳ බවත්, නමුත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා පැවසූ දේද දංකොටුව උප කාර්යාලය තුළ සිටියදි අත්විඳ තිබෙන බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.මෙතැනදී අදාල පුද්ගලයි අප සතුව සිටින බවත්, විකල්පද කීපයක්ම පැවසූ බවත් අයිතිකරුට විකුණුම්කරුවන් සමඟ එකඟතාවයකට යන ලෙසට පැවසිය හැකි බවත්,මිල දී ගත් අනෙක් පිරිසටද සාධාරණය ඉටුවිය යුතු බවත්,ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පොල් පෙරේරා මහතාගේ කොට්ඨාසයේද ඉඩමක් කැඩෙන බව පැවසූ බවත්,එම ප්‍රදේශයේ ආදායම් පරීක්ෂකවරුන් මඟින්ද ඒ පිළිබඳව තොරතුරු ලබා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.

අනෙක් සභාවට තම ප්‍රදේශයේද තොරතුරු ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමට බලාපොරොත්තු වන බවත්,සභාපතිතුමාගේ පීඩනය තේරෙන බවත්,අනුමැතිය අවශ්‍ය බැවින් ඉඩම ගත් පුද්ගලයාගෙන් පර්චස් 7.28 කොටස නැවත මුදල් ලබාගෙන සභාවට ලබා දීමට කොටස්කරුට හැකියාව තිබෙන බවත්,පර්චස් 40 පමණ ගත් අයෙකුගෙන් ගැනිමට හැකි බවත් ඒ සඳහා උත්සාහයක් දරමුයැයිද ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.

බැංකු ණය ලබාගෙන ඉඩම ගත් පුද්ගලයින් සිටිය හැකි බවත් එහිදී ගැටළුවලට මුහුණ දීමට සිදු වන බැවින් එසෙ නොකරන බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

එසෙ වීමට නොහැකි බවත්, බැංකුණය ගෙන නොමැති බවත්, මේ සඳහා තොරතුරු කැඳවීමක් කරන ලෙසත්, එහිදී කොටස් කල කැබලි ගණන,ගැනුම්කරුවන්ගේ තොරතුරු,අත්තිකාරම් මුදල කොපමණද,

මුළු මුදල් ලබාගෙන ඇත්ද යන්න තොරතුරු ලබා ගන්නා ලෙසත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.

කට්ටි ඔක්කොම විකිණී අවසන් වී තිබේදැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.

මේ පිළිබඳව විශේෂ ලෙස කටයුතු කරමුයැයිද ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.

නම්‍යශීලි වුවද එම කණ්ඩායම් සියල්ල ගෙන්වන ලෙසත්,එහිදී සිදු වී ඇති සත්‍ය සොයා ගැනීමට හැකි බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ඉඩම් ගත් පිරිස තමන් නොදන්නා බවත්,තමන්ට හැල්ලුවට ල් වීමට නොහැකි බවත් මන්ද ඔවුන් කැඳවීමට තමාට බලයක් නොමැති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

බලය සම්බන්ධයෙන් සිතීමට අවශ්‍ය නොවන බවත් ,මෙය අනාගතයේ ආදායම් උත්පාදනය සහ ඉඩම් කැබලි කිරීමේ කටයුත්තට නරක පූර්වාදර්ශයක් බවට පත් වන බවත් එබැවින් මේ සඳහා නීත්‍යානුකූලව අපට පර්චස් 7.28 අවශ්‍ය බව දන්වා කොමසාරිස්තුමාට මහා සභාවේ අදහස හා මෙසේ ක්‍රියකිරීම සුදුසු නොවන බවත් සඳහන් කරමින් ලිපියක් යවමුයැයිද ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව කොමසාරිස්තුමාට පැහැදිලිවම ලිඛිතව දැන්වූ බවත්, මෙම ඉඩම අක්කර 2ක් කැඩීමට පැමිණි බවත්, ඒ සඳහා 10% හිමි නැති බවත්,එම නිසා කොමසාරිස්තුමාට 10% පිළිබඳව නොපවසා අනුමැතිය ඉල්ලූ බවත්, ඒත් සමඟම මෙම ඉඩම දෙකට කඩා මේ විකිනීමට යනුයේ එක් කැබැල්ලක් බව දැනගත් බවත්, ඉන් පසුව ඉතිරි කැබැල්ලද විකුණන බැවින් එවිට අක්කර 2 ½ වඩා වැඩි බැවින්ද වැඩ අධිකාරී මහතා සහයෝගයෙන්ද ඒ පිළිබඳවකොමසාරිස්තුමාට ලිපියක් යැවූ බවත්ප්‍රකාශ කරන ලදී.එත් සමඟම කොමසාරිස්තුමා මුළු පලාතටම චක්‍රලේඛයක් නිකුත් කල බවත් එවිට මෙම පුද්ගලයා කට්ටි කර අවසන් බවත් එබැවින් පර්චස් හතලිස් ගණනම අපට ලබා ගැනීමට ඉතිරි වී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

මේ සියළුම කාරණා සලකා බැලීමේදී නීතිය ක්‍රියාත්මක කල යුතු කාරණාවක් නීතියට ක්‍රියාත්මක නොකර වෙනත් මාර්ගයකින් ගොස් විසඳීමට යන බව පෙනී යන බවත්, එසේ සිදු කරනුයේ මන්දැයිද,උත්තරීතර සභාවක් බවට පවසන බවත්,නීතී තිබෙනවා යනුවෙන්ද පවසන බවත්, රීතිපොත් පෙන්වන බවත්,දැන් නීතියට කටයුතු නොකරන්නේ ඇයිදැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

කොමසාරිස්තුමාගේ ලිපියේ 4වන ඡේදය පැහැදිලි කරමින් ලේකම් මහතා මේ පිළිබඳව තොරතුරු පැහැදිලි කරන ලදී.

වෙනත් කඩපු ඉඩම් වල මිනිසුන්ද පීඩාවට පත් වන බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

එවැනි මිනිසුන් පැමිණ පෞද්ගලිකව 1% බදු මුදල ගෙවා කටයුතු කරන බව ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

අපට එම point එකට යැමට නොහැකිදැයි ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා විමසා සිටනි ලදී.

හැකි බවත්,අවශ්‍ය නම් මෙය නොදී සිටීමට හැකි බවත්,නමුත් ඊළඟ සභාවකින් එය ලබා දිය හැකි බවත් ඉතාමත් අමාරුවෙන් මෙම පුද්ගලයාව නීති රාමුවට ගෙනා බවත්,සභාවට ලක්ෂ 20ක් පමණ අයකර ගැනීමට මෙහිදී කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා නඩු දමන ලෙසත්,නඩු නොදමන්නේ මන්දැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

තමන් මෙම ඉඩමේ ඉතිරි ඉඩම් කැබැල්ලද ගතයුතුයැයි මතයේ තවමත් සිටින බවත්,මෙ කාරණාව සම්බන්ධයෙන් නීතියක් සකසා ගන්නා ලෙස කොමසාරිස්තුමා පවසන බවත්,තවත් කෙනෙකු ඒදේම කර රටේ තිබෙන නීතිය එම පුද්ගලයාට ක්‍රියාත්මක කල විට එම පුද්ගලයාට FR එකක් සභාවට දමා වෙනම ඔහුට සැලකුවායි පැවසුවහොත් එවිට අපට ක්ෂේත්‍රාධිකරණයට යාමට සිදුවේයැයිද පවසමින් තමන් නැවතත් අදහස් ප්‍රකාශ නොකරන බවත් ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය ප්‍රකාශ කරන ලදී.

අදාල පර්චස් 7.28 කොටස මෙම ඉඩමේ කොහෙන් හෝ ලබා ගනිමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම කටයුත්ත නිවැරදි කරගැනීමට අවශ්‍ය කාටදැයි ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා විමසා සිටින ලදී.

ඇත්තෙන්ම කට්ටිකල පුද්ගලයාටද මෙය නිරවුල් කර ගැනිමට අවශ්‍ය බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම පුද්ගලයාට එන ලෙසට පවසන ලෙසත්,වීථි රේඛා නැතිව ණය ගැනීමට නොහැකි බැවින් ගැණුම්කරුවන් ණය ගෙන නොමැතියැයිද, සාකච්චා කොට එම පුද්ගලයාටද මෙම ප්‍රශ්නය විසඳා ගැනීමට එන ලෙස පැවසූ විට ඔහු පිරිස කැඳවාගෙන ඒවියැයිද එවිට අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය බිම් කොටස ලබාදෙන ලෙසට පවසමුයැයිද ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී. කෝටි ගණන වලට ඉඩම් ගන්නා බවත්, ඉඩමක් කැඩීමට වසරක් පමණ කාලය ගත වූ විට එය විකුණාද වැඩක් නොමැති බවත්,කුරුණෑගල කාලය ගත වන බවත් ප්‍රකාශ කරන ලදී. කාගේ අතිනුත් වැරදි සිදු වෙන බවත්,කවුරුත් ව්‍යාපාර කරණුයේ අපහසුවෙන් බවත් තමන් මෙම පුද්ගලයාව නොහඳුනන බවත් නමුත් අවස්ථාවක් ලබා දීමට හැකි අවස්ථාවේදී අවස්ථාවක් ලබාදෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

මෙම පුටුවල හිඳින විට අමාරුවෙන් වැඩ කටයුතු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා නීතිය ක්‍රියාත්මක කර ලෙස ගරු මන්ත්‍රී ටී.බී.ඩී,ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

නොදැන ඉඩම් කඩන බව ගරු මන්ත්‍රීවරුන්ද පවසන බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

කොට්ඨාස මන්ත්‍රීවරුන්ට ඒවා පිළිබඳ තොරතුරු ලබාදිය හැකි බව ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම පර්චස් 7.28 කොටස අදාල ඉඩම් කොටසින්ම ගෙන මෙය අවසන් කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අදාල අලෙවිකරුව ගෙන්වා,පරිපාලන තත්ත්වයද පැහැදිලි කර,අපට තිබෙන අපහසුතාවයද පැහැදිලි කර දෙන ලෙසත්,මුදල් වලින් විසඳීමට නොහැකි බවත් මේ පිළිබඳව ලිඛිතව ගන්නා ලෙසත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම පර්චස් 7.28 කොටස වෙනත් තැනකින් අරගෙන වැඩක් නොමැති බවත්,එබැවින් මුදල් ගෙන මෙම කටයුතු කිරීමට යාමේදී එයට විරුද්ධ වන බවත්,මෙහිදී කිරීමට තිබෙනුයේ වෙනත් ස්ථානයකින් අදාල කොටස ලබා ගැනීම බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නොව මෙම කොටස ගන්නා ලෙසත්,මෙය අපගේ අයිතිය බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා එතුමාගේ කොට්ඨාසයේ කැඩෙන ඉඩමින් මෙය ලබා ගන්නා ලෙසට පවසන බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එසේ සිදු කල නොහැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අදාල කට්ටිකරන ඉඩමේ ජනයාගේ පොදු යහපත උදෙසා ඉඩම් කොටස ලබා ගන්නා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මෙතැන ප්‍රායෝගික ගැටළුවක් තිබෙන බැවින් මෙය පැවසූ බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එම පුද්ගලයාව මෙතැනට ගෙන සාකච්ඡා කර අදාල කොටස ගෙන සභාවට භාර කල විට මෙම ගැටළුව අවසන් වන බවත්,පර්චස්.2 ½ බැගින් කැලී තුනකින් හෝ ලබා ගන්නා ලෙස ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ඉඩම් කට්ටි කරන පුද්ගලයාගේ බලපත්‍රය අවලංගු කර තිබෙන බව පැවසූ බවත් එසේ නම් ගෝනවිල ඉඩම් කඩන්නේ කෙසේදැයි ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා විමසා සිටින ලදී.